# 2018/12/11 දින පැවති මහාසභා රැස්වීම් වාර්තාව

2018/12/11 දින පෙ.ව. 9.00 ට නාගොඩ ප්‍රදේශීය සභා රැස්වීම් ශාලාවේදී රැස්වීම පවත්වන ලදී.

**සහභාගීත්වය**

| | | |
|---|---|---|
| 1. | නිමල් වික්ටර් නාගොඩවිතාන මහතා | ගරු සභාපති |
| 2. | එම්.කේ. ගාමිණී සුසන්ත මහතා | ගරු උප සභාපති |
| 3. | ඩබ්. ජී. නිශාන්ත මහතා | ගරු මන්ත්‍රී |
| 4. | සී.වී. සහබන්දු මහතා | ගරු මන්ත්‍රී |
| 5. | බන්දුල සමන්ත හිරිමුතුගොඩ මහතා | ගරු මන්ත්‍රී |
| 6. | එච්.ජී. තරංග සුදර්ශන මහතා | ගරු මන්ත්‍රී |
| 7. | කුමාරගේ වසන්ත මහතා | ගරු මන්ත්‍රී |
| 8. | එච්.කේ.ලක්රුවන් සම්පත් මහතා | ගරු මන්ත්‍රී |
| 9. | එන්.ජී. ගයාන් මධුසංඛ මහතා | ගරු මන්ත්‍රී |
| 10. | ධර්මසිරි ගනේවත්ත මහතා | ගරු මන්ත්‍රී |
| 11. | පියල් හිරිමුතුගොඩ මහතා | ගරු මන්ත්‍රී |
| 12. | සුභාෂි මධුමාලි ඒකනායක මෙනවිය | ගරු මන්ත්‍රිනී |
| 13. | එඬේරආරච්චි වෙරංග ලක්මාල් මහතා | ගරු මන්ත්‍රී |
| 14. | නාපෙ විතානගේ සමන් මහතා | ගරු මන්ත්‍රී |
| 15. | සී. වනිගරත්න මහතා | ගරු මන්ත්‍රී |
| 16. | විලේගේ අමර ධනංජය මහතා | ගරු මන්ත්‍රී |
| 17. | ප්‍රියන්තා ගුණසේකර මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 18. | එම්.එම්.දිසානායක මහතා | ගරු මන්ත්‍රී |
| 19. | එන්.ඩබ්. පතිනායක මහතා | ගරු මන්ත්‍රී |
| 20. | විජිත් වීරගුණරත්න සහබන්දු මහතා | ගරු මන්ත්‍රී |
| 21. | කේ.කේ.අයි.නෙරංජලී මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 22. | කේ.ඒ.සී. දිල්රුක්ෂි මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 23. | එච්.එච්. ගයන්ති කුමාරි මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 24. | ඩබ්. කේ. නෙලී මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 25. | වී.ජී.අරුණ ශාන්ති මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 26. | පී.ජී. රංජිත් ජයවීර මහතා | ගරු මන්ත්‍රී |

**01. ආගම සිහි කිරීම**

2018.12.11 දින මහා සභාව ආරම්භ කිරීමට පළමුව පැමිණ සිටි සියලු දෙනා තම තමන්ගේ ආගම සිහි කරීමෙන් අනතුරුව මිය ගිය ඥාතීන් රණවිරුවන් සිහිපත් කර විනාඩි 01 ක නිශ්ශබ්දතාවයක් පළ කළේය.

**02. මූලාසනයේ පිළිගැනීමේ කතාව**

සුභ උදෑසනක් වේවා සියලුම දෙනාට. උප සභාපතිතුමා ඇතුළු පැමිණ සිටින සියලුම මන්ත්‍රීතුමන්ලා මන්ත්‍රීතුමියන්ලා ඉතා ගෞරවයෙන් පිළිගනිමින් 2018 දෙසැම්බර් මාසයට අදාල සැසි වාරය ආරම්භ කිරීමට බලාපොරොත්තු වෙනවා.

**03. පසුගිය වාර්තාවේ යෝජනා සඳහා ඉදිරිපත් කර ඇති සංශෝධන ඉදිරිපත් කිරීම**

- "පසුගිය සභා වාර්තාවේ 12 වන පිටුවේ ඉදිරි ගෙවීම් වාර්තාවේ අංක 34 බිල්පත යටතේ ඇති ගෙවීම සම්බන්ධව මම අදහස් ප්‍රකාශ කල බව වාර්තාවේ සඳහන් වන නමුත් 34 බිල්පත යටතේ ඇති ගෙවීම යටලමත්තේ ගෙවීමක් වන බැවිනුත්, මම අදහස් ප්‍රකාශ කරන ලද්දේ උඩුගම උප ක්‍රීඩාංගණය සංවර්ධනය කිරීමේ ගෙවීම් සම්බන්ධව බැවින් එය නිවැරදි විය යුත් බව පෙන්වා දෙමි. "යනුවෙන් ගරු මන්ත්‍රී තරංග සුදර්ශන මහතා ප්‍රකාශ කරන ලදී. එය වාර්තාවේ අංක 34 බිල්පත ලෙස සටහන් වී ඇත්තේ ප්‍රමාද දෝශයකිනි. එය අංක 36 බිල්පත ලෙස නිවැරදි විය යුතුය.

- උඩවැලිවිටිතලාව හොරංගල්ල මාර්ගයේ ඇස්තමේන්තුව වෙනස් කර උඩවැලිවිටිතලාව ගල්ලෙන මුල්ල මාර්ගය සඳහා ඉදිරිපත් කලද, එම ඇස්තමේන්තුව සභා වාර්තාවේ සටහන් වී නොමැති බවට ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් පෙන්වා දෙන ලදී.

**04. 2018.11.13 දින පැවති මහ සභා වාර්තාවේ නිවැරදි කිරීම් ඇත්නම් ඒවා නිවැරදි කර වාර්තාව ස්ථිර කිරීම.**

පෙන්වා දෙන ලද සංශෝධනයට යටත්ව සභා වාර්තාව සභාව පිළිගතයුතු සත්‍ය වාර්තාවක් ලෙස ගරු මන්ත්‍රී වෙරංග ලක්මාල් මහතා විසින් යෝජනා කළ අතර ගරු මන්ත්‍රීනී ප්‍රියන්තා ගුණසේකර මහත්මිය විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.

**05. විශේෂ නිවේදන**

නැත.

**06. සන්දේශ පෙත්සම් පැමිණිලි ඉදිරිපත් කිරීම**

01. නාගොඩ ප්‍රාදේශීය රෝහලේ මාතෘ වාට්ටුව වැසී යාම සම්බන්ධව නාගොඩ, යටලමත්ත, හොරගහකන්ද ගම්වාසීන් විසින් යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදි.

02. ගම්මැද්දේගොඩ මාර්ගය ශ්‍රී පඤ්ඤාලෝක මාවත ලෙස නම් කිරීම සම්බන්ධව සමගි සුභ සාධක සමිතිය , ගම්මැද්දේගොඩ විසින් යොමු කරන ලද 2018.12.07 දිනැති ලිපිය සභාගත කරන ලදි.

03. බෝක්කුවක් ඉදිකිරීම සම්බන්ධව දිස්ත්‍රික් වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලය, ගාල්ල විසින් යොමු කරන ලද 2018.11.19 දිනැති ලිපිය සභාගත කරන ලදි.

04. දකුණු පළාත් සභා සංවර්ධන සැළැස්ම - 2018 මන්ත්‍රී ප්‍රතිපාදන සම්බන්ධ පළාත් පාලන දෙපාර්තමේන්තුව, දකුණු පළාත විසින් යොමු කරන ලද 2018.11.15 දිනැති ලිපිය සභාගත කරන ලදි.

05. දකුණු පළාත් සභා සංවර්ධන සැළැස්ම - 2018 මන්ත්‍රී ප්‍රතිපාදන සම්බන්ධ සැළසුම් ලේකම් කාර්යාලය, දකුණු පළාත විසින් යොමු කරන ලද 2018.11.09 දිනැති ලිපිය සභාගත කරන ලදි.

06. මිදැල්ල , ගල්කැටියගොඩ පාරේ ජී. පී. ධනපාල මහතාගේ නිවස ඇතුලත් පාර සකස් කිරීම සම්බන්ධව ගරු දකුණු පළාත් සභා මන්ත්‍රී සම්පත් අතුකෝරල මහතා විසින් යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදි.

07. 2018 වර්ෂයේ සංවර්ධන වැඩපිළිවෙල යටතේ කොට්ඨාශයේ ක්‍රියාත්මක කිරීමට අනුමත මාර්ග සංවර්ධන ව්‍යාපෘති සම්බන්ධව ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය, නාගොඩ විසින් යොමු කරන ලද 2018.12.04 දිනැති ලිපිය සභාගත කරන ලදි.

08. දකුණු පළාත් සභා සංවර්ධන සැළැස්ම - 2018 මන්ත්‍රී ප්‍රතිපාදන සම්බන්ධ පළාත් පාලන දෙපාර්තමේන්තුව, දකුණු පළාත විසින් යොමු කරන ලද 2018.12.04 දිනැති ලිපිය සභාගත කරන ලදි.

09. පළාත් පාලන ආයතන සතු අරමුදල් යොදාගෙන සිදු කරනු ලබන සංවර්ධන කටයුතු - 2018 සම්බන්ධව පළාත් පාලන දෙපාර්තමේන්තුව, දකුණු පළාත විසින් යොමු කරන ලද 2018.11.30 දිනැති ලිපිය සභාගත කරන ලදි.

10. විධිමත් යෝජනා අනුමැතියක් ලබා ගැනීම සම්බන්ධව ආර්.ඒ.ඒ.එල් රත්නායක මිය, සංවර්ධන නිලධාරී (පරිසර) විසින් යොමු කරන ලද 2018.12.10 දිනැති ලිපිය සභාගත කරන ලදි.

උඩුගම සති පොළ සංවර්ධනය කිරීමේ යෝජනාව විධිමත් සභාසම්මුතියක් කර ගත යුතු බවත්, පොදුවේ සියළු දෙනා කැමති බව ප්‍රකාශ කර ඒකමතිකව සම්මත කිරීම නිවැරදි ක්‍රමවේදය නොවන බවත්, වෙන වෙනම යෝජනා ස්ථිර කර සම්මත කිරීමක් කරගත යුතු බවත් දන්වන ලදී.

**07. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න**

**නැත.**

**08.** **යථා පරිදි කල් දී ඇති යෝජනා**

**8.1 ගරු සභාපති නිමල් වික්ටර් නාගොඩවිතාන මහතා ඉදිරිපත් කරන පරිපාලන යෝජනා**

I. නාගොඩ ප්‍රාදේශීය සභාව විසින් සභාව විසින් යොමු කරන ලිපි වෙනුවෙන් ගෙවිය යුතු තැපැල් ගාස්තු සඳහා මුදල් මේ වන විට අවසන් වෙමින් පවතින බැවින් ඉදිරි මාසය සඳහා මුදල් ශේෂය ඉහළ නැංවීමට යෝජනා කරමි.
**ගරු සභාපතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු උප සභාපතිතුමා විසින් ස්ථිර කරන ලදී.**

II. තල්ගස්වල නගරය දියුණු වෙමින් පවතින නගරයක් බැවිනුත් ජනාකීර්ණ නගරයක් බවට පත් වී ඇති බැවිනුත් ප්‍රාදේශීය සභාවේ ආදායම වැඩි කර ගැනීමේ අරමුණින් නගරයේ වෙළඳ සංකීර්ණයක් ඉදි කිරීමට යෝජනා කරමි.
**ගරු සභාපතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා විසින් ස්ථිර කරන ලදී.**

III. දකුණු පළාත් සභාවේ ලබා ගන්නා ලද තීරණයකට අනුව ඉරිදා දිනයේ දහම් පාසල් පැවැත්වෙන වේලාව තුළ දරුවන් වෙනුවෙන් අමතර පන්ති පැවැත්වීම තහනම් කිරීම සඳහා යෝජනා කරමි.
**ගරු සභාපතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී සමන් නාපෙවිතානගේ මහතා විසින් ස්ථිර කරන ලදී.**

IV. නාගොඩ ප්‍රාදේශීය සභාව මගින් පාලනය වන කැකුළු පෙර පාසල දැනට පවත්වා ගෙන යනු ලබන්නේ පෞද්ගලික ස්ථානයක වන අතර ඒ සඳහා රු. 4000.00 ක මුදලක් දරුවන්ගෙන් එකතු කර ගෙවනු ලැබේ. එම මුදල දරුවන්ට වැය බරක් වන බැවින් 2019 ජනවාරි මස සිට සභා අරමුදලින් එම මුදල ගෙවීමට යෝජනා කරමි.
**ගරු සභාපතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා විසින් ස්ථිර කරන ලදී.**

V. දකුණු පළාත් සභා ගරු මන්ත්‍රී සම්පත් අතුකෝරල මැතිතුමාගේ ප්‍රතිපාදන මගින් තල්ගස්වල කටඹුරාව මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා යෝජනා කරමි.
**ගරු සභාපතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී එන්. ඩබ්. පතිනායක මහතා විසින් ස්ථිර කරන ලදී.**

VI. රියදුරු අනුර දිසානායක මයාගේ ඉල්ලීම පරිදි උඩුගම උප කාර්යාලයේ තිබෙන වාහන සේදීම සඳහා ෆෙෂර් ගන් එකක් , අඩි 50 හෝස් එකක් හා අඩි 50 වයර් කෝඩ් එකක් මිළදී ගැනීමට යෝජනා කරමි.
**ගරු සභාපතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී විජිත් සහබන්දු මහතා විසින් ස්ථිර කරන ලදී.**

VII. සෞඛ්‍ය කම්කරු, එම්. ඩබ්. හර්ෂ කුමාර මයා රාජ්‍ය සේවා ක්‍රිකට් කණ්ඩායමට තෝරා පත් කර ගෙන ඇති බැවින් ඔහුට අවශ්‍ය ක්‍රීඩා උපකරණ කට්ටලයක් ලබා දීමට යෝජනා කරමි.
**ගරු සභාපතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු උප සභාපතිතුමා විසින් ස්ථිර කරන ලදී.**

VIII. ප්‍රාදේශීය සභාවේ සිදු කරමින් පවතින ඉදිකිරීම් කටයුතු වෙනුවෙන් ආසිරි ජොෂ්ය පුරවැසි සමිතිය, කැප්පිටියාගොඩ දකුණ වෙත අත්තිකාරම් මුදලක් නිදහස් කිරීම සඳහා යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී ප්‍රියන්තා ගුණසේකර මහත්මිය විසින් ස්ථිර කරන ලදී.**

IX. ප්‍රාදේශීය සභාව සතු ජේ.සී.බී. යන්ත්‍රය වර්තමානයේ පවතින තත්වය මත වෙන්දේසි කිරීමට හෝ අළුත්වැඩියා කිරීම සම්බන්ධව තීරණ ලබා ගැනීම සඳහා ඒ පිළිබඳ විශේෂඥ දැණුම ඇති මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ නිලධාරීන් දෙදෙනෙක් පළාත් පාලන දෙපාර්තමේන්තුවේ යාන්ත්‍රික ඉංජිනේරු යන අයගෙන සමන්විත කමිටුවක් පත් කිරීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු උප සභාපතිතුමා විසින් ස්ථිර කරන ලදී.**

X. මහා සභා රැස්වීම හා අනිකුත් රැස්වීම් අවස්ථාවලදී නීත්‍යානුකූලව සම්බන්ධ විය යුතු නිලධාරීන් හට වාර්තා තබා ගැනීමට හා ඒ කටයුතු කර ගෙන යාම සඳහා පහසු මේස දෙකක් ලබාදීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී ධර්මසිරි ගනේවත්ත මහතා විසින් ස්ථිර කරන ලදී.**

XI. නාගොඩ, මාපලගම, උඩුගම මහජන පුස්තකාලවල දැනට පවතින ගාස්තු පහත ආකාරයට සංශෝධනය කිරීමට යෝජනා කරමි.

- දැනට පවතින රු. 50.00 ක් වූ පුස්තකාල සාමාජික ගාස්තුව රු. 100.00 දක්වා වැඩි කිරීම
- දැනට පවතින රු. 25.00 ක් වූ සාමාජිකත්වය අලුත් කිරීමේ ගාස්තුව රු. 50.00 දක්වා වැඩි කිරීම
- පොත් නැවත පුස්තකාලයට භාර නොදී ප්‍රමාද වන එක් දිනක් වෙනුවෙන් ශත 50 ක ගාස්තුවක් අය කරන අතර එම පොත් ප්‍රමාද ගාස්තුව දිනකට රුපියල බැගින් පොත් 2 ක් සඳහා රු. 2.00 ක් ලෙස සංශෝධනය කිරීම
- ආයතනයේ කාර්ය මණ්ඩලය සඳහා කාඩ්පත් භාවිතා නොකරන බැවින් ඒ සඳහා විධිමත් ක්‍රමවේදයක් ඇති කිරීමට යෝජනා කරමි.

මේ පුස්තකාලවල ගාස්තු වැඩි කිරීම නුසුදුසු බවත්, දැනට තියෙන ප්‍රමානයෙන් පවත්වා ගැනීම සුදුසු බවත් ගරු මන්ත්‍රී තරංග සුදර්ශන මහතා හා ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා ප්‍රකාශ කරන ලදී.

XII. රියදුරු තනතුර සඳහා අනියම් පදනම මත දොරනවිල පාර, මුලනගොඩවත්ත, කැප්පිටියගොඩ පදිංචි කාරියවසම් හේවමානගේ කැළුම් චාමර මහතා බඳවා ගැනීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු උප සභාපතිතුමා විසින් ස්ථිර කරන ලදී.**

XIII. 2019 වර්ෂය සඳහා ප්‍රාදේශීය සභා අරමුදලේ ලැබීම් හා වියදම් සම්බන්ධයෙන් හා සභාවට අවශය උපදෙස් ලබාදීම සඳහාත් ඊට අදාළ කාර්ය කටයුතු පිළිබඳව මහා සභාවට ඉදිරිපත් කිරීම සඳහාත් මහා සභාව වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහාත් අවසන් තීරණ සභාවට සළකා බැලීම සඳහා යොමු කිරීම සඳහා පහත නම් සඳහන් ගරු මන්ත්‍රීතුමන්ලා හා මන්ත්‍රීතුමියන්ලාගෙන් සමන්විත සංයුතිය 05 ක් වන කාරක සභාවක් පත් කිරීමට යෝජනා කරමි.

**I. මුදල් හා ප්‍රතිපත්ති කමිටුව**

ගරු සභාපති නිමල් වික්ටර් නාගොඩවිතාන මහතා, - කමිටු සභාපති
ධර්මසිරි ගනේවත්ත මන්ත්‍රීතුමා,
ප්‍රියන්තා ගුණසේකර මන්ත්‍රීතුමිය
තරංග සුදර්ශන මන්ත්‍රීතුමා
අජිත් එඩේරආරච්චි මන්ත්‍රීතුමා

XIV. 2019 වර්ෂය සඳහා ප්‍රාදේශීය සභාවේ බලතල , කාර්යයන් හා කර්තවය කිසිවකට හෝ සභාවෙහි සැළකිල්ලට භාජනය වී පවතින යම් කරුණකට හෝ අදාළව උපදෙස් දීමේ කාර්යය සඳහා මහා සභාව වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහාත්, අවසන් තීරණ සභාව වෙත සළකා බැලීම සඳහාත් පහත නම් සඳහන් මන්ත්‍රී මණ්ඩලයෙන් සමන්විත සංයුතිය 06 ක් වන කාරක සභාවක් පත් කිරීමට යෝජනා කරමි.

**II. කාර්මික සේවා කමිටුව**

ගරු සභාපති නිමල් වික්ටර් නාගොඩවිතාන මහතා, - කමිටු සභාපති
ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා
ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා
ගරු මන්ත්‍රී එම්.එම්. දිසානායක මහතා
ගරු මන්ත්‍රී වසන්ත කුමාරගේ මහතා
ගරු මන්ත්‍රිනී ඉනෝකා විජේවර්ධන මහත්මිය

XV. 2019 වර්ෂය සඳහා ප්‍රාදේශීය සභාවේ බලතල , කාර්යයන් හා කර්තවය කිසිවකට හෝ සභාවෙහි සැළකිල්ලට භාජනය වී පවතින යම් කරුණකට හෝ අදාළව උපදෙස් දීමේ කාර්යය සඳහා මහා සභාව වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහාත්, අවසන් තීරණ සභාව වෙත සළකා බැලීම සඳහාත් පහත නම් සඳහන් මන්ත්‍රී මණ්ඩලයෙන් සමන්විත සංයුතිය 06 කින් යුත් මන්ත්‍රී මණ්ඩලයක් පත් කිරීමට යෝජනා කරමි.

**III. නිවස හා ප්‍රජා සංවර්ධන කමිටුව**

ගරු සභාපති නිමල් වික්ටර් නාගොඩවිතාන මහතා, - කමිටු සභාපති
ගරු උප සභාපති ගාමිණී සුසන්ත මහතා
ගරු මන්ත්‍රී වෙරංග ලක්මාල් මහතා
ගරු මන්ත්‍රී සමන් විතානගේ මහතා
ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා
ගරු මන්ත්‍රිනී අරුණා ශාන්ති මහත්මිය

XVI. 2019 වර්ෂය සඳහා ප්‍රාදේශීය සභාවේ බලතල , කාර්යයන් හා කර්තවය කිසිවකට හෝ සභාවෙහි සැළකිල්ලට භාජනය වී පවතින යම් කරුණකට හෝ අදාළව උපදෙස් දීමේ කාර්යය සඳහා මහා සභාව වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහාත්, පරිසර විෂයෙහිලා බලපත්‍ර

ලබාදීමේදී නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහාත් , පරිසර ගැටළු සම්බන්ධව උපදෙස් ලබා දීම හා නිර්දේශ ලබා දීම සඳහාත් සංයුතිය 05 කින් යුත් මන්ත්‍රී මණ්ඩලයක් සහා නිලධාරීන්ගෙන් සමන්විත කාරක සභාවක් පත් කිරීමට යෝජනා කරමි.

**IV. පරිසර කමිටුව**

ගරු සභාපති නිමල් වික්ටර් නාගොඩවිතාන මහතා, - කමිටු සභාපති
ගරු මන්ත්‍රී චන්ද්‍රසිරි වනිගරත්න මහතා
ගරු මන්ත්‍රී විපිත් සහබන්දු මහතා
ගරු මන්ත්‍රිනී සුභාෂී ඒකනායක මහතා
ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා
ගරු මන්ත්‍රී නිශාන්ත නන්දන මහතා
මහජන සෞඛ්‍ය පරීක්ෂක (කොට්ඨාශයට අදාළ)
මධ්‍යම පරිසර අධිකාරියේ නිලධාරී
අවශ්‍යතාවය මත බාහිර ආයතනික නිලධාරීන්

XVII. 2019 වර්ෂය සඳහා ප්‍රාදේශීය සභාවේ බලතල , කාර්යයන් හා කර්තවය කිසිවකට හෝ සභාවෙහි සැළකිල්ලට භාජනය වී පවතින යම් කරුණකට හෝ අදාළව උපදෙස් දීමේ කාර්යය සඳහා මහා සභාව වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහාත්, ප්‍රසම්පාදන කටයුතු සම්බන්ධ අවසන් තීරණ සභාව වෙත සළකා බැලීම සඳහා ඉදිරිපත් කිරීමටත්, සංයුතිය 06 කින් යුත් පහත නම් සඳහන් මන්ත්‍රී මණ්ඩලයක් පත් කිරීමට යෝජනා කරමි.

**V. ටෙන්ඩර් කමිටුව**

ගරු සභාපති නිමල් වික්ටර් නාගොඩවිතාන මහතා, - කමිටු සභාපති
ගරු උප සභාපති ගාමිණී සුසන්ත මන්ත්‍රීතුමා
ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා
ගරු මන්ත්‍රී එම්. එම්. දිසානායක මහතා
ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා
ගරු මන්ත්‍රී අජිත් එඩේරආරච්චි මහතා

XVIII. 2019 වර්ෂය සඳහා ප්‍රාදේශීය සභාවේ බලතල , කාර්යයන් හා කර්තවය කිසිවකට හෝ සභාවෙහි සැළකිල්ලට භාජනය වී පවතින යම් කරුණකට හෝ අදාළව උපදෙස් දීමේ කාර්යය සඳහාත්, මහා සභාව වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහාත්, ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී අවශ්‍යා නිර්දේශ ලබාදීම සඳහාත් සංයුතිය 06 කින් යුත් පහත නම් සඳහන් මන්ත්‍රී මණ්ඩලයක් පත් කිරීමටත්, අවශ්‍යාතාවය මත තාක්ෂණ දැණුම ඇති බාහිර ආයතනික පුද්ගලයින්ගෙන්ද සමන්විත කමිටුවක් පත් කිරීමට යෝජනා කරමි.

**VI.තාක්‍ෂණ ඇගයුම් කමිටුව**

ගරු සභාපති නිමල් වික්ටර් නාගොඩවිතාන මහතා, - කමිටු සභාපති
ගරු මන්ත්‍රී සමන් විතානගේ මහතා
ගරු මන්ත්‍රී ගයාන් මධුෂංක මහතා
ගරු මන්ත්‍රී වෙරංග ලක්මාල් මහතා
ගරු මන්ත්‍රිනී ගයන්ති කුමාරි මහත්මිය
ගරු මන්ත්‍රී තරංග සුදර්ශන මහතා

XIX. 2019 වර්ෂය සඳහා ප්‍රාදේශීය සභාවේ බලතල , කාර්යයන් හා කර්තවය කිසිවකට හෝ සභාවෙහි සැළකිල්ලට භාජනය වී පවතින යම් කරුණකට හෝ අදාළව උපදෙස් දීමේ කාර්යය සඳහාත්, මහා සභාව වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහාත්, පුස්තකාල කටයුතු සම්බන්ධයෙන් අවසන් තීරණ සබාව වෙත සළකා බැලීම සඳහා ඉදිරිපත් කිරීමටත්, සංයුතිය 05 කින් යුත් මන්ත්‍රී මණ්ඩලයක් පත් කිරීමටත්, පාඨක සමාජ සාමාජිකයන් ඇතුළුව කමිටුවක් පත් කිරීමට යෝජනා කරමි.

**VII. පුස්තකාල උපදේශන කමිටුව**

ගරු සභාපති නිමල් වික්ටර් නාගොඩවිතාන මහතා, - කමිටු සභාපති
ගරු මන්ත්‍රිනී ප්‍රියන්තා ගුණසේකර මහත්මිය
ගරු මන්ත්‍රිනී සුභාෂි ඒකනායක මහත්මිය
ගරු මන්ත්‍රී ධර්මසිරි ගනේවත්ත මන්ත්‍රීතුමා
ගරු මන්ත්‍රිනී කේ. ඒ. චන්දිමා දිල්රුක්ෂි මහත්මිය
ගරු මන්ත්‍රිනී නෙලී වක්වැල්ල මහත්මිය

**XX. මුදල් කමිටුව වෙත බලතල පැවරීම**

2019 වර්ෂය සඳහා ප්‍රාදේශීය සභා අරමුදලේ ලැබීම් හා වියදම් සම්බන්ධයෙන් හා සභාවට අවශ්‍ය උපදෙස් ලබාදීම සඳහාත් ඊට අදාළ කාර්ය කටයුතු පිළිබඳව මහා සභාවට ඉදිරිපත් කිරීම සඳහාත්, මහා සභාව වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහාත්, අවසන් තීරණ සභාවේ සළකා බැලීම සඳහා ඉදිරිපත් කිරීමටත්, බලතල පවරමි.

**ගරු සභාපතිතුමා විසින් කරන ලද කමිටු පත්කිරීම සම්බන්ධ යෝජනාව ගරු මන්ත්‍රී විජිත් සහබන්දු මහතා විසින් ස්ථිර කරන ලදී.**

XXI. විවිධ හේතූන් මත නැවත අය කර ගැනීමට නොහැකිව පවත්නා සේවක ණය ශේෂයන් කපා හැරීමට යෝජනා කරමි.

**ඉදිරි සභාවට සවිස්තර වාර්තාවක් ඉදිරිපත් කර තීරණයක් ගැනීමට තීරණය කරන ලදී.**

XXII. 2018.08.06 දින පවත්වන ලද විගණන හා කළමනාකරණ කමිටු තීරණ ක්‍රියාත්මක කිරීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා විසින් ස්ථිර කරන ලදී.**

XXIII. පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන -2018 නාගොඩ යටලමත්ත මාමණදොළ වතු මාර්ගය සංවර්ධනය කිරීමේ කර්මාන්තය ඉටු කිරීම සඳහා මාමණදොළ සමෘද්ධි ප්‍රජා මූල සංවිධානය සමඟ ගිවිසුම් ගතවීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී විජිත් සහබන්දු මහතා විසින් ස්ථිර කරන ලදී.**

XXIV. උපමාන පාදක ප්‍රදාන - 2018 තල්ගස්වල සති පොළ සංවර්ධනය කිරීමේ කර්මාන්තය ඉටු කිරීම සඳහා සහන ගොවි සංවිධානය, පරණතානායම්ගොඩ සමඟ ගිවිසුම් ගතවීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී ගයාන් මධුෂංඛ මහතා විසින් ස්ථිර කරන ලදී.**

XXV. උපමාන පාදක ප්‍රදාන වෙනත් සේවා - 2018 උඩුගම දකුණ ළමා ක්‍රීඩාපිටිය සංවර්ධනය කිරීමේ කර්මාන්තය ඉටු කිරීම සඳහා ග්‍රාම සංවර්ධන සමිතිය, උඩුගම, බටහිර සමඟ ගිවිසුම් ගතවීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී වෙරංග ලක්මාල් මහතා විසින් ස්ථිර කරන ලදී.**

XXVI. පළාත් නිශ්චිත ප්‍රජා ජල සම්පාදනය - 2018 උඩුගම පුස්තකාලයේ ජල සැපයුම් හා සනීපාරක්ෂක වැසිකිළි පද්ධතිය ස්ථාපනය කිරීමේ කර්මාන්තය ඉටු කිරීම සඳහා කුරුපනාව ගොවි සංවිධානය සමඟ ගිවිසුම් ගතවීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී වෙරංග ලක්මාල් මහතා විසින් ස්ථිර කරන ලදී.**

XXVII. නාගොඩ ප්‍රාදේශීය සභාවේ 2003- 2015 වර්ෂය දක්වා ණය හිමි ශේෂ නිරවුල් කිරීම

**ගරු සභාපතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී එම්. එම්. දිසානායක මහතා විසින් ස්ථිර කරන ලදී.**

XXVIII. නාගොඩ ප්‍රාදේශීය සභා ක්‍රියාකාරි සැළැස්ම - 2019

XXIX. පහත නම් සඳහන කතෘන් විසින් රචිත පහත සඳහන් පොත් පුස්තකාල තුන සඳහා මිළදී ගැනීමට යෝජනා කරමි.

කතෘගේ නම - ජා ඇල ස්වර්ණා පෙරේරා මහත්මිය

| | |
|---|---|
| සෙහස්නා | - රු. 300.00 |
| කැඩපත | - රු. 390.00 |
| පැතුම් ප්‍රාර්ථනා මිසක් | - රු. 390.00 |
| සමාජගත තමන්ගේ නම | - රු. 390.00 |
| ශ්වේත ගිනි | - රු. 350.00 |

කතෘගේ නම - පොරවගම ආර්. ඩබ්. මිත්‍රපාල මහතා

| | |
|---|---|
| බෙරලිය මල | - රු. 480.00 |

කතෘගේ නම - කුමුදුද සිල්වා, පන්නිපිටිය

සමාජයීය චිත්තවේග ඉගනුම් පොත් කට්ටලය

**මේ සම්බන්ධව ගරු මන්ත්‍රී චන්ද්‍රසිරි වනිගරත්න මහතා කියා සිටියේ පුස්තකාල කමිටුවට යොමු කර පොත්වල ගුණාත්මකභාවය පරික්ෂා කර බලා නිර්දේශයක් රැගෙන මිළදී ගැනීම සුදුසු බවයි. ඒ අනුව පුස්තකාල කමිටුව නිර්දේශ ලබාගෙන මිළදී ගැනීමට තීරණය විය.**

XXX. මුදල් ගෙවීමේ වාර්තාව ඉදිරිපත් කිරීම

## 2018.12.11 දින පවත්වනු ලබන මහසභා රැස්වීම සඳහා ඉදිරිපත් කල යුතු ආවරණ අනුමැතිය යටතේ කල ගෙවීම් පිළිබඳ වාර්තාව.

01. ලේකම්, නාගොඩ ප්‍රාදේශීය සභව
සුළු අක් මුදල් පියවීම හා ප්‍රතිපූර්ණය කිරීම - රු. 2971.00

02. ඩී. ආර්. ඉන්ඩස්ට්‍රීස් ප්‍රයිවට් ලිමිටඩ්
නාගොඩ ප්‍රාෙද්ශීය සභා ප්‍රධාන කාර්යාලයේ රැස්වීම් ශාලාව වායු සමීකරණය කිරීමේදී කේසිනව් සවි කිරීමට අදාළ බිල්පත පියවීම - රු. 2520.00

03. දයානි පුද්ගලික සමාගම, මාපලගම

| | | |
|---|---|---|
| I. | නාගොඩ ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාව වායු සමීකරණය කිරීම සඳහා අවශය ඉලෙක්ට්‍රොනික උපකරණ ලබා ගැනීමේ බිල්පත පියවීම බිල්පත් අංක 450- 2018.09.21 | - රු. 5838.00 |
| II. | රැස්වීම් ශාලාවේ විදුලි පද්ධතිය අළුත්වැඩියා කිරීමේ බිල්පත පියවීම බිල් අංක 02 – 2018.09.20 | - රු. 5700.00 |
| III. | බිල් අංක 01 – 2018.09.20 | - රු. 6000.00 |
| IV. | රැස්වීම් ශාලාව අළුත්වැඩියා කිරීම සඳහා අවශ්‍ය භාණ්ඩ ලබා ගැනීමේ බිල්පත් බිල් අංක 448 – 2018.09.21 | - රු. 1055.00 |
| V. | බිල් අංක 678 – 2018.10.05 | - රු. 930.00 |

## 2018.12.11 දින පවත්වනු ලබන මහසභා රැස්වීම සඳහා ඉදිරිපත් කළ යතු ඉදිරි ගෙවීම් වාර්තාව.

**ඉදිරි ගෙවීම් (පොදු අරමුදල්)**

**01.2018 නොවැම්බර් මස විදුලි බිල්පත්**

| | | | |
|---|---|---|---|
| I. | 4501090200 | - මාපලගම වෙළඳ සංකීර්ණ කොරිඩෝව | - රු. 935.70 |
| II. | 4593739918 | -මාපලගම උප කාර්යාලය | - රු. 624.30 |
| III. | 4509082908 | - උක්ඕවිට පෙර පාසල | - රු. 258.30 |
| IV. | 2810125104 | - දීප්ති පෙර පාසල | - රු. 313.20 |
| V. | 2810236100 | - මාපලගම කරුණාතිලක ක්‍රීඩාංගනය | - රු. 276.60 |
| VI. | 4509082800 | - උදාර පෙර පාසල | - රු. 331.50 |
| VII. | 4591713210 | - ප්‍රධාන කාර්යාලය | - රු. 4723.50 |
| VIII. | 4507357802 | - සමනල පෙර පාසල | - රු. 349.80 |
| IX. | 8617046104 | - උඩුගම බහු කාර්ය මධ්‍යස්ථානය | - රු. 935.40 |
| X. | 2813038709 | - කැකුළු පෙර පාසල | - රු. 240.00 |
| XI. | 8616374000 | - ටොයිලට් කම්ප්ලෙක්ස් | - රු. 240.00 |
| XII. | 8616373802 | - උඩුගම පොළ | - රු. 240.00 |

XIII. 2813189405 - තල්ගස්වල පෙර පාසල - රු. 331.50
XIV. 2809093105 - කොම්පෝස්ට් ව්‍යාපෘතිය - රු. 1777.20
XV. 4594192319 - උඩුගම උප කාර්යාලය - රු. 1081.80

**02. සී/ස ලංකාබෙල් සමාගම**

0915701722 උප සභාපතිතුමාගේ නිවස (2018.10.16- 2018.11.15) - රු. 688.49

**03. මොබිටෙල් පුද්ගලික සමාගම**

පුරනැගුම ව්‍යාපෘතියේ කෙටි පණිවිඩ සේවාව සඳහා බිල්පත (2018.10.25) - රු. 74.84
පුරනැගුම ව්‍යාපෘතියේ කෙටි පණිවිඩ සේවාව සඳහා බිල්පත (2018.11.25) - රු. 68.86

**04.ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය**

33/53/003/008/11 - උඩුගම උප කාර්යාලය (2018.10.17 – 2018.11.17) -රු. 1650.25

**05.ලේකම්, නාගොඩ ප්‍රාදේශීය සභාව**

I. ප්‍රධාන කාර්යාලයේ වැසිකිලි පද්ධතියේ ගලිය උතුරා යාම නිසා එය ඉවත් කිරීමට ගලි බවුසර් සේවාව ලබාගැනීම වෙනුවෙන් මුදල් ප්‍රතිපූර්ණය - රු. 8000.00
II. සභාපතිතුමා,උප සභාපතිතුමා ඇතුලු මන්ත්‍රී මණ්ඩලයට 2018 නොවැම්බර් මස ඉන්ධන දීමනා ලබා දීමේ බිල්පත පියවීම -රු.81000.00

**06.කේ.ජී ජයනි මිය,සංවර්ධන නිලධාරී (ප්‍රජා),නාගොඩ ප්‍රාදේශීය සභා**

නිවාඩු දිනයන්හි රාජකාරි කටයුතු වල නිරිතවීම වෙන්වෙන් දින වැටුප් ගෙවීම
(2018/11/03-2018/11/04) - රු. 2264.60

**07.ගමන් වියදම් ගෙවීම**

**2018 ජූලි මස ගමන් වියදම්**
<u>ආයතනයේ රාජකාරි ගමන්වල නියලීම</u>
අනුර දිසානායක මයා - රියදුරු -රු. 462.00

**2018 සැප්තැම්බර් මස ගමන් වියදම්**
<u>ආයතනයේ රාජකාරි ගමන්වල නියලීම</u>
අනුර දිසානායක මයා - රියදුරු -රු. 812.00

**2018 ඔක්තෝම්බර් මස ගමන් වියදම්**
<u>ආයතනයේ රාජකාරි ගමන්වල නියලීම</u>
ඩබ්.ජේ.ඒ. ශානක මයා - ආදායම් පරික්ෂක - රු. 452.00

<u>පුහුණු වැඩසටහන් සඳහා</u>
කේ.ඒ. එදිරිසිංහ මයා - තාක්ෂණ සේවා නිලධාරී - රු.5196.00
පී. බී.කේ. ප්‍රේමලතා මිය - පෙර පාසල් ගුරු - රු. 820.00
එම්.කේ. ශීලා රංජනී මිය - පෙර පාසල් ගුරු - රු. 820.00

**2018 නොවැම්බර් මස ගමන් වියදම්**

**<u>ආයතනයේ රාජකාරි ගමන්වල නියලීම</u>**

| | | |
|---|---|---|
| එස්.කේ.මල්ලවආරච්චි මයා | - කළමනාකරණ සහකාර | -රු. 1972.00 |
| එම්.ඒ.වසන්ත මයා | - රියදුරු | - රු.2800.00 |
| යූ.වී. මධුර ප්‍රභාත් මයා | - කාර්යාල කාර්ය සහායක | - රු. 530.00 |

**<u>පුහුණු වැඩසටහන් සඳහා</u>**

| | | |
|---|---|---|
| එම්.එච්. ෆර්සියා ෆර්වීන් මිය | - ලේකම් | - රු.2160.00 |
| ඉරේෂා මදනායක මිය | - සංවර්ධන නිලධාරී | - රු.3630.00 |
| බී. ඩී. එල්. ඩී. කුමාරි මිය | - පුස්තකාලයාධිපති | - රු. 2628.00 |
| එම්. ඒ. ඩී. චන්ද්‍රප්‍රභා මෙය | - කළමනාකරණ සහකාර | - රු. 526.00 |
| ටී. එස්. මනම්පේරි මෙය | - පුස්තකාලයාධිපති | - රු. 2628.00 |
| කේ.ඒ. එදිරිසිංහ මයා | - තාක්ෂණ සේවා නිලධාරී | - රු. 842.00 |
| අයි. චතුරි චින්තිකා මිය | - සංවර්ධන නිලධාරී | - රු. 1756.00 |
| ඩබ්. ආර්. අනුෂී වසන්තිකා මිය | - පුස්තකාල සහායක | - රු. 1800.00 |

**2018 දෙසැම්බර් මස ගමන් වියදම්**

**<u>පුහුණු වැඩසටහන් සඳහා</u>**

| | | |
|---|---|---|
| එම්.එච්. ෆර්සියා ෆර්වීන් මිය | - ලේකම් | - රු. 1090.00 |
| දිලිනි දිසානායක මිය | - තාක්ෂණ සේවා නිලධාරී | - රු. 2490.00 |

**<u>ආයතනයේ රාජකාරි ගමන්වල නියලීම</u>**

| | | |
|---|---|---|
| එම්.එච්. ෆර්සියා ෆර්වීන් මිය | - ලේකම් | - රු.1000.00 |
| එස්.කේ.මල්ලවආරච්චි මයා | - කළමනාකරණ සහකාර | -රු. 1316.00 |

**<u>අතිකාල දීමනා ගෙවීම</u>**

**<u>2018 ඔක්තොම්බර් මස</u>**

| | | |
|---|---|---|
| යසරත්න විජේසේකර මයා | - මුරකරු | - රු.7722.00 |

**<u>2018 නොවැම්බර් මස</u>**

| | | |
|---|---|---|
| එම්.ඒ.වසන්ත මයා | -රියදුරු | - රු. 7034.00 |
| බී.ජී. පියතිලක මයා | - රියදුරු | - රු. 2857.72 |
| ඒ.එච්.ජී. සංජීව මයා (මුර සේවය වෙනුවෙන්) | - වැඩ/ක්ෂේත්‍ර කම්කරු | - රු. 4020.00 |
| ඩී.ටී.ආර්.ඒ. ගුණරත්න මයා | - මුරකරු | - රු. 6150.00 |
| යසරත්න විජේසේකර මයා | - මුරකරු | - රු. 8580.00 |
| ඩබ්.කේ. සම්පත් සංජීව මයා (මුර සේවය වෙනුවෙන්) | - ආදේශක රියදුරු | - රු. 6000.00 |
| එන්.එම්.රජිත මයා | - ආදේශක මුරකරු | - රු. 3000.00 |

**08.2018 නොවැම්බර් මස පරිවර්ජිත ගමන් වියදම් ගෙවීම (ක්ෂේත්‍ර නිලධාරින් සඳහා)**

| | | |
|---|---|---|
| ආර්.ඒ.ඒ.එල්.රත්නායක මිය | - සංවර්ධන නිලධාරී | - රු. 3000.00 |
| දිලිනි දිසානායක මිය | - තාක්ෂණ සේවා නිලධාරී | - රු. 4000.00 |
| කුසල් අසංක එදිරිසිංහ මයා | - තාක්ෂණ සේවා නිලධාරී | - රු. 4000.00 |
| කේ.ජී.ජයනි මිය | - සංවර්ධන නිලධාරී | -රු. 3000.00 |
| ඩබ්.ජේ.ඒ.ශානක මයා | -ආදායම් පරීක්ෂක | -රු .3000.00 |

**09.එච්.ඩබ්.ප්‍රියන්ත අමරනාත් මයා, ම.සෞ.ප**

I. රෝග නිවාරණ පනතේ නඩු සඳහා උඩුගම මහේස්ත්‍රාත් අධිකරණයට යාම වෙනුවෙන් ගෙවීම (2018/11/23) - රු. 492.00

**10. එච්. එල්.එන්.පී. කුමාර මයා, ම.සෞ.ප**

I. ආහාර පනතේ නඩු සඳහා බද්දේගම මහේස්ත්‍රාත් අධිකරණයට යාම වෙනුවෙන් ගෙවීම (2018/10/19) - රු. 466.00

**11.ආර්. ඒ.රංජිත් මානෙල් මයා, හොටෙල් සීගිරි,නාගොඩ**

2018.11.13 දින පැවති මහ සභා රැස්වීම සඳහා සංග්‍රහ කිරීමේ වියදම් (ආහාර සඳහා) - රු.2463.00

**12.සී/ස යක්කලමුල්ල විවිධ සේවා සමූපකාර සමිතිය**
**2018 ඔක්තෝම්බර් මස ඉන්ධන ලබා ගැනීමේ බිලපත්**

| | |
|---|---|
| PF 7360 කැබ්රථය ඩීසල් ලීටර් 599 ක් | - රු. 73677.00 |
| LL 7103 ටිපර් රථය ඩීසල් ලීටර් 200 ක් | - රු. 24600.00 |
| LL 7366 ට්‍රක් බවුසරය ඩීසල් ලීටර් 50 ක් | - රු. 6150.00 |
| 252-6478 කැබ් රථය ඩීසල් ලීටර් 280 ක් | - රු. 34440.00 |
| RD 9457 ට්‍රැක්ටරය ඩීසල් ලීටර් 84 ක් | - රු. 10332.00 |
| RA 8570 ට්‍රැක්ටරය ඩීසල් ලීටර් 20 ක් | - රු. 2460.00 |
| LL 7650 කෘ කැබ් රථය ඩීසල් ලීටර් 107 ක් | - රු. 13161.00 |

**13.සී/ස යක්කලමුල්ල විවිධ සේවා සමූපකාර සමිතිය**
**2018 නොවැම්බර් මස ඉන්ධන ලබා ගැනීමේ බිලපත්**

| | |
|---|---|
| PF 7360 කැබ්රථය ඩීසල් ලීටර් 594ක් | - රු. 68026.00 |
| LL 7103 ටිපර් රථය ඩීසල් ලීටර් 100 ක් | - රු. 11350.00 |
| 252-6478 කැබ් රථය ඩීසල් ලීටර් 160 ක් | - රු. 18360.00 |
| RD 9457 ට්‍රැක්ටරය ඩීසල් ලීටර් 30 ක් | - රු. 3330.00 |
| RA 8570 ට්‍රැක්ටරය ඩීසල් ලීටර් 20 ක් | - රු. 2220.00 |
| LL 7650 කෘ කැබ් රථය ඩීසල් ලීටර් 186 ක් | - රු. 20901.00 |
| ගබඩාවට ලීටර 20 | - රු. 2800.00 |
| ගබඩාවට 2T ඔයිල් ලීටර් 1 | - රු. 620.00 |

**14.එච්.එල්.කේ.ශ්‍රීනිත් රුක්ෂාන්, උඩුගම**

උඩුගම මහජන පුස්තකාලය සඳහා පුවත්පත් ලබාගැනීම වෙනුවෙන් ගෙවීම
2018 නොවැම්බර් - රු. 4900.00

**15.ඒ.ඩී. කරුණාරත්න මයා, සරත් ස්ටෝර්ස්, යටලමත්ත**

නාගොඩ මහජන පුස්තකාලය සඳහා පුවත්පත් ලබාගැනීම වෙනුවෙන් ගෙවීම

| | |
|---|---|
| 2018 සැප්තැම්බර් | - රු. 5400.00 |
| 2018 ඔක්තෝම්බර් | - රු. 5700.00 |
| 2018 නොවැම්බර් | - රු. 5610.00 |

**16.** **ලියනගේ ට්‍රේඩ් සෙන්ටර්, ගා/ නාගොඩ**

i. 2018 නොවැම්බර් මස පැවති මහ සභා රැස්වීමට අදාල සංග්‍රහ වියදම් බිල්පත (තේ සඳහා) - රු. 3133.00

**17.නීතිඥ හේමන්ත පී. ඩබ් විතාරණ මයා, කොටුව, ගාල්ල**

I. 13814 දරණ 2018.12.06 දින පැවැති නඩුවෙහි නීතිඥ ගාස්තු - රු. 3000.00

**18.** **ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ටාර්, ඇල්පිටිය**

i. 2017 ජනවාරි සිට අප්‍රේල් දක්වා මුද්දර ගාස්තු උපලේඛන පිළියෙල කිරීම වෙනුවෙන් කාර්ය මණ්ඩල දීමනා ගෙවීම් - රු. 900.00

**19.ඒ.කේ.නිලන්ති සජීවනී,ග්‍රාෆ් ටෙල් කමියුනිකේෂන්**

i. සභාපතිතුමා,උප සභාපතිතුමා ඇතුලු මන්ත්‍රී මණ්ඩලයට 2018 නොවැම්බර් මස දුරකථන පෙර ගෙවුම් කාඩ්පත් ලබා දීමේ බිල්පත පියවීම -රු.28500.00

ii. 2018 නොවැම්බර් මස සභා වාර්තා පිටපත් මුද්‍රණය කිරීම වෙනුවෙන් ගෙවීම - රු. 2400.00

iii. අයවැය ප්‍රකාශනය ෆොටෝ කොපි කිරීම වෙනුවෙන් ගෙවීම - රු.10488.00

**20.** **විගණකාධිපති, විගණකාධිපති දෙපාර්තමේන්තුව**

විගණකාධිපති දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු හිඟ විගණන ගාස්තු ගෙවීම - රු. 9370.00

**21.** **නිව් විජය මෝටර්ස්, ගාල්ල**

LL 7650, LL 7103, RV 5013 දරණ වාහන සහ ට්‍රේලරය සඳහා ටයර් සහ ටියුබ් මිළදී ගැනීමේ බිල්පත - රු.36500.00

**22.** **කෙත්සිරි කමියුනිකේෂන්, තල්ගස්වල**

2018 වර්ෂයේ පෙර පාසල් සඳහා සහතික පත්‍ර මුද්‍රණය කිරීම වෙනුවෙන් ගෙවීම - රු. 8268.75

**23.දේව පැතුම් ශාමින් ද සිල්වා, ඩ්‍රීම් ඇපරල් සොලියුෂන්,රත්ගම**

2018 පළාත් පාලන ක්‍රීඩා උළෙල සඳහා ටී ෂර්ට් ලබා ගැනීමේ බිල්පත පියවීම -රු.95040.00

**24.පැරගන් ස්ටේෂනර්ස්, ගාල්ල**

නාගොඩ ප්‍රාදේශීය සභාවේ ලිපිද්‍රව්‍ය ලබා ගැනීමේ බිල්පත පියවීම - රු.22145.50

**25.** **ඒ. රේණුකා මල්කාන්ති මිය, මුලන, නාගොඩ**

නාගොඩ ප්‍රාදේශීය සභාවට අයත් මුලන රණවිරු මාවත පළුදු කර ජලනළ එළීම වෙනුවෙන් තැන්පත් කල මුදල ආපසු ගෙවීම - රු. 5000.00

**26.** **උපාලි නිව්ස්පේපර්ස් පුද්. සමාගම, කොළඹ**

2018.11.15 දින දිවයින පුවත්පතෙහි පළ කරන ලද ප්‍රසම්පාදන දැන්වීමට අදාළ ගාස්තු ගෙවීම - රු.24150.00

**27.** **මුතුහෙට්ටිගම සේවා ස්ථානය, උඩුගම**

252-6478 දරණ කැබ් රථය සේවා කිරීමේ බිල්පත පියවීම - රු. 13978.00

**28. එස්. එච්. එස්. රිහානා මිය , කටුගොඩ, ගාල්ල**
නාගොඩ ප්‍රාදේශීය සභාවේ 2019 වර්ෂයට බදු හා ගාස්තු පැනවීම සම්බන්ධ වාර්තාව දෙමළ බසට පරිවර්තනය කිරීමේ හා ටයිප්සෙටින් කිරීමේ ගාස්තු ගෙවීම - රු. 11613.00

**29. ජී. පී. සදුන් චතුරංග මයා, නාගොඩ**
නාගොඩ ප්‍රාදේශීය සභාවේ පරිගණක යන්ත්‍රවල මුද්‍රණ යන්ත්‍රවලට අවශය ටෝනර් ලබා ගැනීමේ බිල්පත - රු. 39500.00

**30. ඊ. ඒ. සමන් කුමාර එදිරිසිංහ, එදිරිසිංහ මෝටර්ස්**
252-6478 දරණ කැබ් රථය අළුත්වැඩියා කිරීමේ බිල්පත - රු. 3790.00

**31. එස්. ඒ.ඒ. එම්. ෆාස්ලාන් මයා, ෆෝඩ් ඩ්‍රයිව්, ගාල්ල**
PF 7360 අංක දරණ කැබ් රථය සඳහා එයාර් ෆෙෂ්නර් එකක් මිළදී ගැනීමේ බිල්පත - රු. 700.00

**32. හඳුන්නෙත්ති, ටයර් ඇන්ඩ් බැටරි සෙන්ටර්, උඩුගම**
LL 7650 දරණ කෘ කැබ් රථයේ ඉදිරිපස සඳහා අලුතින් ටයර් සවි කිරීමේ හා රෝද හතර මාරු කිරීමේ බිල්පත - රු. 1200.00

**33. එස්. බී. ප්‍රින්ටර්ස් ප්‍රයිවට් ලිමිටඩ් , මීගමුව**
ඉන්වෙන්ට් ලේඛන සහ ඉඩම් අනුබෙදුම් අයදුම්පත්‍ර ලේඛන මිළදී ගැනීමේ බිල්පත පියවීම- රු. 10760.00

**34. කෙත්සිරි කමියුනිකේෂන්, තල්ගස්වල**
ප්‍රදාන කාර්යාලය සඳහා A4 මිළදී ගැනීමේ බිල්පත - රු. 7300.00

**35. ඒ. කේ. ජානක ගයාන් සංජීව, ගයාන් එන්ටර්ප්‍රයිසස්, යටලමත්ත**

i. යටලමත්ත බරවමුල්ල මාර්ගයේ මිය ගොස් සිටි මී හරකෙකු බැකෝ යන්ත්‍ර යොදවා වළලා දැමීමේ බිල්පත පියවීම මීටර් පැය 1 - රු. 2500.00

**36. ආසිරි ටයර් ට්‍රේඩර්ස් ඇන්ඩ් ඔටෝ සර්විසස්, මාපලගම**

i. ප්‍රාදේශීය සභාව සතු වාහන සේදීමේ යන්ත්‍රය සඳහා අවශ්‍ය Car wash, Oil Can මිළදී ගැනීමේ බිල්පත පියවීම - රු. 2295.00
ii. 252-6478 කැබ් රථය සඳහා බ්‍රේක් හෝස් එකක් සහ බ්රේක් ඔයිල් එකක් ලබා ගැනීමේ බිල්පත - රු. 2480.00

**37. භාණ්ඩාගාරික , පෙර පාසල් සංවර්ධන කමිටුව, උක්ඹිවිට**
2017.12.08 දින උඩුගම බහුකාර්ය ගොඩනැගිල්ලේ පැවැත්වූ පෙර පාසල් විවිධ ප්‍රසංගය සඳහා ශාලාව වෙන් කිරීමට අදාල තැන්පතු මුදල් ආපසු ගෙවීම - රු. 5000.00

**38. ජයන්ත ඉලේපෙරුමආරච්චි, නාගොඩ**
2019 අයවැය ලේඛනයේ කලර් ප්‍රින්ට්අවුට් ලබා ගැනීම සඳහාවැය වූ බිල්පත පියවීම - රු. 2280.00
අයවැය ප්‍රකාශනයේ මුල් කවර හා පසු කවර ලබාගැනීමේ බිල්පත - රු. 3510.00
අයවැය ප්‍රකාශනයේ ඇතුළත වර්ණ පිටපත් මුද්‍රණය කිරීමේ බිල්පත - රු. 4680.00

**39. ස්කයිවේ ඉලෙක්ට්‍රිකල්ස්, කොළඹ**
වීථි පහන් අළුත්වැඩියා කටයුතු සඳහා විදුලි උපකරණ ලබා ගැනීමේ බිල්පත - රු. 166450.00

**40. සී/ර යටලමත්ත සකසුරුවම්කම හා ණය ගණුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය, යටලමත්ත**
2018.11.30 දින පළාත් පාලන ක්‍රීඩා උළෙලේ අවසන් උත්සවයට සහභාගි වීම සඳහා බස්රථයක් ලබාගැනීමේ බිල්පත පියවීම - රු. 11000.00

**41 මහජන බැංකුවේ ලංකා විදුලිබල මණ්ඩල ගිණුම හිඟ විදුලි බිල්පත් පියවීම**
සමනල පෙර පාසල (4507357802)

2017 මැයි, ජූලි, සැප්තැම්බර්, ඔක්තෝම්බර් සහ 2018 පෙබරවාරි, ජූලි - රු. 1824.30

**42. ශ්‍රී ලංකා ටෙලිකොම් පී එල් සී**
සභාපතිතුමාගේ නිවසේ දුරකතන බිල්පත් පියවීම (0912231201)
2018 ඔක්තෝම්බර් - රු. 2102.00
2018 නොවැම්බර් - රු. 1122.27

<u>**පොදු අරමුදල් කර්මාන්ත**</u>

**43. එම්.වී. නාමල් ලක්රුවන්, නාමල් කන්ස්ට්‍රක්ෂන්, ගෝණදෙනිය**

i. උඩුගම 218 C මොරගල්මුල්ල කොස්ගහහේන මාර්ගය ජේ.සී.බී. යන්ත්‍ර යොදා සංවර්ධනය කිරීම වෙනුවෙන් ගෙවීම - රු. 22500.00
ii. උඩුගම 218 D උක්ඕවිට 59 බටහේන්ගොඩ මාර්ගය ජේ.සී.බී. යන්ත්‍ර යොදා සංවර්ධනය කිරීම වෙනුවෙන් ගෙවීම - රු. 15000.00

**44. කේ.කේ.බී. රාජකරුණා , සීපීආර් එන්ටර්ප්‍රයිසස්, යටලමත්ත**

i. 222 ඌරල මධ්‍යම කොතේගොඩකන්ද මාර්ගය ගාමිණී මහතාගේ නිවස අසළ දක්වා ජේ.සී.බී. යන්ත්‍ර යොදා සංවර්ධනය කිරීම වෙනුවෙන් ගෙවීම - රු. 22500.00
ii. කොතේගොඩකන්ද ප්‍රධාන මාර්ගයේ සිට සිරිමාන්න මහතාගේ නිවස දක්වා ඇති අතුරු මාර්ගය ජේ.සී.බී. යන්ත්‍ර යොදා සංවර්ධනය කිරීම වෙනුවෙන් ගෙවීම - රු. 20000.00
iii. 222 A ඌරල දකුණ ග්‍රාම නිලධාරී වසමේ ගල්කැටියාගොඩ කන්ද මුදුනේ සිට මල්වත්තහේන පාර දක්වා මාර්ගය ජේ.සී.බී. යන්ත්‍ර යොදා සංවර්ධනය කිරීම වෙනුවෙන් ගෙවීම - රු. 17500.00
iv. නැඹිනිගල ලියන්දොළ සිට අමරජීව වෙළඳසැළ දක්වා ඇති මාර්ගයෙන් කොටසක් ජේ.සී.බී. යන්ත්‍ර යොදා සංවර්ධනය කිරීම වෙනුවෙන් ගෙවීම - රු. 15000.00

45. **උඩවැලිවිටිතලාව ශ්‍රමදාන මාර්ගය සංවර්ධනය කිරීමේ කර්මාන්තයේ බිල්පත් ගෙවීම**

i. එම්. එම්. ටී.එස්. ප්‍රභාෂ්වර මයා
කොරිපස් කියුබ් 11 ලබා ගැනීමේ බිල්පත පියවීම - රු. 19250.00
ii. රංග මදූෂාන් මයා
කොරිපස් ප්‍රවාහනය වෙනුවෙන් ගෙවීම - රු. 8000.00

iii. වසන්ත කෝනගහගේ මයා
කොරිපස් ප්‍රවාහනය වෙනුවෙන් ගෙවීම - රු. 8000.00
iv. ඒ. කේ. ජනක ගයාන් සංජීව මයා
J.C.B. යන්ත්‍ර යොදා මාර්ගය සංවර්ධනය වෙනුවෙන් ගෙවීම (මී. පැය.6) - රු. 15000.00

**46. ගල්ලෙනමුල්ල මාර්ගය සංවර්දනය කිරීමේ කර්මාන්තයේ බිල්පත් ගෙවීම**
i. එම්. එම්. ටී.එස්. ප්‍රභාෂ්වර මයා
කොරිපස් කියුබ් 11 ලබා ගැනීමේ බිල්පත පියවීම - රු. 19250.00
ii. රංග මදූෂාන් මයා
කොරිපස් ප්‍රවාහනය වෙනුවෙන් ගෙවීම - රු. 8000.00
iii. වසන්ත කෝනගහගේ මයා
කොරිපස් ප්‍රවාහනය වෙනුවෙන් ගෙවීම - රු. 8000.00
iv. ඒ. කේ. ජනක ගයාන් සංජීව මයා
J.C.B. යන්ත්‍ර යොදා මාර්ගය සංවර්ධනය වෙනුවෙන් ගෙවීම (මී. පැය.6) - රු. 15000.00

47. **බතලවත්තගොඩ කවුඩැල්දූව මාර්ගය කොරිපස් දමා සංවර්ධනය කිරීමේ කර්මාන්තය**
i. එම්. එම්. ටී.එස්. ප්‍රභාෂ්වර මයා
කොරිපස් කියුබ් 18 ලබා ගැනීමේ බිල්පත පියවීම - රු. 31500.00
ii. ඒ. කේ. ජනක ගයාන් සංජීව මයා
J.C.B. යන්ත්‍ර යොදා මාර්ගය සංවර්ධනය වෙනුවෙන් ගෙවීම (මී. පැය.5) - රු. 12500.00
iii. එල්.ජී. වික්‍රමආරච්චි මයා, ඉමාෂි ගොඩනැගිලි ද්‍රව්‍ය සපයන්නෝ
කොරිපස් ප්‍රවාහනය වෙනුවෙන් ගෙවීම - රු. 16000.00

<u>රජයේ ආධාර කර්මාන්ත</u>

**48.උඩුගම බටහිර ග්‍රාම සංවර්ධන සමිතිය**
i. නාගොඩ ප්‍රාදේශීය සභාවේ කොම්පෝස්ට් අංගනය අළුත්වැඩියා කිරීමේ
කර්මාන්තයේ පළමු හා අවසාන ගෙවීම - රු. 387430.83

<u>මන්ත්‍රී ප්‍රතිපාදන</u>

<u>දකුණු පළාත් සභා ගරු නියෝජ්‍ය සභාපති සම්පත් අතුකෝරල මැතිතුමා</u>

**49. චාමින් හාඩ්වෙයාර්, තල්ගස්වල**
උඩුගම දකුණ අක්කර 80 ගුණානන්දාරාම විහාරස්ථානයේ ඉදිකිරීම් කටයුතු සඳහා සිමෙන්ති ලබා දීමේ බිල්පත පියවීම - රු. 9600.00

**50. <u>දකුණු පළාත් සභා ගරු නියෝජ්‍ය සභාපති සම්පත් අතුකෝරල මැතිතුමා</u>**
මලාමුර ආදර්ශ ගම්මානයේ පොදු ළිද සඳහා සිළිංඩර ලබා දීම වෙනුවෙන් බිල්පත් - රු. 10000.00

**51. ගරු මන්ත්‍රී නලීන් හේවගේ මැතිතුමා**

සී/ස අතුකෝරල ඉලෙක්ට්‍රිකල්ස් පුද්. සමාගම
වීථි පහන් අළුත්වැඩියාව සඳහා CFL බල්බ් මිළදී ගැනීමේ බිල්පත - රු. 29920.00

**ඉදිරි ගෙවීම් වාර්තාව ගරු මන්ත්‍රීනී ප්‍රියන්තා ගුණසේකර මහත්මිය විසින් යෝජනා කල අතර ගරු මන්ත්‍රී විලේගේ අමර ධනංජය මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය**

➢ **8.2 කර්මාන්ත යෝජනා**

**8.3 ගරු සභාපතිතුමන් හා මන්ත්‍රීවරුන් විසින් ඉදිරිපත් කරන යෝජනා**

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන යෝජනා**

I. අන්නාසිගලහේන අතුරු මාර්ග J.C.B. යන්ත්‍රයක් යොදා සංවර්ධනය කිරීම
II. මඟුරුගොඩමුල්ල නාගොඩ ඉහළ මාර්ගය සඳහා සිළිංඩර යෙදීම
III. අමුන්දර ගෝණදෙනිය මාර්ගය J.C.B. යන්ත්‍රයක් හා කොරිපස් යොදා සංවර්ධනය කිරීම
IV. උඩුගම පොළ සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් කරන ලද යෝජනා ගරු උප සභාපතිතුමා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**ගරු මන්ත්‍රීනී සුභාෂි ඒකනායක මෙනවිය විසින් ඉදිරිපත් කරන යෝජනා**

I. සංවර්ධනය කිරීමට අනුමත වී ඇති යෝජනාවක් වෙනස් කිරීම - ගෝනලගොඩ හොරංගල්ල මාර්ගය කොරිපස් දමා සංවර්දනය කිරීමට ලබා දුන් යෝජනාව සංශෝධනය කර දොළේකන්ද මාර්ගය ජේ.සී.බී. යන්ත්‍රයක් යොදා සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රීනී සුභාෂි ඒකනායක මෙනවිය විසින් කරන ලද යෝජනා ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**ගරු මන්ත්‍රී පී.ජී. රංජිත් ජයවීර මහතා විසින් ඉදිරිපත් කරන යෝජනා**

I. අප බල ප්‍රදේශයට අයත් මාර්ගවලකාණු පද්ධතියට නිවසින් බැහැර කරන අපද්‍රව්‍ය හා නාන වතුර බැහැර කිරීම තහනම් කිරීමේ නාම පුවරු සවි කිරීම

**ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා විසින් කරන ලද යෝජනා ගරු මන්ත්‍රීනී බී.ජී. අරුණ ශාන්ති මහත්මිය විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**ගරු මන්ත්‍රී චන්ද්‍රසිරි වනිගරත්න මහතා විසින් ඉදිරිපත් කරන යෝජනා**

I. මීට පෙර සභාවට ඉදිරිපත් කර අනුමැතිය ලබා ගත් උඩුගම දකුණ ක්‍රීඩා පිටිය අසළින් දොඩංගොඩ මාවතට වැටෙන අතුරු පාර වෙනත් ව්‍යාපෘතියක් යටතේ සංවර්ධනය වන බැවින් ඉහත පාර සඳහා අනුමත කරන ලද ඇස්තමේන්තු ගත ඩෝසර් පැය 06 ක මුදල වන රු. 15000.00 ක මුදල එම කොට්ඨාසයට අයත් 28 ප්‍රදේශයේ මිනිරන්වල කන්ද මාර්ගයට යොදා ගැනීම සඳහා පෙර යෝජනාව වෙනස් කර දීම

**ගරු මන්ත්‍රී චන්ද්‍රසිරි වනිගරත්න මහතා විසින් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී එන්.වී. සමන් මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

## 9. කාරක සභා වාර්තා

## 9.1 ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම

අන්නාසිගලහේන අතුරු මාර්ග J.C.B. යන්ත්‍රයක් යොදා සංවර්ධනය කිරීම - රු. 37500.00
මහුරුගොඩමුල්ල නාගොඩ ඉහළ මාර්ගය සඳහා සිළිංඩර යෙදීම - රු. 12500.00
අමුන්දර ගෝණදෙනිය මාර්ගය J.C.B. යන්ත්‍රයක් හා කොරිපස් යොදා සංවර්ධනය කිරීම - රු. 50000.00
උඩුගම උප කාර්යාල ගොඩනැගිල්ලේ වහළ අළුත්වැඩියා කිරීම දළ ඇස්තමේන්තුව - රු.1000000.00
Conferance System එක අළුත්වැඩියා කිරීම සඳහා දළ ඇස්තමේන්තුව - රු. 24000.00

**මන්ත්‍රී ප්‍රතිපාදන**

ගරු දකුණු පළාත් සභා මන්ත්‍රී සුමනසිරි ලියනගේ මැතිතුමා
ගෝණදෙනිය හඟරන්වල කොට්ඨාසයේ දිසානායක මාවත J.C.B. යන්ත්‍රයක් යොදා සංවර්ධනය කිරීම - රු. 30000.00
ගෝණදෙනිය හඟරන්වල කොට්ඨාසයේ දික්දොළ 13 මාවත J.C.B. යන්ත්‍රයක් යොදා සංවර්ධනය කිරීම - රු. 17500.00
ගෝණදෙනිය හඟරන්වල කොට්ඨාසයේ හිරිකුඹුරවත්ත පාසල් ගොඩකන්ද මාර්ගය J.C.B. යන්ත්‍රයක් යොදා සංවර්ධනය කිරීම - රු. 15000.00
ගෝණදෙනිය හඟරන්වල කොට්ඨාසයේ 50 කන්ද මාර්ගය J.C.B. යන්ත්‍රයක් යොදා සංවර්ධනය කිරීම - රු. 37500.00
උඩුගම මධ්‍යම මිනිරන්වල කන්ද මාර්ගය J.C.B. යන්ත්‍රයක් යොදා සංවර්ධනය කිරීම - රු. 30000.00

**ඉහත ඇස්තමේන්තු ගරු උප සභාපතිතුමා විසින් යෝජනා කල අතර ගරු මන්ත්‍රී වෙරංග ලක්මාල් මහතා විසින් ස්ථිර කරන ලදී.**

## 9.2 මිළ ගණන් ඉදිරිපත් කිරීම

**මාපලගම ආයුර්වේදය හා පුස්තකාලයේ ජල සැපයුම සනීපාරක්ෂක වැසිකිලි පද්ධතිය ස්ථාපනය කිරීම සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය සහා ලැබී ඇති මිළ ගණන්**

| විස්තරය | විජේරත්න හාඩ්වෙයාර්, නියාගම රු. | දයානි ට්‍රේඩ් සෙන්ටර්, මාපලගම රු. | චාමින් හාඩ්වෙයාර්, තල්ගස්වල රු. |
|---|---|---|---|
| wall tile 8x12 | 95.00 | 85.00 | 95.00 |
| wall tile 12x12 | 190.00 | 190.00 | 160.00 |
| wall tile 6x6 | | | 40.00 |
| Floor tile 12x12 | 170.00 | 160.00 | 160.00 |

| | | | |
|---|---|---|---|
| Tile groute | 160.00 | 150.00 | 150.00 |
| Cement bag | 980.00 | 960.00 | 960.00 |
| Sand ( කියුබ් 01) | 14000.00 | | 13500.00 |
| ¾ Metal ( කියුබ් 01) | 8000.00 | | 7500.00 |
| 1 Metal (කිය්බ් 01) | 8000.00 | | 7500.00 |
| Pedestal type wash basin | 7200.00 | 7000.00 | 4900.00 |
| Pillor tap | 1200.00 | 1200.00 | 690.00 |
| ½ angle valve | 750.00 | 750.00 | 395.00 |
| Waste play | 850.00 | 350.00 | 675.00 |
| Pedestral type closet with low level glazed earthern ware flushing cisten | 7000.00 | 7000.00 | 2400.00 |
| ½ stop cock | 165.00 | 155.00 | 950.00 |
| 450mm Flexible hose | 300.00 | 250.00 | 350.00 |
| 600mm Flexible hose | 1900.00 | | 450.00 |
| Bidet shower | 1975.00 | 1850.00 | 990.00 |
| 18 $^{11}$x24$^{11}$ bath room type ovel shape mirror | 3500.00 | 3200.00 | 3500.00 |
| Rowl plugs | | | 4.50 |
| Concrete nails | | | 40.00 |
| Stainless steel kitchen Sink | 4000.00 | 3850.00 | 2375.00 |
| Sawn nect tap | 1500.00 | 1300.00 | 690.00 |
| 150 x 150 mm gully box with cover | 720.00 | 1600.00 | 890.00 |
| 150 X 150mm gully cover | 360.00 | 350.00 | 690.00 |
| මැටි ගඩොල් | 32.00 | 30.00 | 18.50 |
| Skim coat | 700.00 | 650.00 | 600.00 |
| Wall filler | 1000.00 | 1040.00 | 900.00 |
| Emulsion paint | 960.00 | 760.00 | 950.00 |
| රතු කුඩු | 700.00 | 600.00 | 650.00 |
| කලු කුඩු | 750.00 | 750.00 | 650.00 |
| 8x4 ply wood sheet | 2650.00 | 2250.00 | 2350.00 |
| 10mm දෘඩ වානේ | 630.00 | 585.00 | 540.00 |
| 6 mm මෘදු වානේ | | 175.00 | 180.00 |
| Binding wire | 240.00 | 220.00 | 240.00 |
| Type 1000 ½ PVC pipe (20mm) | 165.00 | 150.00 | 165.00 |
| Type 1000 ¾ PVC pipe (25mm) | 515.00 | 495.00 | 470.00 |

| | | | |
|---|---|---|---|
| Type 600 1 PVC pipe (30mm) | 280.00 | 260.00 | 245.00 |
| Type 600 1 ¼ PVC pipe (40mm) | 1000.00 | 980.00 | 795.00 |
| Type 600 1 ½ PVC pipe (50mm) | 1100.00 | 1060.00 | 950.00 |
| 1 stop cock | | | 275.00 |
| Solvent cement | 785.00 | 635.00 | 695.00 |
| Thread seel packet | | 500.00 | 300.00 |
| ½ plane socket | 35.00 | 30.00 | 20.00 |
| 1 plane socket | 60.00 | 50.00 | 45.00 |
| ¾ plane socket | 40.00 | 35.00 | 35.00 |
| ½ valve socket | 35.00 | 30.00 | 30.00 |
| ½ forest socket | 35.00 | 30.00 | 30.00 |
| 1 valve socket | 60.00 | 50.00 | 50.00 |
| 1 forest socket` | 60.00 | 50.00 | 50.00 |
| ½ L bow | 35.00 | 30.00 | 25.00 |
| ½ tee | 35.00 | 30.00 | 30.00 |
| ¾ L bow | 60.00 | 50.00 | 40.00 |
| ¾ tee | 60.00 | 50.00 | 50.00 |
| 1 L bow | 60.00 | 50.00 | 50.00 |
| 1 tee | 85.00 | 80.00 | 75.00 |
| 40mm L bow | 110.00 | 100.00 | 95.00 |
| 50mm L bow | 150.00 | 150.00 | 150.00 |
| 40mm tee | 130.00 | 130.00 | 130.00 |
| 50mm tee | 230.00 | 220.00 | 210.00 |
| 20mm PVC clip | 18.50 | 15.00 | 12.50 |
| 20mm PVC clip | 20.00 | 17.00 | 17.50 |
| 20mm PVC clip | 22.00 | 20.00 | 18.50 |
| පොලිතින් | | | 340.00 |
| ½ සෘජුෆෝම් ශීට් | | | 180.00 |
| 1 සෘජුෆෝම් ශීට් | | | 360.00 |

**හාඩ් වෙයා භාණ්ඩ සඳහා අඩුම මිළ ගණන් ඉදිරිපත් වී ඇත්තේ මාපලගම දයානි ට්‍රේඩ් සෙන්ටර්, හා චාමීන් හාඩ්වෙයාර්, තල්ගස්වල වෙතිනි. ඒ අනුව අඩුම මිළ සළකා බලා එක් එක් අයිතමය එම ආයතන දෙකෙන් මිළදී ගැනීමට ටෙන්ඩර් කමිටුව තීරණය කරන ලදී. එම යෝජනාව ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

## 10. ලැබීම් හා ගෙවීම් වාර්තා

## 11. 2019 අයවැය ඉදිරිපත් කිරීම

### ගරු සභාපතිතුමාගේ අයවැය පණිවිඩය

මිනිසාගේ පරම යුතුකම හා විශිෂ්ඨ කාර්යභාර්ය විය යුත්තේ ස්වකීය ජන සමාජ විෂයෙහි හැකි උපරිමයෙන් සේවා සම්පාදනය කරවීමයි.නානාවිධ අපේක්ෂා පෙරදැරිව සිය ජීවිතය පවත්වා ගෙන යාම සඳහා වෙර දරන මානව වර්ගයා විෂයෙහි පොදු උපයෝගීතා සේවාවන් වෙනුවෙන් පුරෝගාමී මෙහෙවරක් ඉටුකරන රාජ්‍ය ආයතනයක් වශයෙන් ප්‍රාදේශීය සභාව ජනගතව තිබේ. ඒ අනුව ප්‍රාදේශීය පාලන තන්ත්‍රය විධිමත්ව දිශානුගත කරවීම ආයතනයේ සභාපති වන මාගේත් සෙසු සියලු දෙනාගේත් පරම අභිලාශයක් බව තේරුම් ගෙන ඇති බැවින් එකී යාන්ත්‍රණයේ මූල්‍ය සාධකය වන 2019 අයවැය එළි දැක්වීම වෙනුවෙන් ශුභ පැතුම් පණිවිඩයක් ඉදිරිපත් කිරීමට ලැබීම පිළිබඳව අතිශයින් සොම්නස් වෙමි.

නාගොඩ ප්‍රාදේශීය සභා වංශ කතාවේ නවතම පරිච්ජේදයක් ඇරඹෙන්නේ අවසන් වරට පැවති පළාත් පාලන මැතිවරණයෙන් ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ ජයග්‍රහණය කිරීමෙන් අනතුරුව එහි බලය පිහිටුවීමත් සමගිනි. ලාංකීය දේශපාලනයේ විවිධ වෙනස්කම් රැසක් සිදුවෙමින් පැවති යුගයක ස්වකීය පාලන බලය හිමිකරගත් අප කණ්ඩායමටද එකී පරස්පරතාවන් නිසා මතුවන ගැටලු හා අභියෝග අතික්‍රමණය තුළින් ඉදිරියට යාමට සිදුව තිබේ. ප්‍රාදේශීය සභාව සතු සීමිත මූල්‍යමය වත්කම් හා සේවාවන්හි ඌණතා ඇතත් එකී බාධක මැඩ පවත්වමින් සිය බල ප්‍රදේශයේ ජනතා අපේක්ෂාවන් රැසක් ඉටු කිරීමට පසුගිය කාලය තුළ අපට හැකිවීම ජයග්‍රාහී පියවරක මංසලකුණක් සේ සටහන් කරමි.

මිනිසාගේ තිඹිරි ගෘහයේ පටන් මහ පොළවෙහි හතර රියනක උරුමය දක්වා යන ගමනේදි මැදිහත්ව කටයුතු කිරීම මහජන ආයතනයක් වශයෙන් අප සතුව පවතින වගකීමක් බැවින් එකී සියළු මැදිහත්වීම් වලදී පුරෝගාමී සේවාවක් අපගෙන් ඉටුවිය යුතුය යන්න මාගේ ඒකායන විශ්වාසයයි.

ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ක්‍රියාත්මකව පවතින විවිධ සේවාවන් හා මහජන අවශ්‍යතාවයන් පිළිබඳව අවධානය යොමු කිරීමේදී ඇතැම් අංශයන්හි දක්නට ලැබුණු මන්දගාමී ස්වභාවය මගහරවමින් ඒවා සක්‍රිය තත්වයක් කරා යොමු කරවීමට පසුගිය කෙටි කාලය තුළ සභාවට හැකිවීම අප සියළු දෙනාගේ උත්සාහයේ සහ කැපවීමේ ප්‍රතිඵලයක් වශයෙන් සටහන් කරමි. අසීමිත මහජන අවශ්‍යතාවයන් සපුරා දීමේදී සීමිත සම්පත් විධිමත් කළමනාකරණයකින් යුතුව යොදවමින් යම් ප්‍රගතියක් කරා යන්නට දැරූ උත්සාහය බාහිරට දැනෙන තරම් නොවූවත් අත්කරගත් ප්‍රගතිය අගය කළ යුතුව තිබේ.

ප්‍රදේශයේ අඛණ්ඩව එකතුවන කැළි කසල ප්‍රතිචක්‍රීකරණය සඳහා උඩුගම ඇප්තොප් වත්තේ පිහිටුවා ඇති එකී ව්‍යාපෘතිය තවදුරටත් සංවර්ධනය කර විධිමත් කරවීම සඳහා රුපියල් ලක්ෂ 06 ක පමණ මුදලක් යෙදවීම පරිසර හිතකාමී වටපිටාවක් ප්‍රදේශයට උරුම කරදීම උදෙසා දරන ලද මූල්‍යමය වියදම අදාල ගැටළුවට මුහුණ දීඇති සියළු දෙනාටම යම් අස්වැසිල්ලක් වනු ඇත . ඊට අමතරව තල්ගස්වල සතිපොල නවීකරණය කරවීම, උඩුගම සතිපොල නවීකරණය සඳහා ලක්ෂ 15 කට අධික මුදලක් වෙන් කරදීම ප්‍රාදේශීය සභාව නියෝජනය කරන ඒ ඒ කොට්ඨාශයන්හි මහජන සභිකයින් සඳහා කොට්ඨාශ සංවර්ධනයට ලක්ෂ 15 ක පමණ මුදලක් නිදහස් කර දීම, මාර්ගස්ථ විදුලි පහන් අළුත්වැඩියාවට හා අළුතින් සවි කිරීමට අවශ්‍ය සේවා සම්පාදනය කරවීම, ග්‍රාමීය මට්ටමේ අතුරු මාර්ග පිලිසකර කරවීම ආදී වැඩ කොටස් රාශියක් පසුගිය කෙටි කාලය තුළ අප විසින් ඉටු කර ඇති අතර ඉදිරියේදී ක්‍රියාත්මක කරවීමට යෝජිත සංවර්ධන ව්‍යාපෘති රැසක්ද සැලසුම් කර ඇත .

දීර්ඝ කාලයක සිට ප්‍රදේශයට අඩුවක්ව පවතින ආදාහනාගාරයක් ඉදිකරවීමට අවශ්‍ය මූලික කටයුතු සිදු කර ඇති අතර නුදුරේදීම එහි වැඩ ආරම්භ කිරීමට අපේක්ෂා කරමි. එමෙන්ම දැනට පවතින ප්‍රාදේශීය සභා ප්‍රධාන ගොඩනැගිලි සංකීර්ණය දෙමහල් කර ඉදිකරවීමටද සැලසුම් සකස්කර ඇති බව දන්වනු කැමැත්තෙමි.මේ වන විට ප්‍රධාන පුස්තකාලය රු ලක්ෂ 10 ක වියදමින් නවීකරණය කිරීමද.උඩුගම උප කාර්යාලයේ රු ලක්ෂ 13 ක වියදමින් වැසිකිළි පද්ධතියක ඉදි කිරීමද සිදු වෙමින් පවතී. ප්‍රදේශයේ ආර්ථික සංවර්ධනයට හේතුවන පාරිභෝගික අවශ්‍යතාවයන්ට සරිලන දියුණු වෙළද පොළක අවශ්‍යතාවය සපුරනු වස් වෙළද සංකීර්ණ දෙකක් තල්ගස්වල හා උඩුගම  නගර ආශ්‍රිතව අලුතින් ඉදි කිරීමටද අපේක්ෂිතය.

මෙම සියළු සංවර්ධන යෝජනා  ක්‍රියාවට නැංවීම සඳහා මෙන්ම මහජන උපයෝගීතාවන් වෙනුවෙන් මූල්‍ය සම්පාදනය සඳහා වන විශේෂ මූල්‍ය මූලාශ්‍ර විෂයෙහි අවධානය යොමු කර ඇති අතර පාර්ලිමේන්තු පළාත් සභා ප්‍රතිපාදන මෙන්ම විශේෂ පරිත්‍යාග මගින් ආදායම් මාර්ගය වර්ධනය කර ගැනීමටද අපේක්ෂා කරමි.

මෙවර පළාත් පාලන මැතිවරණයේදී පැවති ඡන්ද ක්‍රමයට වෙනස් වූ ඡන්ද කොට්ඨාශ ක්‍රමයට විමසීම නිසා පෙර පැවති සභික  සංඛ්‍යාව වූ 13- 27 දක්වා වැඩි වීම සතුටට කරුණක් වුවද සම්පත් බෙදා දීමේදී නොයෙකුත් ගැටළු වලට මුහුණ දීමට සිදුව තිබේ. පාලක පක්ෂය වන ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ මන්ත්‍රී 15 ,එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රී 07 ,ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රී 03 ,ජනතා විමුක්ති පෙරමුනේ මන්ත්‍රී 01, එක්සත් ජාතික නිදහස් පෙරමුනේ මන්ත්‍රී 01 සමග සහයෝගයෙන් සහ සුහදශීලීව කටයුතු කිරීමට ලැබීම මා ලද භාග්‍යයකි ඒ අතර හිටපු සභාපතිවරු දෙදෙනකු වන අජිත් එඩේර ආරච්චි සහ චන්ද්‍ර සහබන්දු මන්ත්‍රීතුමන්ලා සිටීමද විශේෂත්වයකි . කාන්තා මන්ත්‍රීවරියන් 07 දෙනෙකු ප්‍රාදේශීය සභා ඉතිහාසයේ ප්‍රථම වරට මෙම සභාව නියෝජනය කිරීම ප්‍රදේශයේ කාන්තා පාර්ශවය ලැබූ ජයග්‍රහනයක් යැයි මා සිතමි. මෙවැනි ප්‍රාදේශීය සභාවක් තුල මාහට විශාල ධෛර්යයක් වෙමින් මා දිරි ගන්වමින් නායකත්වය සපයමින් කටයුතු

කරන දකුණු පලාත් සභා නියෝජ්‍ය සභාපති සම්පත් අතුකෝරල මහතා හා ගරු මන්ත්‍රී ඉසුරු දොඩන්ගොඩ සිහි කරනුයේ ඉතා සතුටිනි .විශේෂයෙන් දකුණු පළාත් සභාව අපට දක්වන අනුග්‍රහය නොමැති නම් අපට ඉදිරියට යෑමට කිසිසේත්ම නොහැකිය. එහෙයින් දකුණු පළාත් සභාවේ නායකත්වය ගරු ප්‍රධාන අමාත්‍ය ශාන් විජයලාල්ද සිල්වා මැතිතුමා ප්‍රමුඛ පූජ්‍ය බද්දේගම සමිත හිමි යූ.පී.ඩී ආරියතිලක ඇමතිතුමා, සභා නායක චම්ලි විතානාච්චි , සිසිර කුමාර රත්න, දුල්ෂාන් කාරියවසම් ,ඒ.පී.ඩී පියසිරි, චන්න සාලිය මෙන්ඩිස් ,පද්මසිරි ද සිල්වා, සම්මු ආරියවංශ ,ක්‍රිශාන්ත පුෂ්පකුමාර ,චානක මාදුගොඩ ,සුමනසිරි ලියනගේ, නලින් හේවගේ, සුනිල් සේනානායක ඇතුළු සියලු දෙනාගෙන් ලැබුනු සහය අතිවිශාලය. එමෙන්ම හිටපු ප්‍රාදේශීය සභා සභාපති වත්මන් වරාය හා නාවුක කටයුතු නියෝජ්‍ය අමාත්‍ය නිශාන්ත මුතුහෙට්ටිගම මැතිතුමාගේ ආශීර්වාදයද මා ගෞරවයෙන් සිහිපත් කරන අතර හිටපු ගරු අමාත්‍ය පියසේන ගමගේ මැතිතුමාද හිටපු ගරු අමාත්‍ය ගයන්ත කරුණාතිලක මැතිතුමාද සිහිපත් කිරීම මාගේ යුතුකමක් සේ සලකමි. එමෙන්ම මාගේ සියලු දේශපාලන කටයුතු වලදී මෙන්ම දිස්ත්‍රික්කයටම නායකත්වය දෙමින් කටයුතු කරන ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ ගාලු දිස්ත්‍රික් නායක පාර්ලිමේන්තු මන්ත්‍රී වෛද්‍ය ගරු රමේෂ් පතිරණ මැතිතුමා සහ පාර්ලිමේන්තු මන්ත්‍රී නීතිඥ මොහාන් පී ද සිල්වා මැතිතුමන්ලා ගෞරවයෙන් සිහිපත් කරමි.

විශේෂයෙන් සභාවේ කටයුතු සහ අවශ්‍යතාවයන් නිසියාකාරව ඉටු කිරීමට නිරන්තරව උපදෙස් දෙමින් කටයුතු කරන දකුණු පළාත් පාලන කොමසාරිස් රනිල් වික්‍රමසේකර මැතිතුමා සහ සහකාර පළාත් පාලන කොමසාරිස් එරංදි උමංගා මෙන්දිස් මැතිනියද දක්වන සහාය අගය කරනු කැමැත්තෙමි.

මේ සියළුම කර්තව්‍යයන් වලදී මා හට හොද ශක්තියක් වෙමින් මා දිරිමත් කරන ගරු උපසභාපති ගාමිණී සුසන්ත මැතිතුමා ඇතුළු සමස්ථ මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රතුමියන්ලා දෙන සහය මහත් සේ අගය කරමි .මෙම අයවැය ලේඛනය සකස් කිරීමට කාලය ,ශ්‍රමය වැය කරමින් දැක් වූ සහයට ලේකම්තුමිය ඇතුළු සමස්ථ කාර්ය මණ්ඩලයට ස්තුතිය පුදකරමින් අයවැය ශුභාශිංසනය නිමා කරමි.

ඔබ සැමට 2019 වසර සුභ නව වසරක් වේවා !...

නිමල් වික්ටර් නාගොඩ විතාන

සභාපති,
නාගොඩ ප්‍රාදේශීය සභාව.

**ගරු සභාපතිතුමා**

අයවැය ලේඛනයේ නම් සඳහන් කිරීමේදී, අතපසුවීමකින් නම් සඳහන් නොවූ අපේ මන්ත්‍රීතුමන්ලා කීප දෙනෙකුගේ නම් ඇතුළත් කර ඒ සිදුවූ අඩුපාඩුව මගහරවා ගන්න කටයුතු සලස්වා ගත්තා. ඒ අනුව එම නිවැරදි කිරීම සියලුම ගරු මන්ත්‍රීවරුන්ට ලබා දී ඇති. එම නිසා මම නැවතත් එය ඉදිරිපත් කරන්නම්. ගරු දකුණු පළාත් ප්‍රධාන අමාත්‍ය ශාන් විජයලාල් ද සිල්වා මැතිතුමා, ප්‍රමුඛ පූජ්‍ය බද්දේගම සමිත හිමි, ආරියතිලක මැතිතුමා, සභානායක චම්ලි විතානාච්චි මැතිතුමා, සිසිර කුමාරරත්න මැතිතුමා, දූෂාන් කාරියවසම් මැතිතුමා, ඒ.ජී.ඩී. පියසිරි මැතිතුමා, චන්න සාලිය මෙන්ඩිස් මැතිතුමා, පද්මසිරි ද සිල්වා මැතිතුමා, ශම්මු ආරියවංශ මැතිතුමා, ක්‍රිෂාන්ත පුෂ්පකුමාර මැතිතුමා, චානක  මාදුගොඩ මැතිතුමා, සුමනසිරි ලියනගේ මැතිතුමා, නලීන් හේවගේ මැතිතුමා, සුනිල් සේනානායක මැතිතුමා, ඇතුළු සියලු මන්ත්‍රීතුමන්ලාගෙන් ලැබුණු සහය අති විශාලයි. එමෙන්ම හිටපු ප්‍රාදේශීය සභා සභාපති, වත්මන් වරාය හා නාවික කටයුතු නියෝජ්‍ය අමාත්‍ය නිශාන්ත මුතුහෙට්ටිගම මැතිතුමාගේ ආශිර්වාදයද මා ගෞරවයෙන් සිහිපත් කරන අතර, හිටපු ගරු අමාත්‍ය පියසේන ගමගේ මැතිතුමා ද ,හිටපු ගරු අමාත්‍ය ගයන්ත කරුණාතිලක මැතිතුමා ද, සිහිපත් කිරීම මගේ යුතුකමක් සේ සලකමි. ඒ වගේම මා නියෝජනය කරන නාගොඩ බල ප්‍රෙද්ශයේ මට ප්‍රථම නියෝජනය කරමින් ප්‍රාදේශීය සභා සභාපතිව කටයුතු කල වර්තමානයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වන විජේපාල හෙට්ටිආරච්චි මැතිතුමාද සිහිපත් කරන අතර, මගේ දේශපාලන කටයුතුවලදී මෙන්ම දිස්ත්‍රික්කයටම නායකත්වය දෙමින් කටයුතු කරන ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ ගාලු දිස්ත්‍රික් නායක, පාර්ලිමේන්තු මන්ත්‍රී වෛද්‍ය රමේෂ් පතිරණ මහතා, පාර්ලිමේන්තු මන්ත්‍රී මොහාන් පී ද සිල්වා මහතා ගෞරවයෙන් සිහිපත් කරමි. ඒ අයුරින් තමයි නිවැරදි කිරීම. මොකද මටත් අමතක වුනා, අතපසු වුණා. මොකද ගයන්ත කරුණාතිලක මැතිතුමා අපට විශේෂ අනුග්‍රාහකත්වයක් දැක්වූවා. ආදාහනාගාරය සඳහා ඉඩම් ලබාගැනීමේදී එතුමා ඉඩම් අමාත්‍යතුමා ලෙස අපි ගිහින් ඉල්ලුම් කලාම එතුමා ඉඩම් ලබා දීමට කටයුතු කරන්න විශේෂ අනුග්‍රහයක් ලබා දුන්නා. ඒක නිසා ඒ අතපසුවීමක් සිදු වුනේ. ඊළඟට සුමනසිරි ලියනගේ මන්ත්‍රීතුමා නලීන් හේවගේ මන්ත්‍රීතුමා අපේ සභාවේ කටයුතුවලට සභාවට ප්‍රතිපාදනය එවල තියෙනවා. ඇත්තටම මම පළමුවෙන්ම කනගාටු වෙනවා. මගේ අතපසුවීමක්. ඒ නම් සඳහන් නොකිරීම පිළිබඳ. ඉතින් ඒක නිසා සභාව කල් තියලා ඒ නිවැරදි කිරීම කළා. ඒ නිවැරදි කිරීම ක්ෂණිකව කරල දීපු එක ගැනත් මම සතුටු වෙනවා.

**ගරු උප සභාපතිතුමා**

ගරු සභාපතිතුමනි, ගරු මන්ත්‍රීවරුනි මම මේ අවස්ථාවේ නැගී සිටියේ 2019 අයවැය ලේඛනය සම්මත කරන්න මම මේ අවස්ථාවේ යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා**

ගරු සභාපතිතුමනි, උප සභාපතිතුමා විසින් 2019 අයවැය යෝජනා කළා. එම යෝජනාව ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා**

අද දින නාගොඩ ප්‍රාදේශීය සභාවේ ගෙනෙන ලද 2019 අයවැය යෝජනාවට පක්ෂ විය නොහැකි බැවින් විපක්ෂ වන බව මම මේ ගරු සභාවට යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී නිශාන්ත නන්දන මහතා**

අයවැය යෝජනාවට විපක්ෂව ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා විසින් ගෙනෙන ලද යෝජනාව මම ස්ථිර කරනවා.

ගරු සභාපතිතුමා නැවත වරක් සභාව අමතා ප්‍රකාශ කර සිටියේ මේකට දැන් විරෝධතාවයක් තියෙනවා. අයවැයට පක්ෂව යෝජනාවක් හා විපක්ෂව යෝජනාවක් තියෙනවා. ඒ නිසා අයවැය සම්මත වීම සඳහා බෙදීමක් අවශ්‍යයි. ඒ සඳහා ඡන්දයක් විමසිය යුතුයි. එහෙමනම් අත උස්සා ඡන්දය ප්‍රකාශ කරන්න යනුවෙන් දන්වන ලදී. ඒ අනුව ඡන්දය විමසූ විට, අයවැයට පක්ෂව ඡන්ද පහළොවක් හා අයවැයට විපක්ෂව ඡන්ද දහයක් ද, ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටි සංඛ්‍යාව එකක්ද විය. **ඒ අනුව වැඩි ඡන්ද 5කින් 2019 අයවැය නාගොඩ ප්‍රාදේශීය සභාවේ සභා සම්මත විය.**

**අයවැයට පක්ෂව ඡන්දය ලබා දුන් මන්ත්‍රීවරුන්**

1. ගරු සභාපති නිමල් වික්ටර් නාගොඩවිතාන මහතා
2. ගරු උප සභාපති එම්.කේ. ගාමිණී සුසන්ත මහතා
3. ගරු මන්ත්‍රී එච්.කේ.ලක්රුවන් සම්පත් මහතා
4. ගරු මන්ත්‍රී එන්.ජී. ගයාන් මධුසංඛ මහතා
5. ගරු මන්ත්‍රී ධර්මසිරි ගනේවත්ත මහතා
6. ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා
7. ගරු මන්ත්‍රිනී සුභාෂි මධුමාලි ඒකනායක මෙනවිය
8. ගරු මන්ත්‍රී එඩේරආරච්චි වෙරංග ලක්මාල් මහතා
9. ගරු මන්ත්‍රී නාපෙ විතානගේ සමන් මහතා
10. ගරු මන්ත්‍රී සී. වනිගරත්න මහතා
11. ගරු මන්ත්‍රී විලේගේ අමර ධනංජය මහතා
12. ගරු මන්ත්‍රිනී ප්‍රියන්තා ගුණසේකර මහත්මිය
13. ගරු මන්ත්‍රී එම්.එම්.දිසානායක මහතා
14. ගරු මන්ත්‍රී එන්.ඩබ්. පතිනායක මහතා
15. ගරු මන්ත්‍රී විජිත් වීරගුණරත්න සහබන්දු මහතා

**අයවැයට විපක්ෂව ඡන්දය ලබා දුන් මන්ත්‍රීවරුන්**

1. ගරු මන්ත්‍රී ඩබ්. ජී. නිශාන්ත මහතා
2. ගරු මන්ත්‍රී සී.වී. සහබන්දු මහතා
3. ගරු මන්ත්‍රී එච්.ජී. තරංග සුදර්ශන මහතා
4. ගරු මන්ත්‍රී කුමාරගේ වසන්ත මහතා
5. ගරු මන්ත්‍රිනී කේ.කේ.අයි.නෙරංජලී මහත්මිය
6. ගරු මන්ත්‍රිනී කේ.ඒ.සී. දිල්රුක්ෂි මහත්මිය

7. ගරු මන්ත්‍රිනී එච්.එච්. ගයන්ති කුමාරි මහත්මිය
8. ගරු මන්ත්‍රිනී ඩබ්. කේ. නෙලී මහත්මිය
9. ගරු මන්ත්‍රිනී වී.ජී.අරුණ ශාන්ති මහත්මිය
10. ගරු මන්ත්‍රී පී.ජී. රංජිත් ජයවීර මහතා

**අයවැයට ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වැලකී සිටි මන්ත්‍රීවරුන්**

1. ගරු මන්ත්‍රී බන්දුල සමන්ත හිරිමුතුගොඩ මහතා

**මහා සභා රැස්වීමට සහභාගී නොවූ මන්ත්‍රීවරුන්**

1. ගරු මන්ත්‍රී අජිත් එඩේරආරච්චි මහතා

**වෙනත් කරුණු :-**

**ගරු මන්ත්‍රී අමර ධනංජය විලේගේ මහතා**

ගරු සභාපතිතුමාගෙන් අවසරයි. විශේෂයෙන්ම මම කතාකරන්න ඕන. මුලින්ම අයවැයට විරුද්ධව අදහස් ඉදිරිපත් කළ අපේ චන්ද්‍ර සහබන්දු හිටපු සභාපති තුමා කොට්ඨාස පහළොවේ ඔවුන්ට නොලැබෙන වරප්‍රසාද ගැන කතා කළා. නාගොඩ ප්‍රාදේශීය සභාවේ පවත්වපු පසුගිය පළාත් පාලන මැතිවරණයේ දී ඡන්ද ක්‍රමය අනුව කොට්ඨාස පහළවකට බෙදුණා. මේ කොට්ඨාස 15කට බෙදුනම, ඒ ජනතාව තීරණය කළා තමන්ගෙ කොට්ඨාසයක තෝරාගන්න නියෝජිතය කවුද කියලා. ඒ කියන්නේ තමන්ගේ ප්‍රදේශයේ සිදුවන සංවර්ධන කටයුත්ත එහෙම නැත්නම් තමන්ගේ කොට්ඨාසයේ ප්‍රාදේශීය සභාවෙන් යම්කිසි කාර්යයක් වෙනවද? ඒ සඳහා අවශ්‍ය කවුද කියන එක තෝරගත්තෙ ජනතාව. ඉතාමත් සතුටින් කියනවා. නාගොඩ ප්‍රාදේශීය සභාවේ සියලුම කොට්ඨාසවලට නියෝජිතයින් විදියට තෝර ගත්තෙ පොදුජන පෙරමුණේ නියෝජිතයන්. එතකොට අපට නැහැ. පක්ෂයට නැහැ. අපට කුඩම්මගෙ සැලකිලි. අපට ලයිට් එක නැහැ කියලා කියන්න බැහැ. ජනතාව තමන්ගේ ප්‍රදේශයේ නියෝජිතයා විදියට තෝරා ගෙන තියෙන්නේ පුද්ගලයන්ට තමයි ප්‍රාදේශීය සභාවෙන් සිදුකරන කාර්යය සිද්ධ කිරීමට වැඩි අයිතිය තියෙන්නේ. එතකොට මම එතුමාට යෝජනා කරනවා. තමන්ගේ පක්ෂයට නැහැ කියන ඉල්ලීම කරන්න බැහැ. ඒක අසාධාරණයි. මොකද පක්ෂ දේශපාලනය ඉවත් කරන්න තමයි එතුමන්ගේ ආණ්ඩුවෙන් මේ මැතිවරණ ක්‍රමය ගෙනාවෙ. මම හිතන්නේ ලයිට් එක දෙන්න, පාර හදන්න ප්‍රතිපාදන දෙන්න වැඩිම අයිතිය තියෙන්නේ ඒ කොට්ඨාශයෙන් පත්වෙච්ච මන්ත්‍රීවරයාට. එක්සත් ජාතික පක්ෂයෙන්, ජනතා විමුක්ති පෙරමුණෙන් පත්වෙලා තිබුන නම් ඔවුන්ට අවස්ථාව දෙන එක ඔබතුමාගේ යුතුකමක්. නමුත් එහෙම දෙයක් වෙලා නැහැ. නාගොඩ ප්‍රාදේශීය සභාවේ පත්වෙලා තියෙන්නේ පොදුජන පෙරමුණෙන්. ඒ නිසා අපි එක කල්ලියකට ගොණු කරන්න එපා. අපිව තෝරගෙන තියෙන්නේ ජනතාව. අපි මෙතැනට ඇවිල්ලා තියෙන්නේ ඡන්දෙන් . අපි පක්ෂයෙන් තෝරපු පිරිසක් නෙවෙයි. එම නිසා මම එතුමන්ලට කියනවා. එතුමන්ලගෙ පක්ෂ මැති ඇමතිවරුන්ගෙන් සල්ලි අරගෙන ඇවිල්ලා එතුමන්ලගෙ සංවර්ධන කටයුතු කරන්න. කිසිම ගැටළුවක් නැහැ. ප්‍රාදේශීය සභාව හරහා කෙරෙන කටයුතු අපි හරහා කරන්න කියලා මම මුලින්ම යෝජනා කරනවා. ඒ වගේම මේ වෙනකොට දැවැන්ත සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක වුණු දේවල් නැවතිලා කියන චෝදනාව කළා. මම කියන්නම්

මේ වෙනකොට සංවර්ධනය නවතින්න හේතුව වෙලා තියෙන්නේ ජනාධිපතිතුමා අවස්ථානුකූලව අගමැතිවරයෙක් පත් කළා. විශේෂයෙන්ම එක්සත් ජාතික පක්ෂය හා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය කියන රාජ්‍ය යාන්ත්‍රණය හැදිල තිබුන මේ හවුල් ආණ්ඩුව ඉවත් වීමත් එක්ක කැබිනට් මණ්ඩලය විසිරිලා ගියා. ඒ අනුව හිටපු අගමැති සහ ඇමති මණ්ඩලය අහෝසි වුණා. ඒක ව්‍යවස්ථානුකූලව සිදු වුණේ. ඊට පස්සෙ ජනාධිපතිවරයාට, තමන්ට කැමති කෙනෙක් අගමැතිවරයා ලෙස පත් කරන්න බලය තියෙනවා. පාර්ලිමේන්තුවේ බහුතරය ඇතැයි ජනාධිපතිවරයා සිතන ඕනෑම කෙනෙක් ජනාධිපතිවරයාට පත් කිරීමේ හැකියාව තියෙනවා. ඒ තත්ත්වය උඩ තමයි මහින්ද රාජපක්ෂ මැතිතුමා අගමැති ලෙස පත් කළේ. අගමැති විදිහට පත් කරලා එතුමා පත් වෙලා සති දෙකක් ඇතුළත ජනතාවට සහන රැසක්, බදුසහන, පොහොර සහන, ඉන්ධන සහන ඇතුළු දැවැන්ත සහන රාශියක් මේ රටට ජනතාවට ලබා දුන්නා. නමුත් ඒ සියල්ල අඩපණ කළේ එක්සත් ජාතික පක්ෂය, ජනතා විමුක්ති පෙරමුණ, ද්‍රවිඩ සන්ධානය එකතුවෙලා ගහපු ඒ හවුල් ගිවිසුමත් එක්ක. ඔවුන් ශ්‍රේෂ්ඨාධිකරණයට ගිහිල්ලා ගත්ත තීරණයත් එක්ක. මේ රට මේ තත්වයට පත් කළේ එක්සත් ජාතික පක්ෂය ජනතා විමුක්ති පෙරමුණ ද්‍රවිඩ සන්ධානය කියන තුන් හවුලෙහි කියන එක මම සිහිපත් කරන්න ඕන .මොකද වැරැදිම සමාජගත කරන එකට අපි එකහෙලාම විරුද්ධයි කියන එක මම මේ වෙලාවේ ප්‍රකාශ කරනවා. අගාධයක, අස්ථාවරත්වයක තියෙනවද ඒ සඳහා වගකිව යුත්තේ එක්සත් ජාතික පක්ෂය ජනතා විමුක්ති පෙරමුණ ද්‍රවිඩ සංධානය කියන එක මම මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනවා මම හිතන්නේ අද හෝ හෙට තීන්දුව ලැබේවි. නැවතත් මම ඉල්ලා සිටින්නේ මේ රට ස්ථාවර කරන්න ජනතාවට අවශ්‍ය ඡන්දය ලබා දෙන්න වැඩපිළිවෙළ අපි ඉදිරියට ගෙන යනවා. අපට අවශ්‍ය ඡන්දයක්. මේ රටේ විධායකයවත්, ව්‍යවස්ථාදායකයවත්, අධිකරණයවත් නෙවෙයි වඩා ප්‍රබල ජනතා පරමාධිපත්‍ය. අපි ඒ සඳහා අවස්ථාව ගරු අධිකරණයෙන් ලබා දෙයි කියන එකත් බලාපොරොත්තු වෙනවා . මම හිතන්නේ නුදුරේදීම බලාගන්න පුලුවන්. හොඳ අයවැයක් ඉදිරිපත් වෙලා තියෙනවා. මේ සම්බන්ධව පොදුජන පෙරමුණේ අපේ ස්තූතිය සභාපතිතුමා ඇතුළු නිලධාරී මණ්ඩලයට පුදකරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

**ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා**

ගරු සභාපතිතුමනි, මගේ සහෝදරයෙක්ගේ උත්සව අවස්ථාවක් තියෙනවා මේ වෙලාවෙදි සමෘද්ධි සංවර්ධන නිලධාරී වරයෙක් වශයෙන් සේවය කළ ජයතිස්ස අබේසුන්දර මහත්මාගේ විශ්‍රාම ගැනීමේ උත්සවය වෙනුවෙන් මට පැය භාගයක් බැහැරට යාම වෙනුවෙන් අවසර ලබා දෙන මෙන් අවසර ඉල්ලා සිටිනවා.

**ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා**

ගරු සභාපතිතුමනි, ඔබතුමාගෙන් අවසර ඒ වගේම තමයි අපි මේ අයවැයට කණගාටුව ප්‍රකාශ කරන්න ඕන. මේ අපේ නලින් හේවගේ මන්ත්‍රීතුමාගේ නම නෙවෙයි මම බලන්නේ. මම ජල ව්‍යාපෘතියක් පිළිබඳව යෝජනාවක් ගෙනාවා. එම ජල ව්‍යාපෘතිය මේකෙ සටහන් වෙලා නැහැ. මම කියන්න හිටියේ ඒක තමයි. මට මේ අපේ නිස්සරණාධ්‍යාසයෙන් වැඩ කරන්නේ අපේ නලින් මන්ත්‍රීතුමා විතරක් නෙවෙයි. අපි සියලුම දෙනා. ඒත් අපි තලාව

ඉස්කෝලෙට ලක්ෂ දහයක් දුන්නා. මෙහෙට රුපියල් තිස්දාහක් එව්වා. මෙහි සටහන් වෙලා තියෙනවා. ඔබතුමා කියෙව්වේ නැතුවට අපට කමක් නැහැ. මේකේ තියෙනවා මේ වීපී ලාම්පු ගෙනාපු ගණන. ඒවා කිව්වේ නැතිවට කමක් නැහැ. අර අපේ සහෝදර මන්ත්‍රීතුමා කිව්වා වගේ ජනතා විමුක්ති පෙරමුණ විරුද්ධ වුණේ මොකටද කියලා, අපි විරුද්ධ වුණේ සාමූහික සමාජයක් ගොඩනගන්න, මේ පහළොස් වසරක ශාපය ඉවත් කරන්න වෙන මොහොකටවත් නෙවෙයි. ප්‍රජාතන්ත්‍රවාදය ඉටු කරන්න තමයි. ජනතා විමුක්ති පෙරමුණේ නායකයෝ අපි එතනට ගියේ ඒ මොකක්වත් හින්දා නෙවෙයි. අපේ අනාගතයේ මේ ඉන්න දරුවන් රැකබලා ගන්න ඕන නිසා. ඔබතුමන්ලා කරපු වැරදි අපි අනිවාර්යෙන්ම දන්නවා. අපිට මේ සභාවේ පාර්ලිමේන්තුව ගැන කතා අපට වැඩක් නැහැ. නමුත් අපි කතා කරන්න ඕන යුක්තිය සාධාරණය ගැන. ඒ යුක්තිය, සාධාරණය ඔබතුමාලා ඉටුකරන්න දෙන්නෙ නැත්නම්, ඔබතුමා කිව්වා අපි ඡන්දෙකින් පත්වුණේ නැහැ කියලා. ලයිස්තුව අරගෙන බලන්න. ලයිස්තුව කියලා අපට, ජනතා විමුක්ති පෙරමුණට 1668 ඡන්දයක් තියෙනවා. ඒකයි මම මෙතන වාඩිවෙලා ඉන්නේ. මට ඔබතුමාලගේ කතා අහගෙන කන් වහගෙන, ඇස් පියාගෙන මෙතන ඉන්න බැහැ. ඒකයි මම කතා කලේ. ඔබතුමා දන්න මන්ත්‍රීවරයෙක් වශයෙන් ඔබතුමා ඇත්තටම වැරදියි, ලැජ්ජ වෙන්න ඕන මේ කතාව කලාට.

අනිත් එක තමයි ගරු සභාපතිතුමනි, මේ තල්ගස්වල අහිංසක මිනිස්සු පලාමිටිය, කෙසෙල් ඇවරිය විකුණන කඩ ටික කඩලා විනාශ කළා. ඒ යෝජනාව මම තමයි ගෙනාවෙ. මම සභාවට යෝජනා දෙකක් ගෙනාවා. යෝජනාවලින් එකයි මෙතන දාල තියෙන්නෙ. යෝජනා දෙකම මගේ. මෙතුමා තමයි ඒ එක යෝජනාවක් දාගෙන තියෙන්නේ. අන්න ඒ වගේ වැඩ කළා. සභාපතිතුමා හින්දා අපි ඒත් සද්ද නැතුව හිටියා. මම ගෙනාපු යෝජනා දෙකත් ඔය සභාවෙ ඇති. මගේ යෝජනාව කඩපේලිය ස්ථාපිත කරලා දෙන්න කියලා. සාධාරණව, අසාධාරණව නෙවෙයි. R D එකෙන් ගිහිල්ලා කඩපේලි විනාශ කරලා දැම්මා. ඊට පස්සේ මම දන්නේ නැහැ. කුමන දේශපාලනයක්ද කියලා. ඒපාර ඇළෙන් එහා ගොඩේ මීටර් 50ක් තියන්න කියලා හදලා කුකුළු කූඩු වගේ ගහගෙන ඉන්නවා. ඒ මිනිස්සු අර කොටසක් විනාශ කළා. ඒවට කිසිකෙනෙක් ප්‍රාදේශීය සභාවෙන් ගියේ නැහැ. මම ගිහිල්ලා මැදිහත් වුණේ, සභාපතිතුමා ගියේ ඊට පස්සේ. මම ගරු ලේකම්තුමියට කියන්නේ අපි වැඩ කරනවා. තල්ගස්වල හතරමං හන්දිය ළඟ මහ කුණු වළක් තිබුණා. මම කොරි පස් ඉල්ලුවා. ඒකට අපි කිසි කෙනෙක්ගෙන් අපට කොරි පස්, මොනවත් නැහැ.

අනිත් එක තමයි අපට එක වීපී ලාම්පුවක් දාලා දුන්න ද කියන්න. පියල් මන්ත්‍රීතුමාගෙන් අහන්න මාපලගම කොට්ඨාසයට අපේ පැත්තට කොහේටවත් එක වීපී ලාම්පුවක් දාලා දුන්නද කියලා. මට පක්ෂයක් ඕන නැහැ. මේ අපේ නලීන් හේවගේ මන්ත්‍රිතුමා රුපියල් විසිනවදාහක් එවලා තියෙනවා. වීපී ලාම්පු අරගෙන තියෙනවා. එයින් අපට මොනවද දැම්මේ. මේ මාසෙට වීපී ලාම්පු කීයක් සවි කලාද කියන්න. සිරිසුනන්ද ඉස්කෝලේ ළඟ අපි එදා දැක්කා. අපේ දරුවන් ට්‍රිප් එක ගිහිල්ලා එනකොට මහා තිත්ත කරුවලේ ඉන්නේ. ප්‍රධාන පාරට දානවා කිව්වා එකක්වත් දැම්මද? නැහැ. අපට යථා පරිදි ඒ ප්‍රශ්න ටික විසඳලා දෙන්න. හැමදාම කියනවා. එහෙම හරියන්නේ නැහැ. ඒක නිසා මම සභාපතිතුමාගෙන් ඉල්ලා සිටින්නේ සාවධානව අසා සිටින්න කියලා. මම මේ අවස්ථාවේ ඇත්තටම ඔබතුමා මෙහෙම දෙයක් කරයි කියලා අපි හිතුවේ නැහැ. ඒක ඔබතුමාගේ වැරැද්දක් වෙන්න ඇති. ජනතා

විමුක්ති පෙරමුණ සාධාරණව සාමයක් රටට ගෙන එන්න තමයි අපි ඉන්නේ. අපි සියලු දෙනා වෙනුවෙන් තමයි මෙතන කැපවෙලා ඉන්නේ. ඒ කැපවීම ඉටු කරන්න අපිට ඉඩ දෙන්න කියලා ඔබතුමාගෙන් ඉල්ලා සිටින අතර, සියලු මන්ත්‍රීවරුන්ට ස්තුතිය පුදකරමි මා නිහඬ වෙනවා. සභාපතිතුමනි, අද පෙර පාසල් උත්සවයක් තියෙනවා. මට බැහැර වෙන්න ඕන. ඒ සඳහා අවසර ලබා දෙන්න. ඔබ සැමට ස්තූතියි.

**ගරු මන්ත්‍රී වෙරංග ලක්මාල් මහතා**

මූලාසනාරූඪ ගරු සභාපතිතුමනි, දැන් මෙය අපි ගරු සභාවට ඇවිල්ලා මාස ගානක් වෙනවා. සාමාන්‍යයෙන් මගේ ජීවන රටාවේ පුරුද්දක් තියෙනවා. මම විසින්ම වර්ෂයේ සාර්ථකත්වය හා අසාර්ථකත්වය පිළිබඳ විශ්ලේෂණයක් කරන්න. ඉතින් ඒක නිසා මම තීන්දු කළා. ජනතා නියෝජිතයෙක් වශයෙන් උඩුගම මැතිවරණ කොට්ඨාශයෙන් තේරීපත් වෙලා ආවට පස්සේ නාගොඩ ප්‍රාදේශීය සභාව තුළ යම් මෙහෙවරක් මගේ ජනතාව වෙනුවෙන් කළාද කියන ස්වයං විවේචනයකට ලක්වෙන්න. ඉතින් ඒක නිසා මම තීන්දු කළා මගේ කොට්ඨාස තුළ ප්‍රාදේශීය සභා තුළින් සහ දකුණු පළාත් සභාවෙන් මන්ත්‍රීතුමන්ලාගේ ලබාගත් ප්‍රතිපාදන යටතේ සහ මගේ කොට්ඨාශය තුළ මා කළ මෙහෙවරින් බිඳක් මේ සභා ගත කරන්න. මොකද මට ඡන්දය දීපු උඩුගම කොට්ඨාස ජනතාව වෙනුවෙන් මම ඒක කළ යුතුම දෙයක් වෙනවා. ඒ නිසා ගරු සභාපතිතුමනි, මේ ගරු සභාවට ප්‍රාදේශීය සභාවේ 62.5% වැඩිම ප්‍රතිශතයකින් මේ ගරු සභාවට එන්න උදව් කළේ ජනතාව. ඒ නිසා මම හැකි සෑම අවස්ථාවකම ජනතාවත් එක්ක බද්ධ වූ සේවාවක් මන්ත්‍රීවරයෙක් විදියට මට සිද්ධ කරන්න ලැබීම භාග්‍යයක් කොට සලකනවා. ඒ වගේම සභාපතිතුමනි, මම මුලින්ම මගේ වැටුප මම ගන්නේ නැහැ කියල කිව්වා. ඒ වගේම මම ඒක යථාර්ථයක් කරමින් මා ඒ අවශ්‍ය ශිෂ්‍යාධාර ඒ පාසල්වලට බෙදා දෙමින් ප්‍රදේශයේ විවිධ සංවර්ධන කටයුතු වෙනුවෙන් යොදන්න මා මේ වන තෙක්ම මගේ වැටුප යොදාගෙන තියෙනවා කියන එකත් මා මේ ගරු සභාවට කියන්න කැමතියි.

ඒ වගේම තමයි මම මේ ගරු සභාවට ඇවිල්ලා මගේ යෝජනාවක් කළා. කුරුන්ද දවුල්හේන මාර්ගයේ මැද තියෙන ලයිට් කණුව ඉවත් කරල දෙන්න කියලා. මම කාලයක් මුළුල්ලේ ම එක එක මැති ඇමතිතුමාලා සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට අපි සමිති මාර්ගයෙන් ඇවටිලින් කලා. නමුත් ඒකට කිසිදු උත්තරයක් ලබාගන්න බැරි වුනා. මම හිතනවා අද කුරුන්ද මාර්ගයේ ගමන් කරන මිනිස්සුන්ට අද ආරක්ෂිතව අවදානම ඉවත් කරපු නිසා අපට ඒ ගමන ආරක්ෂිතයි කියලා ජනතාවට කියන්න පුළුවන්. ඒ වගේම තමයි ඒ වෙනුවෙන් අපේ ප්‍රාදේශීය සභාවේ යම්කිසි කැපකිරීමක් කළා. ඒ වෙනුවෙන් මහන්සි වුනා. ඒ වෙනුවෙන් වැඩ කරපු නිසයි අද එම අවදානම් ලයිට් කණුව ඉවත් වෙලා තියෙන්නෙ . ඒ නිසා ගරු සභාපතිතුමනි, මම ඔබතුමාට විශේෂයෙන් ස්තුතිවන්ත වෙනවා ඒ සම්බන්ධව අවශ්‍ය පියවර ගනිමින් ඒ කටයුතු නිම කිරීම පිළිබඳව.

ඒ වගේම තමයි මම ආපු දවසෙම උඩුගම පොළ සම්බන්ධව කටයුතු කරපු මන්ත්‍රීවරයෙක් විදියට දැන් අපට පොලේ අවසාන අවස්ථාවක් ඇවිල්ල තියෙන නිසා, උඩුගම පුරවරයේ කොට්ඨාස තුනේම ඉන්න ජනතාව වෙනුවෙන් 2019 ජනවාරි මාසයේ පලවෙනිදා සඳුදා

දිනයේ දී ම අපට පොළේ අලුත් ගොඩනැගිල්ල භාවිතා කරමින් පිරිසිදු පොළ දිනයක් කිරීමට අවශ්‍ය පියවර ගැනීමට අවශ්‍ය කටයුතු දැනටමත් 90% තත්වයෙන් අවසන් වෙලා තියෙනවා. ඉතින් ඒ වගේම මම කොට්ඨාසය තුළ ක්‍රීඩාවට සම්බන්ධව කටයුතු කරන විට උඩුගම උප මහජන ක්‍රීඩාංගනය සංවර්ධනය කිරීම පිළිබඳව මගේ අවධානය යොමු වුණා. ඒ නිසා ප්‍රාදේශීය මන්ත්‍රීවරයකු විදිහට උඩුගම මහජන ක්‍රීඩාංගනය සංවර්ධනය කරන්න මට පුළුවන්කම ලැබුණා. ඒ වගේම තමයි උඩුගම මොරගල්මුල්ල කාබිල්වත්ත මාර්ගය කියන්නේ අති දුෂ්කර ගමන් මාර්ගයක්. අවුරුදු 15කින් පස්සේ සංවර්ධනය කරන්න J.c.b. යන්ත්‍රයක් ලැබුණේ මා මේ ප්‍රාදේශීය සභාවට ආවට පස්සේ. ඉතින් ඒ ගැන මම සතුටුවෙනවා. මොරගල්මුල්ල කාබිල්වත්ත වතු ජනතාව අවුරුදු 15කින් පස්සේ සංවර්ධනයේ අරුණලු ඉටුකර ගැනීමට මගේ ප්‍රාදේශීය සභා මන්ත්‍රී ධූරය මෙහෙයවූවයි කියන එක ගැන මට සතුටු වෙන්න පුලුවන්. ඒ වගේම තමයි උඩුගම මොරගල්මුල්ල කොස්ගහහේන පාරක් අවුරුදු 15කින් පස්සේ තමයි සංවර්ධනය අරුණලු උදා වුණේ. ඒ ගම්වාසීන්ට යන්න එන්න බැරිව ගමන් කිරීමේ අපහසුතාවක් තියෙන මොහොතක තමයි අපි මේ මන්ත්‍රීධූරයෙන් යම්කිසි වැඩ කොටසක් ප්‍රාදේශීය සභාව හරහා ඉටු කර ගැනීමට ලැබුණේ. ඒ වගේම තමයි මගේ කොට්ඨාසය තුළ දී සංවර්ධනයේදී උඩුගම කසල මධ්‍යස්ථානය මා කිව්වා පොහොර ටික බල්ලො කනවා. ඒ වගේම එතනට අවශ්‍ය කරන සම්පත් යොදවන්න. ඒක සාක්ෂාත් කරමින් මට හිතෙන්නේ කසල මධ්‍යස්ථානයක් සංවර්ධනය කරන්න ඉඩකඩ ලැබුණා. ඒකත් මගේ කොට්ඨාසයට ලැබූ ජයග්‍රහණයක් කියල මම හිතනවා. ඒ වගේම තමයි මම යෝජනා කළේ පොල් ඉඩම සම්බන්ධව, පොල් ඉඩම අරගන්න මගේ මැදිහත්වීම මා ඒ වෙනුවෙන් කරපු කාර්යභාරය පිළිබඳව ඔබතුමා හොඳින් දන්නවා. ඒ නිසා ඒ පොල් ඉඩමක් ලබා ගෙන එයින් ප්‍රතිඵල ප්‍රාදේශීය සභාවට භුක්ති විඳින්න ලැබීම ගැන මම සතුටු වෙනවා. ඒ වගේම තමයි උඩුගම 218 උප කාර්යාලය වැසිකිළි පද්ධතිය ඉදිකිරීම, මම හිතනවා මම හත්වෙනි මාසෙ කතා කළේ ගරු සභාපතිතුමනි, මගේ යෝජනාවක් අනුව ම ශ්‍රවණාගාරය හා බහු කාර්‍ය ගොඩනැගිල්ල උපයෝගී කරගෙන ඒ පෙර පාසලේ අවශ්‍ය දරුවන්ට අවශ්‍ය පරිසරය නිර්මාණය කරන්නට නම් පල්ලෙහා තියෙන පෙරපාසල උඩහට ගෙනියන්න ඕන. බහුකාර්ය ගොඩනැගිල්ලේ තියෙන පුස්තකාලය උප කාර්යාල භූමියට ගෙන එන්න ඕන. ඒක නිසා මම හිතනවා, මේ සංවර්ධන කටයුත්තේ දී ඉදිරියේදී තවත් සංවර්ධනය කරමින් එය උපකාර්යාලය අලුත්වැඩියා කරලා ඒ කටයුතු නිමකර ගැනීමට පුලුවන් වෙයි කියලා විශ්වාසයකුත් තියෙනවා. මේ වෙනකොට මගේ කොට්ඨාසය තුළ ගරු ඉසුරු දොඩංගොඩ මැතිතුමාගේ ප්‍රතිපාදන යටතේ මා විදුලිය නොමැති නිවාස දහයක් සඳහා විදුලි ආලෝකය ලබාදීම සඳහා මම කටයුතු කරලා තියෙනවා. ඉතින් ඒ නිසා එතුමාගේ ප්‍රතිපාදන යටතේ විදුලිය ලබාදීම පිළිබඳව, මම මේ අවස්ථාවේ ගරු ඉසුරු දොඩංගොඩ මැතිතුමාටත් ස්තූතිය ප්‍රකාශ කරනවා. ඒ වගේම ගරු සභාපතිතුමනි, මම විශේෂ ස්තූතියක් කරන්න ඕන. මේ අවස්ථාවේ ගරු දකුණු පළාත් නියෝජ්‍ය සභාපති සම්පත් මැතිතුමාට මොකද එතුමා ගේ මෙහෙයවීම මත 218 ඇප්තොප්වත්තේ ඒ දුෂ්කර ගම්මානයේ එහා කොනේ යන්නවත් බැරි ස්ථානයක දරුවන් හතර දෙනෙක් ඉන්න බොහොම දුප්පත් මැටි ගෙයක් තියෙන තැනක මට ගෙයක් හදලා දෙන්න පුළුවන්කම ලැබුණා. ඒ ගැනත් මම ඒ දේ ඒ අයට විවෘත කරල දෙන්න, පදිංචි කරන්න අපි බලාපොරොත්තුවෙන් සිටිනවා. ඒ නිසා මා ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙක් විදිහට මේ පොඩි කාලය තුළ කරපු වැඩ කොටස පිළිබඳව විශ්ලේෂණයක්

කළේ. ඒ වගේම තමයි මම කියන්න ඕන. මහජන පැමිණිලි පිළිබඳව අවධානය යොමු කරද්දී තාක්ෂණ නිලධාරීන් තනියම යන්නේ, එතනට ගියාට පස්සේ එතන මහා ගැටුමක්. මම හිතනවා. ඒක සාර්ථක ක්‍රමවේදයක් නොවෙයි. මහජන පැමිණිලි පිළිබඳව ඔබතුමාගේ විශේෂ අවධානය යොමු කරලා, යම් කණ්ඩායමක් එක් කොට්ඨාසයකට යවලා ඒ කොට්ඨාශයේ තිබෙන මහජන පැමිණිලි පිළිබඳව කණ්ඩායමක් මගින් ඉටු කරන්න කියලා ඉල්ලා සිටිනවා. නිලධාරියා යන්නෙ තනියම. එතන යම්කිසි ගැටුමක් තියෙනවා. වැටකට, කාණුවකට මොහොකට හරි නමුත් මොනව හරි සිද්ධ වුණාට පස්සේ නිලධාරියාගේ වගකීම ප්‍රාදේශීය සභාව ගන්නවද? සාක්ෂියක්වත් දෙන්න තව නිලධාරියෙක් ඉන්නවද? ඒක නිසා මේ සම්බන්ධව විධිමත් වැඩපිළිවෙලක් සකස් කරල ඒ නිලධාරීන්ගේ ආරක්ෂාව තහවුරු කරන්න කියලා මම ඉල්ලා සිටිනවා. මොකද ඒවගේ ප්‍රශ්න රාශියක් මෑත කාලයේදී මගේ කොට්ඨාශයේ සිද්ධ වුන නිසා.

ඒ වගේම තමයි ගරු සභාපතිතුමනි, කර්මාන්ත බදු පිළිබඳව මං මේ අවස්ථාවේ සිහිපත් කරන්න කැමතියි. 2019 නව අයවැය වාර්තාවක් ඉදිරිපත් කරපු මේ අවස්ථාවේ උඩුගම දැන් තියෙනවා අලුතෙන්ම දාපු නව ව්‍යාපාර ගණනාවක්. මම හිතනවා මේ කර්මාන්ත බදු අය කිරීමේ ක්‍රමවේද සහ මිල ගණන් වෙනස් කිරීමේ කටයුතු පසුගිය දවස්වල සිද්ධ වුනා. ඒ වුනත් නැවත අලුතින් ආරම්භ කරපු ව්‍යාපාර මෙහි ලේඛනගත වෙලා නැහැ. මම කියනවා මේක සභාවට ගන්න පුළුවන් ආදායමක් නම් සම්පූර්ණ ප්‍රාදේශීය සභාව සතු කර්මාන්ත බදු එකතු කිරීමේ වැඩපිළිවෙළක් සහ නියාමනය කිරීමේ දී ලබා ගන්නා ආදායම අපට වඩාත් ඵලදායී ලෙස වැඩිපුර ගන්න පුලුවන් නිසි ක්‍රමවේදයක් අනුව ඒ කර්මාන්ත බදු වැඩසටහන ක්‍රියාත්මක කලොත් හොදයි. මොකද උඩුගම කර්මාන්ත බදු නොගෙවන පිරිස් ගොඩක් ඉන්නවා. ඉතින් සමහර ගෙවන්නත්, සමහරක් නොගෙවන්නත් හේතුවක් නැහැ. මම හිතන්නේ කර්මාන්ත බදු වෙනුවෙන් නිසි ක්‍රමවේදයක් ඉටු කරයි කියලා බලාපොරොත්තු වෙනවා. ඒවගේම තමයි ගරු සභාපතිතුමනි මීට වඩා යමක් කියන්න අවස්ථාව නොවෙයි. ඒක නිසා මම ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙක් විදියට මා කළ මෙහෙය මගේ කොට්ඨාසයට බොහොම ඇති කියලා මම හිතනවා. මොකද කෙටි කාලයක් තුළ සමාජගත වැඩපිළිවෙලක් එක්ක ජනතාවට බද්ධ කරන්න, නියාමනය කරන්න ප්‍රාදේශීය සභා මන්ත්‍රී ධූරයත් මේ ගරු සභාවත් ප්‍රයෝජනයට ලක්වුනයි කියලා මම හිතනවා. එනිසා මම බොහොම සතුටට පත්වෙනවා. ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙක් විදියට පොඩි හෝ වැඩකොටසක් ගම වෙනුවෙන් කර ගන්න හැකිවීම පිළිබඳව. ඒක නිසා ගරු සභාපතිතුමනි, 2019 අයවැය වාර්තාව මම බොහොම සතුටින් පිළිගන්නවා. ඒ වගේම එය වඩාත් ඵලදායි කරගන්නත් නියාමනය කරන්න අවශ්‍ය ශක්තිය ඔබතුමා නිරන්තරයෙන්ම ලබා දෙනවා. ඒ වගේම තමයි ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. ඔබතුමා 2019 වර්ෂයේ සාර්ථක පාලකවරයකු ගේ භූමිකාව ඉෂ්ට සිද්ධ කරන්න. එතකොට වඩාත් ඵලදායි ප්‍රාදේශීය සභාවකින් ජනතා මෙහෙවර සාක්ෂාත් කරගන්න මහඟු පිටුවහලක් වෙයි කියලා. මොකද නායකත්වය මත තමයි ඒ හැම දෙයක්ම තීරණය වෙන්නේ. ඒ නිසා ඔබතුමා තව තවත් ඵලදායී සහ ක්‍රියාශීලී නායකයෙකු වීමට ඔබතුමාට ශක්තිය ධෛර්යය ලැබේවායි කියා ප්‍රාර්ථනා කරමින්, මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

**ගරු මන්ත්‍රී තරංග සුදර්ශන මහතා**

ගරු සභාපතිතුමා, උප සභාපතිතුමා ඇතුළු සමස්ත සභාවෙන් අවසරයි. 2019 අයවැය ලේඛනයට විපක්ෂව අදහස් ප්‍රකාශ කිරීටම සිදු වීම පිළිබඳව කනගාටු වෙනවා. අපි උපරිම සහයෝගය සභාපතිතුමාට එදා ඉදල ලබා දුන්නා. නමුත් මහජන නියෝජිතයින් වශයෙන් මේ කාලය තුළ මහජනතාවට අපි බලාපොරොත්තු වුන සේවාවක් ඉටු වුණේ නැහැ. අයවැයට විපක්ෂව ඡන්දය දීපු දාහතර දෙනා අතර අපි හත්දෙනා සහ විපක්ෂ කණ්ඩායමම සභාවක් විදියට මෙතෙක් කල් එකට හිටියා. ඉදිරියෙදිත් එය ගැටළුවක් නොවේවි. නමුත් මෙවැනි අවස්ථාවලදී අපට අපේ අදහස ප්‍රකාශ කරන්න සිද්ධ වෙනවා.පැවතුන මැතිවරණ ක්‍රමය අනුව කොට්ඨාශයෙන් පත්වුණු මන්ත්‍රීවරුන් පහලොස් දෙනා මොන පක්ෂයෙන්ද කියන එක වැදගත් නැහැ. අනෙක් මන්ත්‍රීවරුන් දොළොස් දෙනා පත්කිරීම් වලින් සභාව නියෝජනය කරනවා. ඒ ගැන අවබෝධයක් නැතිව විලේගේ මන්ත්‍රීතුමා කතා කිරීම ගැන කණගාටු වෙනවා. ආවට පස්සේ මන්ත්‍රීවරු විදියට විසි හත් දෙනාම එකයි. එයින් එක්කෙනෙක් තමයි සභාපති වෙන්නේ. මෙවර ජේෂ්ඨත්වය පමණක් බලපු නිසා නිමල් වික්ටර් නාගොඩවිතාන කියන ඔබතුමා සභාපති වුණා. ඔබතුමාගෙන් කොට්ඨාශ 15 සාධාරණයක් බලාපොරොත්තු වුණා. අපේ යෝජනාවක් ඉදිරිපත් කරන්නේ පෞද්ගලිකව අපට නෙවෙයි ජනතාව වෙනුවෙන්. මන්ත්‍රීවරු හිතාගෙන ඉන්නේ ඒ අයගේ යෝජනා විතරයි ක්‍රියාත්මක වෙන්න ඕන කියලා. අපට ලැබෙන්න තිබුණා රුපියල් ලක්ෂ 70න් තමයි මේ සේරම ඔබතුමා කළේ. මගේ හිතවත් මන්ත්‍රීවරු ඉන්නෙ.පක්ෂ භේදයකින් තොරව මට ඒ අයට මගේ ගෞරවය හිතවත්කම තියෙනවා. මම ඉතා කණගාටුවෙන් ප්‍රකාශ කරනවා මේ කණ්ඩායමෙන් බලාපොරොත්තු වන දේ ඉටු වුණේ නැහැ. ඉදිරි වර්ෂ 4 තුලදී ඉටුවන්නේ නැහැ. විශේෂයෙන්ම මේ ගෝණදෙනිය ගමට එකම විදුලි පහනක්වත් හයි කරගන්න අපට මේ සභාව හරහා තවම බැරි වුනා. ඒ ගැන කණගාටුවට පත් වෙනවා. අපි ඒ ගැන ඒකට විකල්ප ක්‍රම හොයාගෙන , අපේ පළාත් සභා මන්ත්‍රීවරු හොයාගෙන ගිහිල්ලා පුද්ගලිකව අපි එතුමන්ලාගේ ඉල්ලීම් කරලා එතුමන්ගෙන් ප්‍රතිපාදන ගෙන සභාවට දීලා තියනවා. නමුත් ඔබතුමා අද මේ සභාවට ශත පහකින්වත් උදව්වක් නොකරපු මම නම් වලින් කියන්නම් චන්න සාලිය මෙන්ඩිස් ආරියවංශ ශම්මු වගේ සමහර කණ්ඩායම් වල නම් ගහලා තියෙනවා. නමුත් ඒ අය මේ සභාවට මොකද්ද කරපු දායකත්වය කියලා අපි ආපසු හැරිලා බලන්න ඕන. නමුත් අපි සුළු වශයෙන් හරි අපේ ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීතුමා පුළුවන් උදව්වක් කළා. ඒ වගේම අපි ආණ්ඩුව විදිහට මම කලින් කතා කරපු නැති ඇමතිතුමන්ලා සහයෝගය ලබා දුන්නා. එහෙම නැත්නම් අපට මේ සභාව මේතාක් දුරට ගේන්න බැහැ. මේ තරම් සාර්ථක අන්දමින් එතුමන්ලා ඒ දෙන්න පුළුවන් සහයෝගය මිලියන ගණනින් ලබා දුන්නා. ඔබතුමාලට තියෙන ගැටලුවලින් 75% ක් මේ පහුගිය රජයේ හරහා අපි අඩු කරලා දුන්නා. නමුත් අර වැඩකට නැති කණ්ඩායමක නාමලේඛන අයවැය වාර්තාවට ඇතුළත් කරන කොට පුංචි කණගාටුවක් ඇතිවෙනවා. නමුත් ඔබතුමාට අතපසුවීමකින් හරි ඔබතුමා නිහතමානී විදිහට වැරැද්ද භාර ගත්තා. ඒක නිවැරදි කළා. ඒ ගැන ස්තුතිවන්ත වෙනවා. වෙරංග මන්ත්‍රීතුමාගේ අදහසට අනුව නම් මම මන්ත්‍රීවරයා නෙවෙයි අපේ පක්ෂයෙන් පත් කරපු කෙනා විදිහට, උඩුගම කොටසට නායකත්වය දෙන්න මට හැකියාව ලැබුණා. අපේ වෙරංග මන්ත්‍රීතුමා කතා කළා. එතුමා මේ කාලසීමාව ඇතුළත කරපු දේවල් ගැන. උඩුගම මොරගල්මුල්ල පාරට එතුමා අවුරුදු 15කින්ලු සංවර්ධනයේ අරුණලු ලබා දුන්නේ. ඔබතුමා

බලන්න මීට මාස කිහිපයකට කලින් උඩුගම මොරගල්මුල්ල කාබිල්වත්ත පාරට හැරෙන තැන ඉදලා කොන්ක්‍රීට් කළේ කවුද කියලා. එතනම ලක්ෂ 5කින් පටන්ගෙන, ඔය මොරගල්මුල්ල කොටසට විතරක් මම පහුගිය රජය කාලේ ලක්ෂ 25ක වැඩකරලා තියෙනවා. ඔබතුමා දන්නවද දන්නේ නැහැ.

ඒ වගේම තමයි සභාපතිතුමනි, අපි උඩුගම කොටසේ නාගොඩ ප්‍රාදේශිය සභාවේ වසම් දාසයක් වෙනුවෙන් ලක්ෂ හාරසියක වැඩ කළා. පසුගිය විසුරුවපු කාලය තුල ප්‍රාදේශීය සභා විසුරුවා තිබුනට ලක්ෂ 400 ක වැඩ කලා. කවුරුත් නැහැයි කියලා කියනවනම් අපි ඔප්පු කරන්නම්. තමන්ගේ ග්‍රාමනිලධාරි වසම්වල බලන්න. ලක්ෂ 25 බැගින් ලක්ෂ 400ක් අවමය සමහර විශේෂ ව්‍යාපෘති ලක්ෂ 15 ,20 වෙනම ව්‍යාපෘති ලක්ෂ දෙක තුන පහ ආදිය වෙනම කරනවට අමතරව අනිවාර්යයෙන්ම ලක්ෂ 25ක ඒ වසමක හරි වැඩ කරලා තියෙනවා.

ඒ වගේම තමයි අපේ වෙරංග මන්ත්‍රීතුමා කියපු පොල් ඉඩම, ඇත්තටම අපි බලාපොරොත්තු වුණා. ඒක සාර්ථක වෙයි කියලා. නමුත් අද හොරුන්ට පහසුකම් සපයන තැනක් වෙලා. දැන් ඒ ප්‍රදේශයේ ඉන්න හොරුන් විසින් තමයි පොල් කඩන්නෙ. මුලින් මාසයක් දෙකක් හොයලා බැලුවා. පෝර දාන්න ඕන කිව්වා. මම හිතන්නෙ එතනින් පස්සෙ ඒකත් ඒ ප්‍රාදේශීය සභාවට වියදමක් විතරයි.

උඩුගම පොල ගැන කතා කරනවනම්, මේ මාස කිහිපය ඇතුලත අත්තම් සීයකට වැඩි ප්‍රමාණයක් මේ ප්‍රාදේශීය සභාවේ කම්කරුවන් යොදවල තියෙනවා. ඔබතුමාගේ යෝජනාවලට ඔබතුමා ලකුණු දාගත්තට, ඒක සභාවෙ පොළ විදියට කවුරුත් එකතුවෙලා කෙරෙන්න ඕන දෙයක්. නමුත් සේවකයන් එතන නම් වැඩ නොකළ නම් කොහේ හරි පාරක් හරි සුද්ද කරනවා. ඒ නිසා ඒ ගැන නැවත සලකා බලන්න.

ඒ වගේම තමයි ඔබතුමා කිව්වා, කසල මධ්‍යස්ථානය යම් සංවර්ධනයක් කරයි කියලා. නමුත් මේ එකක් වත් අපේ කාලේ කරපුවා නෙවෙයි. දැන් ඔබතුමා කිව්ව උප කාර්යාලය කරන වැසිකිලි පද්ධතිය මේ අපේ කාලේ එකක් නෙවෙයි. ඔබතුමා කියනවා. මම යෝජනා කරල මම සතුටු වෙනවා කියලා. මටත් සතුටුයි. ඒ සතුට හින්ද තමයි කියන්නේ. අනුන් කරපු දේ මේ ලේකම්තුමිය බලධාරියා විදිහට ඉන්න කාලේ අපේ කට්ටිය ගිහිල්ලා කොන්ත්‍රාත් එක කලාට මම දන්නෙ නැහැ සතුටක් එනවයි කියලා. නමුත් අද වෙනකොට අපෙන් දුරකථන ඇමතුම් දීල මන්ත්‍රීතුමා කොන්ත්‍රාත් කරනවා නේද අසවල් තැන කියලා අහනවා. මම කියන්නේ සභාවේ 15000 නොගත්තට ඔබතුමා කොන්ත්‍රාත් කාරයෙක් විදියට ලක්ෂ 7 8 ව්‍යාපෘති කරනවා නම් මේ මන්ත්‍රීවරු විදිහට අපි දන්නේ නැහැ ඒක කොහොමද වෙන්නෙ කියලා. කවුරුවත් දන්නෙ නැහැ. මේ සභාවේ මන්ත්‍රීවරුන් මාස හයක් හතක් වෙනකොට කොන්ත්‍රාත්කාරයෝ පිරිසක් බවට පත් වෙලා. සද්භාවයෙන් අපි එන්නේ එහෙමයි. නමුත් දැන් මාස හයක් යනකොට මෙහෙමයි. සමහර කරන දේවල්වල යම් යම් ගැටළු අඩුපාඩු කම් තියෙනවා. ඒකයි අපට මේ අවස්ථාවේ කතා කරන්න සිද්ධ වෙන්නෙ.

උඩුගම කාර්යාලයේ පෙරපාසල ගැන අපි කතා කලා. අදක ර්යෙක නෙවෙයි .විලේගේ මහත්තයා මේ සභාවේ සභාපති වෙලා ඉන්න කාලේ තමයි ඒ පුරනැගුම බිල්ඩින් එකේ එක පැත්තක් පෙරපාසලට සහ අනෙක් පැත්ත ශ්‍රවණාගාරට දෙන්න කියලා. ඉතින් ඒක අපි දන්නවා. ඒක මේ කාගෙවත් යෝජනා නෙවෙයි. මේ සියල්ල මේ කාලේ සිද්ධ වුණාට ඒ

අපේ තියන ගැටළු නිසා අපේ තියෙන දැක්මක් නැති කම නිසා තමයි ඒක වුණේ. ඒ වගේම තමයි දැන් පෙර පාසලේ ළමයි හැත්තෑවක් අසූවක් එන බවත් අපි දන්නවා. මොකද ඔය කියන පෙරපාසලට තමයි මගේ දරුවො යන්නෙත්. මම මේ ගැන කතා කරන්නෙ ප්‍රායෝගිකව දන්න නිසා. අපි මේ ප්‍රාදේශීය සභා පෙර පාසල් ගැන කොච්චර කතා කළත්, පෙර පාසල් 15ට අපි මොනවද කරන්නේ කියලා ආපසු හැරිලා බලන්න ඕන. පෞද්ගලික පෙරපාසලක් හා සභාවේ පෙරපාසලයි අතර වෙනසක් නැහැ. නිල ඇඳුම ගන්නේ රුපියල් 1200 ක් දීලා. අපේ ප්‍රාදේශීය සභාවෙන් කියලා මොනවද කරන්නේ. බොරුවට ගිහිල්ලා ආරාධනා පත්‍රයක් ගහගෙන ,උත්සවයක් තියලා ලොකු කතාවක් කරලා තමයි මේ ප්‍රාදේශීය සභා පෙරපාසල කියලා නම දාගෙන එන එක විතරයි. නමුත් ඒ දෙමව්පියන්ට කිසිම සහනයක් කරන්නෙ නැහැ. පෙර පාසල් පද්ධතියේ ප්‍රාදේශීය සභාවෙන් කියලා ඔක්තෝම්බර් මාසයේ ලෝක ළමා දිනය වෙනුවෙන් වැඩසටහනක් කරනවා. ඒ ඇරෙන්න අපි මේ දරුවන්ට මොනවද කරල තියෙන්නේ. ඔබතුමාල මොන දේශපාලන මත දැරුවත් ආණ්ඩුව පත් වෙලා රජය කරගෙන ගියත්, මේ සභාවේ මන්ත්‍රීවරු විදිහට අපි සහෝදරත්වයෙන් හිටියා. ඉදිරියටත් ඉන්න ඕන. ඒ නිසා ඒ වගේ ගැටලු ඇති නොවෙන විදිහට සහ මේ මන්ත්‍රීවරු 15 දෙනාගේ ඉල්ලීම් වලට විතරක් සාධාරණයක් කරන්න එපා. මන්ත්‍රීවරුන්ට සාධාරණයක් වෙනවා, දීමනාව දෙනවා ,ඉන්ධන දීමනාව, දුරකථන කාඩ්පත ඒ සියල්ල මේ සභාවෙන් ලැබෙනවා. එක සමානව ටීෂර්ට් එකක් ගහනවා. එක හම්බ වෙනවා. නමුත් ඔබතුමාලාගේ වැඩපිළිවෙළේදී සාධාරණයක් කරන්න.

උඩුගම උප මහජන මහජන ක්‍රීඩාංගණය කියලා අපේ වෙරංග මන්ත්‍රීතුමා පසුගිය දවස් වල යම් වියදමක් ගැන, මම ඒකට තාවකාලිකව ගෙවීම් කරන්න එපා කියලා දැනුම්දීමක් කළා. මාස දෙකක් තිස්සේ අපි කතා කරනවා මේ දේ ගැන. මෙහෙම දශමයකින් දෙයක් මේ සභාව කරල නැහැයි කියලා නැවත වරක් ප්‍රකාශ කරනවා. මම වෙරංග මන්ත්‍රීතුමාට එළියෙදි චෝදනා කළා. එතුමන් කියනවා. මටත් කරන්න දෙයක් නැහැ. මමත් කැමති වැරැද්දක් තියනවනම් ඒක නිවැරදි වෙනවා නම් කියලා. මේක තමයි සභාවෙ තත්ත්වය. මාස 2 දෙක ඇතුළත අඩුම ගානේ තාක්ෂණ සේවා නිලධාරිවත් යවලා නැහැ. අර නාමල් ලක්රුවන් කියන මනුස්සයට j.c.b. එක වැඩ කරපු එකේ බිල මේ තියන සල්ලි වලින් ගෙවන්නවත් ඔබතුමාට උනන්දුවක් නැහැ.

මම මුලින් කතා කළා වගේ උක්ඹිට්ට ප්‍රාදේශීය සභා පෙරපාසලේ 4 වෙනිදා අපේ දරුවන්ගේ විසිර යාමේ උත්සවය පෙර පාසලේ තියෙනවා. මම හිතන්නේ සභාවෙ තියෙන ලොකුම පෙරපාසල ඒක. ඔබතුමන්ලාට කොහොමත් ආරාධනා පත්‍රයක් නිල වශයෙන්ම ලැබිලා තියෙනවා. මගේ දරුවත් යන නිසා ඒ පෙර පාසල් උත්සවයට එන්න කියා මා සියළු දෙනාට ආරාධනා කරනවා. 2019 වසර අපේ සභාවට සහ මේ ප්‍රදේශයට සේවයක් කරන්න හැකි වසරක් වේවා කියා ප්‍රාර්ථනා කරමින්, මම නිහඬ වෙනවා. සියලු දෙනාට ස්තුතියි.

**ගරු උප සභාපතිතුමා**

ගරු සභාපතිතුමා, ගරු මන්ත්‍රීතුමන්ලාගෙන්, මන්ත්‍රීතුමියන්ලාගෙන්, සහභාගි වී සිටින මාධ්‍යවේදී මහත්වරුන්ගෙන් අවසරයි. අජිත් එඩේරආරච්චි මැතිතුමා අසනීප තත්ත්වය හේතුවෙන් මෙම අවස්ථාවට සහභාගී නොවන බව දැනුම් දෙන ලෙස ඉල්ලීමක් කළා. මෙවර අයවැය ලේඛනය ඉදිරිපත් වී ඡන්ද විමසීමට පසු පාලක පක්ෂය එනම් සභාව මෙහෙයවන පක්ෂය අයවැය ලේඛනය පිළිඅරගෙන ඡන්ද විමසීම ජයග්‍රහණය කලා. මන්ත්‍රීතුමන්ලා විසින් තමන්ගේ යෝජනා අයවැය ලේඛනයට ඇතුළත් වී නොමැති බව යෝජනා කළා. නමුත් අපි විශේෂ සභාවකදී එම යෝජනා පිළිබඳ සාකච්ඡා කර රුපියල් ලක්ෂ 5 ත් 10 ත් අතර එක මන්ත්‍රීකෙනෙක් ගෙන් එක් ව්‍යාපෘතියක් යක් ඒ සඳහා යොදා ගන්නා බවට එකඟතාවයකට පැමිණුනා. නමුත් අයවැයට ඇතුළත් නොවූවත් ලැබෙන ප්‍රතිපාදන අනුව එම යෝජනා වලට ප්‍රමුඛත්වය දෙන්න කියලා ගරු සභාපතිතුමා ගෙන් ඉල්ලීම් කරනවා.

විපක්ෂයේ මන්ත්‍රීතුමන්ලා කෙසේ චෝදනා නැගුවත්, ගරු සභාපතිතුමා අප සමඟ සාකච්ඡා පවත්වන සෑම මොහොතකම පවසා සිටියේ සියලු මන්ත්‍රීතුමන්ලාට පක්ෂ පාට භේදයකින් තොරව එකසේ සහන සැලසිය යුතු බවයි. ඒ සඳහා අපගේද කිසිදු විරෝධතාවයක් නැහැ. වීථි පහන් ලබාදීමේදී එම ක්‍රමවේද වලට කිසියම් කාලයක් ගත වුවත්, කිසිම වෙනසක් නොකර ඉදිරියේදී එතුමා අඩුපාඩුවක් නොමැතිව උදව් කරාවි යැයි මම බලාපොරොත්තු වෙනවා.

ඉදිකිරීම් ලද බොහෝ වෙලාවට අඩුපාඩුකම් සිදුවෙනවා. තල්ගස්වල පොළ ඉදිකිරීමේදීත්, උඩුගම පොළ ඉදිකිරීමේදීත් එම ස්ථාන වලට ගැලපෙන අයුරින් ඉදිකිරීම් කටයුතු නොකිරීම නිසා එය අසාර්ථක භාවයට පත් වෙලා තියෙනවා. ඒවගේම උඩුගම උපකාර්යාලයේ ඉදිකරන වැසිකිළි පද්ධතියක් එම ගොඩනැගිල්ලට නොගැලපෙන ඉදිකිරීමක් වෙලා තියෙනවා. උඩුගම ක්‍රීඩාංගනය ක්‍රීඩා කිරීමට ප්‍රමාණවත් පරිදි සකස්කර වැට ඉවත් කර සකස් කර දෙන්න කියලා ඉල්ලීම් කරනවා. තරුණයින්ට ක්‍රීඩා කිරීමට එම ක්‍රීඩාපිටිය අවශ්‍යයි. උඩුගම පොළ සංවර්ධනය කිරීමේ ඇස්තමේන්තුව අනුමත කිරීමේ යෝජනාව ඉදිරිපත් කරනවා. තැපැල් කාර්යාලය රුපියල් 10000.00 ක මුදලක් වෙන් කිරීම සඳහා යෝජනාවක් ඉදිරිපත් කරනවා. ඉදිකරන ලද රංගන ශාලාවේ බොහෝ අඩුපාඩු පවතිනවා. එම රංගන ශාලාවකට සුදුසු ශබ්ද පරිපාලනය කළ හැකි පරිසරයක් සකස් වෙලා නැහැ. නිලධාරීන් ඇස්තමේන්තු සකස් කරත්, එසේ නිවැරදිතාවය ප්‍රකාශ කලත් සමාගම්වල නිලතල දරන ලද මහජන නියෝජිතයින් වශයෙන් සභාපතිතුමාගෙත්, අපෙත් වගකීමක් තියෙනවා. මෙම ඉදිකිරීම් ප්‍රදේශයට, ස්ථානයට ගැළපෙනවාද යන්න සොයා බැලීම පිලිබඳව.

පළාත් පාලන ක්‍රීඩා උත්සවය සඳහා රුපියල් හැටදාහක මුදලක් ඉල්ලීම් කළත්, ඒ මුදලට සරිලන වැඩ කොටසක් එතන සිදුවුනේ නැහැ. කිසිම දවසක එම එකතුවන මුදලින් කරන වියදම පිළිබඳව අප දැනුවත් කර නැහැ. ප්‍රාදේශීය සභාවක් වශයෙන් අපි බොහෝ ඉදිරියෙන් සිටිමින් ක්‍රිකට් ක්‍රීඩාවේ දක්ෂතා දැක්වූ හර්ෂ කුමාර රාජ්‍ය සේවා කණ්ඩායමට තෝරාගැනීම ඉතාමත් ප්‍රශංසා කළ යුතු දෙයක්. ඔහුට ඒ සඳහා අවශ්‍යතාවයන් සපුරා දීමට කටයුතු කරන ලෙස සභාපතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. එසේම ප්‍රියන්තා මන්ත්‍රීතුමිය, සුභාෂි ඒකනායක මන්ත්‍රීතුමිය, සඳමාලි පෙර පාසල් පාලිකාතුමිය, ගංගා පද්මිනී මෙනවිය හා ප්‍රිමාලි ශ්‍රීනිකා මෙනවිය දක්ෂ ලෙස ක්‍රීඩා කර ජයග්‍රහණය ලබා ගැනීම පිළිබඳ ඔවුන්ට අපගේ ස්තුතිය පුද

කරනවා. සභාපතිතුමා, ලේකම්තුමිය ඇතුළු සංවිධාන කටයුතු කළ සියලු දෙනාටත්, සහභාගි වූ සියලුම දෙනාට ස්තුතිය පල කරනවා. සම්පත් අතුකෝරල මැතිතුමා විසින් ලබාදී ඇති රුපියල් 50,000 ක මුදල වැය කිරීම සඳහා පරිසර කමිටුවට යොමුකර යෝජනාවක් ලබා ගන්නා ලෙස ඉල්ලා සිටිනවා. ඒ වගේම පරිසරයට මුදාහරින බැටරි වර්ග, ඉලෙක්ට්‍රොනික උපකරණ නිසා භූගත ජලය විශාල වශයෙන් දූෂණයට ලක්වෙනවා. එයින් පරිසරය විශාල වශයෙන් හානියට ලක් වෙනවා. එම නිසා තව අවුරුදු විස්සක් තිහක් යනවිට අපට පරිසරය ජීවත්විය නොහැකි තත්වයට, බීමට ජලය නොමැති තත්ත්වයක් උදා වෙන්න පුළුවන්. ඒ නිසා මාර්ග බෝක්කු හදනවට වඩා වැඩි අවධානයක් යොමු කර, පාසල් ළමුන්, විහාරස්ථාන හා දහම් පාසල් ළමුන් හරහා දැනුවත් කිරීම සිදුකර මෙම අපද්‍රව්‍ය පරිසරයට මුදා නොහැර අපි විසින් එක්රැස් කර බැහැර කිරීමේ ක්‍රමවේදයකට යන්න කියල මම සභාපතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. අද අයවැය ඉදිරිපත් කර ඔබගේ ඉදිරි වර්ෂයේ සිදු කිරීමට ඇති වැඩ කටයුතු සාර්ථකව ඉටුකර ගැනීමටත්, මීට වඩා සභාව පිළිබඳවත්, ගරු මන්ත්‍රීතුමන්ලා පිළිබඳවත්, සභාවේ වැඩ කටයුතු පිළිබඳවත් කාලය, ශ්‍රමය කැපකර කටයුතු කිරීමට ධෛර්යය, ශක්තිය ලැබේවා යි කියා පතමින් මම නිහඬ වෙනවා.

**ගරු මන්ත්‍රී නිශාන්ත නන්දන මහතා**

ගරු සභාපතිතුමා, නියෝජ්‍ය සභාපතිතුමනි, මන්ත්‍රීවරුනි, ලේකම්තුමිය, මාධ්‍යවේදී මහත්වරුන් ඇතුළු සියලු දෙනාගෙන් අවසරයි. අද දින අයවැයට විරුද්ධව ඡන්දය දීමට සිදුවීම ගැන කනගාටුවෙනවා. විලේගේ මන්ත්‍රීතුමා පැවසුවත් අපිව පත්කලේ ගමේ අය නෙවෙයි කියලා අපි පක්ෂයට තියෙන යම් ඡන්ද පදනමකින් තමයි සියලු මන්ත්‍රීවරුන් ගැසට් කරලා පත් කරල තියෙන්නෙ. රටේ තියෙන සම්මතයක් විදිහට තමයි සියලු මන්ත්‍රීවරුන් පත් කරල තියෙන්නෙ. අයවැය ගැන කතා කරනවා නම්, මෙම අයවැයෙහි ලක්ෂ එකසිය හැත්තෑ ගණනක් රජයේ ආධාර, අපි සභාවෙන් උපයන දෙයක් නැහැ. එම මුදල් තමයි සභාවේ වියදම් කරන්නේ. ලක්ෂ 25ක් පමණ මුදලක් වසරකට මන්ත්‍රීවරු එකතුවෙලා ඉන්ධනවලටයි, ගමන් වියදම් වලටයි තමයි වියදම් කරන්නේ. කරපු සංවර්ධන කටයුත්තක් නැහැ. ගසක් කපන්න දෙන රුපියල් 1000 රුපියල් 500 රු.250 එකතු කරල තමයි ඉන්ධන වියදම් හා වෙනත් වියදම් දරන්නේ. අපි මොකක්ද කරන සංවර්ධනය. අපි කරන්නේ යූඇන්පීයට කඩේ යනවා, ඔබතුමාලා රෙදි නැතුව කඩේ යනවා. මාසෙකට ඉන්ධන වියදම, වාහන නඩත්තු වියදම බැලුවම සංවර්ධනය කරන්න ඉතුරු වෙන්නේ නැහැ. ආදායම් එන ක්‍රමවේදය හදා ගන්න. එම මුදල් එකතුකර ගන්න කටයුතු කරන්න. එම මුදල් පෞද්ගලික හිතවත්කම් උඩ මගහරින්න එපා. අයවැයෙහි ඇති දෙයක් නැහැ. ඒකයි අපි විරුද්ධ වුණේ. අයවැයේ සල්ලි නැති වුනාට අපි සල්ලි ගේනවා. සංවර්ධනයට වජිර අබේවර්ධන මහතා ගංවතුර වෙලාවේ කෝටි ගණන් වියදම් කළා. විජිත් සහබන්දු මන්ත්‍රීතුමා ලක්ෂ එකසිය පහළොවක් වියදම් කරලා ගෙදර ඉස්සරහ බැම්මක් දැම්මා. ලක්ෂ 85 ක් වියදම් දරලා යටලමත්තේ බැම්මක් දැම්මා. අපට කොහෙන් හරි සල්ලි ගේන්න පුළුවන්. සල්ලි දෙන බන්දුලලාල් බන්ඩාරිගොඩ, විජේපාල හෙට්ටිආරච්චි යන මහත්වරුන්ගේ නම් ඇතුලත් කරලා නැහැ. මුහුණ වත් දැකලා නැති, කිසිම දෙයකට සභාවට ප්‍රයෝජනයක් නැති අයගේ නම් දාලා තියනවා. ඒකට අපි විරුද්ධයි. අපි ආවේ ජනතාවට සේවය කරන්න. නමුත් මේ අයවැය තුළ අපට මුදලක් නැහැ. පක්ෂයට

කඩේ යනවා. ඔබතුමාලා ජනතාවට සේවය කළ යුතුයි. මගේ කතාව අවසන් කරමින් මෙතනින් බැහැරට යන්න අවසර ඉල්ලනවා.

**ගරු මන්ත්‍රී ප්‍රියන්තා ගුණසේකර මහත්මිය**

ගරු සභාපතිතුමා ඇතුළු සමස්ත සභාවෙන් අවසරයි. ඇත්තටම මම මෙම අවස්ථාවේ නැගී සිටියේ විශේෂ ස්තුතියක් කරන්න. දකුණු පළාත් පාලන ක්‍රීඩා උළෙල 2018 නොවැම්බර් 20 දින ශාන්ත ඇලෝසියස් විද්‍යාලයේ ක්‍රීඩා පිටියේදී සිදු කරනු ලැබුවා. ඒ සඳහා අපි කණ්ඩායමක් වශයෙන් අපේ නාගොඩ ප්‍රාදේශීය සභාවේ ගරු සභාපතිතුමා, ලේකම්තුමිය ඒ වගේම කාර්ය මණ්ඩලය ඇතුළු සියළුම මන්ත්‍රීවරුන් සහ මන්ත්‍රීවරියන් සහභාගි වුණා. ඒ සඳහා අපි ක්‍රීඩා වලට සහභාගී වුණා. අපට විශේෂයෙන්ම ඒ පිළිබඳව අපව උනන්දු කරලා අපට ශක්තියක් ලබා දෙන්න ඇප කැප වෙලා වැඩ කටයුතු කළා. එදා ඒ කාර්ය මණ්ඩලයට විශේෂයෙන්ම අපේ ලේකම්තුමිය, සභාපතිතුමා ඇතුළු සියලුම කාර්ය මණ්ඩලයට මගේ ගෞරවනීය ස්තුතිය මේ අවස්ථාවේදී පළමුකොටම පිරිනමනවා. මේ අපේ තරංග මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා. සෑම කොට්ඨාශයකටම ලක්ෂ 25ක වගේ මුදලක් දුන්නයි කියලා. ඇත්තටම මම එතුමා ගැන එහෙම හිතෙනවා නෙවෙයි. සමාවෙන්න වැරදිච්චි තැන් තියෙනවා නම් ඒ වැරැද්ද මම නිවැරදි කරගන්නවා. මමත් හරි. මේවා කතා කරන්නෙ. මොකද මගේ කොට්ඨාසය හැටියට මගේ බලප්‍රදේශය තුළට කිසිම දෙයක් මට මේ වෙනකොට ලැබිල නැහැ. මේ වෙනකොට තනි පුද්ගලයෙකුගේ නිවසට යන්න ලක්ෂ තුන හමාරකට පාරක වැඩ කටයුතු සිද්ධ වෙනවා. මම කියනවා ඒක සාධාරණීකරණය මත ලක්ෂ කීය හරි කමක් නෑ ඒ එන එක සාධාරණව නිවැරදිව යම් කිසි වැඩකට යොදනවා නම්, ඒක සාධාරණ ලෙස කරනවා නම් හොඳයි කියලා හිතෙනවා. මම දන්න ව්‍යාපෘති කරලා ඉවරනම් ලක්ෂ 3 1/2 විතරයි මගේ වසම තුළ මට දකින්න ලැබිලා තියෙන්නේ. ක්‍රියාව කෙරිලා නැහැ මම ඇත්තටම මන්ත්‍රීවරියක් හැටියට කනගාටුවෙනවා. මීටර් 10 දුර කොන්ක්‍රීට් කරල දීල තියෙනවා. මෙච්චර මුදලක්, මෙච්චර සල්ලියක් වැය කරලා වැඩ කටයුතු කරනවා නම් ඇයි අපේ කොට්ඨාස වලට ඒ මුදල නැත්තෙ කියලා මම කනගාටුවෙනවා. කෙසේ වෙතත් අද අයවැය පිළිබඳ ගොඩක්ම සතුටු වෙනවා ඒක වැඩිපුර 5කින් දිනා ගැනීම පිළිබඳවත් සතුටු වෙමින්, ගරු සභාපතිතුමා ඇතුළු සමස්ත මන්ත්‍රීවරුන් සියලු දෙනාටම සුභාශිංෂණ එක් කරමින් නිහඬ වෙනවා. බොහොමත් ස්තුතියි.

**ගරු මන්ත්‍රී ධර්මසිරි ගනේවත්ත මහතා**

ගරු සභාපතිතුමනි, මන්ත්‍රී මණ්ඩලයේ සහ අපි මාධ්‍යවේදී මහත්වරු, ලේකම්තුමිය සහ නිලධාරීතුමා ඇතුළු සෑම සියලු දෙනාගෙන්ම අවසරයි. හයියෙන් ම කතා කරන්න ඕනද? හිමින් කතා කරන්න ඕනද? කියන එක තමයි ප්‍රශ්නෙ තියෙන්නෙ. හයියෙන් කතා කළාම පිලිගන්න විදිහ කොහොමද? හිමින් කතාකලාම පිලිගන්න විදිහ කොහොමද? කියන එක ගැන මට හැඟීමක් නැහැ. පළවෙනිම අයවැයට ඡන්දයක් තියපු, පලවෙනි ඡන්දයකට ආධුනික මන්ත්‍රීවරයෙක් වශයෙන් ඇවිල්ලා මුහුණ දීපු දවසෙ හයියෙන්ම කතා කරන්න අවශ්‍ය වෙන්නේ නෑ කියලා මම තීරණය කරලා හිමිහිට කතා කරනවා. මගේ මන්ත්‍රී මිත්‍රයා තරංග මන්ත්‍රීතුමා, ඇත්තටම මේ සභාවෙ ඉන්න හොඳම යාලුවා. ඉතින් එතුමා අසාර්ථක

මන්ත්‍රී කණ්ඩායම හැටියට නම් කරපු හින්ද තමයි මම කතා කරන්න තීරණය කළේ. නැත්නම්  අද මේකෙ කතා කරන්න හිටියේ නැහැ. මමත් සද්ද නැතිව හිටියොත් මොකද එතුමා අදහස හැටියට ප්‍රකාශ කළේ අසාර්ථක මන්ත්‍රී කණ්ඩායම ලෙස. හැබැයි මේ අපේ උප සභාපතිතුමා දැන් මෙතනින් බැහැර වෙලා ඉන්නේ. එතුමා ප්‍රකාශ කළා ඊයෙ හැන්දෑවෙ සභාපතිතුමා කතා කළේ මොකක්ද කියන එක. මොකද සභාපතිතුමා ඊයෙ හැන්දෑවෙ ගත්ත තීරණය දැන් මේ වෙනකොට වෙනස් වෙච්ච එක ගැන මම සතුටු වෙනවා. වැඩියෙන් වීථි ලාම්පු හතරක් විතර අපට එනවා. නැත්නම් එතුමා තීරණය කළේ 2 ක් දෙන්න. වීථි ලාම්පු ගෙනැල්ලා තියෙන්නේ තවම හයි කරල නැහැ. මේ සභාවට අපි ඇවිල්ලා මාස හතයි වෙන්නේ. මම හිතන්නේ අවුරුදු තුනක් තිබ්බිච්ච ආණ්ඩුවෙන් සිදු නොවුනු දේවල් මේකෙන් බලාපොරොත්තු වෙන්න එපා. සභාපතිතුමාගෙ මූලිකත්වයෙන් කරගෙන ආ මේ කටයුත්තේදී මාස 7ක කාලයක් තුළදී මේ අයවැයට අද දවසේ කතා වෙච්ච දේවල් ටික බැලුවා. ඇත්තටම මට හරිම කණගාටුයි. සභාපතිතුමා ඊයෙ හැන්දෑවෙ සාකච්ඡාවේදී කිව්වේ සියලු දෙනාට වීථි ලාම්පු බෙදලා දෙන්න ඕනේ කියලා. ඒ පිළිබඳව මම සතුටු වුනා. මොකද අපේ වසන්ත මන්ත්‍රීතුමා , අපේ මන්ත්‍රීතුමිය ඉන්නවා ඒ දෙන්නගෙ වීථි ලාම්පු දෙකත් අපේ ගමට එනවා. හැබැයි මම කවදාවත් ඒ දෙන්නට දෙන්න එපාය කියන එක තිබුණෙ නැහැ. දැන් සභාපතිතුමා සභාපතිකමේ අද ඉඳලා තමයි වැඩ කරන්නේ කියලා ප්‍රකාශයක් මට ඇහුණා. ඒකට ඇත්තටම සතුටු වෙනවා. නමුත් එහෙම කතාවට කිව්වට, කියපු විදියටම හැමෝටම යනවනම් මට හරි සතුටුයි. මොකද කට්ටියත් එක්ක එකතු වෙලා මාස හයක්, හතක් ඇතුළත අපට කරන්න පුළුවන් වැඩ සීමාවක් තිබ්බා. අපි දාපු යෝජනාවක් කෙරිලා නැහැ. මම තවම ගමේ වීථි ලාම්පුවක් හයි කර ගෙන නැහැ. ඇත්තටම අපි ඒ ගැන දොස් කියන්නේ නැහැ. මොකද වීථි ලාම්පු ගේන්න කාලයක් ගියා. අවශ්‍ය කරන උපකරණ තීරණය කළා. පහුගිය කාලේ වීථි ලාම්පු සවි කිරීමේදී මතුවූ ගැටළු නැවත ඇති නොවෙන්න අවශය කරන උපකරණ ගෙනාවා.  මේ කාලය තුල පලවෙනි අයවැය ඉදිරිපත් කරලා එතුමා හොඳ දෙයක් කරන්න තමයි බලාපොරොත්තු වෙන්නේ.  අද දවසේ අයවැය අපි ජයග්‍රහණය කළා. හැබැයි කණ්ඩායම් හැඟීමකින් කතා කලාට මම මෙතෙක් දවසක් කණ්ඩායම් හැඟීමකින් සභාවේ වැඩ වැඩකටයුතු කලේ නැහැ. අපි සියලු දෙනාම එක්ක වැඩ කටයුතු කරගෙන යන්න ඕන කියන මතය තමයි මං ගාව තිබුනෙ. ඒ පිළිබඳව වැඩිය කතා කරන්නේ නැහැ. මොකද කාලවේලාව ගියපු නිසා. අපට කතාව තවත් සීමා කරන්න කියලා තියෙනවා. මම කතා ලියාගෙන යනවා. නමුත් කතා කරන්නේ නැහැ.

ඊළඟට වැටුපක් ගැන කතා කළා. ඒ මන්ත්‍රීතුමා මෙතන නැහැ. ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීතුමා එතුමත් මෙතන අත්සන් කරනවා. මේ වැටුප් ලේඛනය මමත් අත්සන් කරනවා. මම මෙතනින් අත්සන් කරලා පඩි පැකට් එක අරන් යනවා. හැබැයි මම මුලින්ම පඩිය අරගෙන, පඩිය පරිත්‍යාග කරපු එක ගැන facebook දැම්මා.  ඊට පස්සෙ මම හිතා ගත්තා ආපහු එහෙම දාන්න ඕනේ නැහැ. අපි කරන වැඩේ සද්භාවයෙන් කලාම ඇති කියලා. මොකද ඒක දුන්නම, ඒක දීලා තියෙන්නේ මට ඡන්දය දීපු නැති කෙනෙකුටයි කියලා ඒ වටපිටාවේ අය දොස් පවරන්න පටන් ගත්තා. එහෙම සමාජයක් මේ තියෙන්නෙ. නමුත් මට අවශ්‍යතාවය තිබුණේ තාත්තා නැති වුන අහිංසක දරු පවුලක් වෙනුවෙන් උදව් කරන්න. මම මෙතනින් වැටුප ගන්නවා. අරන් ගිහිල්ලා ක්‍රියා කරන්නේ අවශ්‍ය තැන් වලට බෙදා දීම වගේ දේවල්වලට තමයි. අපේ ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරයා මොකක්ද කිව්වෙ වැටුප්

ගන්නේ නැහැ කියලා. එයාට වැටුප් එනවා. එයාගේ ගාවට තෙල් ටික ඔක්කොම ටික එයාට හම්බවෙනවා. ඉතින් එහෙම ලැබෙනවා නම් එතුමාට නැහැ කියන්න බැහැ. ඒක නිසා වැටුපක් ගන්නෙ නැති පුද්ගලයෙක් බවට පත් වෙන්නේ, අපි වැටුප් අරගෙන, අපේ සුබ විහරණයට ගන්නෙ නැතුව එක ගිහිල්ලා ගමේ ජනතාව වෙනුවෙන් වියදම් කලොත් තමයි.

ඊළඟට ගරු සභාපතිතුමනි, ක්‍රීඩා පිළිබඳ අපේ උප සභාපතිතුමා කතා කළා. එතුමා විසින් කිව යුතු  කාරණයක් කියවුණේ නැති නිසා මම ඒ ගැන කතා කරනවා. මොකද ලේකම්තුමිය එදා දවසෙම අපිත් එක්ක ඉඳගෙන ලොකු දායකත්වයක් සහයෝගයක් අපට ලබා දුන්නා. ඒ වගේම ඒ වෙනුවෙන් සහභාගී වූ සියලු දෙනාට ස්තුතිය පුද කරනවා. හැබැයි එතුමා සිහිපත් කළා වගේම, අපේ සල්ලි අරගෙන ගිහින්, එදා දවසේ අපි වර්ෂාව නිසා පුදුම අපහසුවයකින් තමයි හිටියෙ. අපිට දීල තිබුන පහසුකම් මොකක්ද? අපට පුටුවක්වත් තිබුණ ද? ඒවා ගැන ප්‍රශ්න කරන නිලධාරීන්ට සහ අමාත්‍යවරයාට දැනුම් දෙන්න කියලා මම ඉල්ලීමක් කරනවා. මොකද අපේ මුදල් ගත්ත නම් අපට එකේ වියදම් ලේඛනයක් ලබා දෙන්න ඕන. අපේ ක්‍රීඩා කල අපේ මන්ත්‍රීවරු, සහෝදර නිලධාරීන් තැගි ගනිද්දී එතනට ගිහිල්ලා අප්පුඩියක් ගහන්නවත් බහින්න බැහැ වතුර. අපේ සල්ලි ටික ගිනිහිල්ල නාස්ති කරන්නෙ නැතිව හිනිදුම ආසනේ සභාවල් ටික හරි, එහෙම නැත්නම් අපේ සභාවෙ සියළු දෙනාගෙ පවුල්වල අයගෙ සහභාගීත්වයෙන් ක්‍රීඩා උත්සවයක් කරන්න මම යෝජනා කරනවා.

ඊළඟට සභාපති තුමනි ඔබගේ කාරුණික අවධානය යොමු විය යුතුම කරුණක් තමයි, උදේ පාන්දර ටිපර් රථ පහක් විතර අපේ පාරේ යනවා. පාරෙ යන්න බැහැ ගඳයි.  මොකද වටවල වතු සමාගමේ නුවරඑළියේ ෆාම් එකේ අපද්‍රව්‍ය තමයි ගේන්නේ. නාකියාදෙණිය පැත්තට තමයි. මම හිතන්නේ අපේ විලේගේ මන්ත්‍රීතුමා දන්නවා ඇති.  කාබනික පොහොරක් නම් කමක් නැහැ හැබැයි අපිට ඒකට යම් කිසි බදු මුදලක් ගන්න පුළුවන් කමක් තියෙනවා නම් අපේ ප්‍රදේශයට ඇතුළු වෙද්දී එහෙම කරමු.  සභාපතිතුමනි, අපි කිහිපදෙනෙක් ඉන්නකොට කටුපොල් ගෙනියනවා. එක නැවැත්තුව ගමන් පොලිසියේ නිලධාරීන් ක්‍රියා කළේ  අපි අත්අඩංගුවට ගන්න තත්වෙට. ඒකට හේතුව තමයි ඒ කටු පොල් ආශ්‍රිත කර්මාන්ත ශාලාවේ නිලධාරීන් මේ පොලීසියේ නිලධාරීන් සියලු දෙනා එක්ක ගිහිල්ලා කොළඹදී හොඳ පාටියක් දුන්නා. එක අපි බය නැතුව කියනවා. ඒ වගේම කටුපොල් ආශ්‍රිතව සේවය කරන ජනතාවට සමාන වැටුපක් දෙන්න පුළුවන් ක්‍රමවේදයකුත් හදන්න කියලා මම ඉල්ලා සිටිනවා.

ඒ වගේම අපේ ගමේ පංසලේ පිංකම් මාලාවක් තියනවා. සියලුම දේවල් අමතක කරලා පක්ෂ, විපක්ෂ සියළු  මන්ත්‍රීවරුන්ට පැමිණ, අටපිරිකර පූජා කරලා ඒ හා සම්බන්ධ වී  2019 සුබ නව වසරක් බවට පත්කරගන්න කියලා සැම සියලු මන්ත්‍රීවරුන්ගේ ආශිර්වාදය ලබා ගන්න ලෙස ගෞරවයෙන් ආරාධනා කරනවා. 2019 වර්ෂය සර්වප්‍රකාරයෙන් සාර්ථක නව වසරක් බවට පත් කරගෙන, ඉදිරි ගමන සාර්ථක කර ගැනීමට සැම සියලු දෙනාටම ශක්තිය, ධෛර්යය, වාසනාව ලැබේවායි කියා ප්‍රාර්ථනා කරමින්, මම නිහඬ වෙනවා.

**ගරු මන්ත්‍රී ගයාන් මධුෂංඛ මහතා**

ගරු සභාපතිතුමනි, පෙර පාසල් උත්සවයක් සඳහා යාමට ඇති බැවින් මට මෙතනින් බැහැර වීම සඳහා අවසර ලබාදෙන මෙන් ඉල්ලා සිටිනවා.

**ගරු මන්ත්‍රී සමන් විතානගේ මහතා**

ගරු සභාපතිතුමා, ප්‍රධාන සියලු මන්ත්‍රීවරුන්ගෙන්, මන්ත්‍රීතුමියන්ලාගෙන් හා ලේකම්තුමියගෙන් අවසරයි. අද දින අයවැය අපි ජයග්‍රහණය කරන වෙලාවේ මම සභාව තුමාට පුංචි අයවැය ජයග්‍රහණයක් කළත්, මෙතෙක් මාස ගානක් තුළ සභාව තුල වෙච්ච අඩුපාඩු තියෙනවා. අපි මන්ත්‍රීවරු 27 දෙනා කණ්ඩායමක් විදියට මෙතෙක් දවසක් ඉතාමත් හොඳින් සභාව ගිහිල්ලා අද තමයි ඡන්දයකට යන්න වුනේ. ඒ සභාපතිතුමාගේ දක්ෂතාවය අනුව තමයි මෙතෙක් කලකට ඡන්දයට නොගිහිල්ලා අපි ඉතාමත් හොඳින් සභාව ගෙන ගියා. එහිදී ගමට සංවර්ධනය ගෙන යාමේදී සභාව තුළින් අපට උදව් කරලා තියෙනවා. නමුත් මාස 4 ඇතුළත ම අපේ කොට්ඨාශය තුලට වීදි ලාම්පු දහයක් පමණයි දාගන්න හැකිවුණේ. ගරු සභාපතිතුමනි, ඔබතුමත් එක්ක අපි කණ්ඩායමක් විදියට රැඳී ඉන්නවා. ඒකත් මතක් කරමින්, අඩුපාඩුවක් තියෙනවනම් කියන්න වෙනවා. ඔබතුමා ඉතාමත් හොඳින් වැඩ කටයුතු කළා. විසිහත් දෙනාටම සැලකුවේ නැත්තෙ නැහැ. නමුත් අපට වීථි ලාම්පු ටික හොයාගන්න බැරි තත්ත්වයට පත් වෙලා තියෙනවා. ඒකත් මේ වෙලාවේ සිහිපත් කරමින්, දැනට කොට්ඨාසය තුළ වීදි ලාම්පු දහයක් තමයි දාලා තියෙන්නේ. කොට්ඨාස මන්ත්‍රීවරයාට දැනුවත් කිරීමක් කරන්න කියලා අපි දිගින් දිගටම ඉල්ලීමක් කළා .මොකද අපි වීථි ලාම්පු දානකොට අපේ පක්ෂ, විපක්ෂ ප්‍රශ්නයක් නැහැ. පළාත් සභා මන්ත්‍රී ඉසුරු දොඩංගොඩ මැතිතුමා විසින් කොතලාවල පාසලට ලක්ෂ 10 ක මුදලක් ලබා දුන්නා. මේ වෙලාවේ ඉතාමත් ගෞරවයෙන් ඒක සිහිපත් කරන්න ඕන. ඒ වගේම සිසිර කුමාර මැතිතුමා විසින් මගේ ඉල්ලීමකට උඩුගම ප්‍රාථමික විද්‍යාලට රු. 50000.00 ක මුදලක් ලබා දුන්නා. ඒ වගේම අපේ විපක්ෂයේ ජ්‍යේෂ්ඨ මන්ත්‍රීවරුන් කිව්වා. දැනට ගෙවල් සියල්ලටම විදුලිය ලබා දීලා තියෙන්නෙ කියලා. නමුත් මමත් මේ වන විට ඉසුරු දොඩන්ගොඩ මැතිතුමාගේ ප්‍රතිපාදන වලින් ගෙවල් නමයට විතර විදුලිය ලබාදෙන්න කටයුතු කරලා තියෙනවා. ඒකත් මේ වෙලාවේ සිහිපත් කරන්න ඕන. නමුත් අපි ගරු සභාපතිතුමාගෙන් ඉල්ලීමක් කරන්න ඕන. සමහර වෙලාවට සභාව විදියට අපි 15 දෙනාගෙන් කිහිප දෙනෙක් නොදැනුවත්වම මෙතන වැඩ කටයුතු සිදුවෙනවා. මන්ත්‍රීවරු විදිහට අපි ඡන්දයෙන් ආවද, ලයිස්තුවෙන් ආවද කියන එකට අපේ ප්‍රශ්නයක් නැහැ. මෙතන අපි සියලු දෙනා එකා විදිහට වැඩ කරන්න ඕන. වැඩක් කරනකොට අපි මන්ත්‍රීවරු විදිහට අපට ලැජ්ජ වෙන්න වෙලා තියෙනවා. මොකද කොට්ඨාශය තුලදී මේ අසවල් තැන මෙහෙම සිද්ධ වෙනවා ඔය ගොල්ලො දන්නෙ නැද්ද, ඔයගොල්ලො ඉල්ලීම් කරන්නැද්ද කියලා අපෙන් අහනවා. ගරු සභාපතිතුමනි, අපිත් දැනුවත් නැති වැඩ මේ වෙලාවේ මේ සභාවේ කෙරෙනවා. මට මේ වෙලාවේ එකින් එකට කියන්න බැහැ. කිව්වොත් අපේ මන්ත්‍රීවරු අමනාප වෙන තැනුත් තියෙනවා. ඒක නිසා මම ඔබතුමාගෙන් ඉල්ලන්නේ අපි ගරු කරන නායකයා විදිහට අපි ඉල්ලීමක් කරන්නේ මන්ත්‍රීවරු විදිහට අපටත් දැනගන්න තියන්න මේ දේ මෙහෙම සිදු වෙනවා කියලා. ඔබතුමා අපි පහළොස් දෙනා කෙරේ විශේෂ අවධානයක් යොමුකර අපට වීථි ලාම්පු ටික සකස් කරලා දුන්නා. ඒ වගේම ඉල්ලීමක් කරන්න ඕන. උඩුගම පෙරහැර ගැන. පාර දෙපැත්ත සුද්ද කර

ගන්න ස්වාමින්වහන්සේ ඉල්ලීමක් කළා මේ සභාවට ලිපියක් එව්වයි කිව්වා. ඒ ගැනත් ඔබතුමාගේ අවධානයට යොමු කරනවා. මොකද ජනවාරි 26 පෙරහැර තියෙනවයි කියලා කිව්වා. ඒ ගැනත් අවධානය යොමු කරන්න කියලා මතක් කිරීම සිදු කරමින්, අපි පක්ෂ විපක්ෂ බේද අමතක කරලා මෙතනට ඇවිල්ලා ඉදිරියට වැඩ කටයුතු කරමු. අපේ ජොෂ්ඨ මන්ත්‍රීවරුන්ට අපි කොයි වෙලෙත් ගරු කරනවා. ඒ වගේම අපි නවකයින් විදිහට අපටත් ඔබතුමාලා කතා කරනකොට අපේ නවක මන්ත්‍රීවරුන්ට අපහාසාත්මක විදිහට කටයුතු කරන්න එපා. මොකද අපි ජේෂ්ඨත්වය ගරු කළා. අපෙන් අඩුපාඩුකම් සිදු වෙන්න පුලුවන්. නවකයන් විදියට අපෙන් අඩුපාඩුකම් සිදුවෙන්න පුළුවන්. ඒක පෙන්නලා දෙන විදිහක් තියෙනවා. ඒක නිසා අපි ඉල්ලීමක් කරන්නේ අපි නවකයින් විදියට අපි ජොෂ්ඨත්වයට ගරු කළත් , අපි 27 දෙනාට ම එක සමාන අයිතියක් තියෙනවා. ගරු මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලීමක් කරන්නේ ඔබතුමාලා මේකෙ නිකන් කුපිත කරලා, අවුල් කරලා යන විදියට වැඩකටයුතු කරන්න එපා. අයවැය සඳහා ඡන්දය දුන් සියලු දෙනාට අපේ ගෞරවය පුද කරන ගමන්, අපේ ආණ්ඩුව නැවත ආණ්ඩුව බවට පත් වෙන මොහොත ළඟ බව සිහිපත් කරමින් ඉදිරියේදී නව අගමැතිතුමා යටතේ, ගම තුළට නව සංවර්ධන කටයුත්තක් ඉදිරිපත් කරන බව මතක් කරමින්, ඔබ සියලු දෙනාට ස්තූතිය පුදකරමින්, මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු මන්ත්‍රී වසන්ත කුමාරගේ මහතා**

ගරු සභාපතිතුමා, මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියන්ලා, ලේකම්තුමිය ඇතුළු සියලු දෙනාගෙන් අවසරයි. නාගොඩ ප්‍රදේශයේ සභාපති කෙනෙක් පත් වෙනවාට මම තමයි මුලින්ම කැමැති වුණේ. අප පක්ෂය පසුබැමට ලක් වුවත්, පොදු ජන පෙරමුණ ජයග්‍රහණය කළත්, සභාපතිතුමා පත්වූවාට පසු දිගටම අපි සහයෝගය ලබා දුන්නා. නමුත් මෙතුමාගේ මංගල අයවැය දේශපාලන න්‍යාය පත්‍රයට සීමා වූවා දැයි හැඟෙනවා. මාපලගම මංසන්ධියේ ඉදිවෙන පැති බැම්ම ඉතාමත් වටිනවා. මාර්ගයට ඉඩ කඩ වැඩි වෙනවා. ඒ වෙනුවෙන් දායක වූ මාර්ග සංවර්ධන අධිකාරියට, සභාවේ ගරු සභාපතිතුමා ඇතුළු සියලු දෙනාට අපේ ගෞරවය පුද කරනවා. වැසිකිලි පද්ධතිය ඉදිකිරීම පිළිබඳව දැනගන්න කැමතියි. ඒ පිළිබඳව සොයා බලන්න කියල ඉල්ලා සිටිනවා. මාපලගම වෙළඳ සංකීර්ණයේ ඉහළ මාලයේ ටෙන්ඩර් කරන ලද කඩ කාමරයේ දොර කැඩිල තියෙන්නෙ. ඒ අය දිගටම බදු මුදල් ගෙවා ඇති නිසා, ව්‍යාපාරය කරගෙන යාමට හැකිවන පරිදි දොර සකස් කර දෙන්න කියා ඉල්ලනවා. මූලන, වාඩිය කන්ද පාර ප්‍රාදේශීය සභා පාරක්. එම මාර්ගයේ එක බෝක්කුවක් කැඩිලා. ඉහත තාවකාලික පිළියමක් යොදා තියෙනවා. නයිගුලන, මියගිය කරෝලිස් මහත්මයාගේ නිවස ආසන්නයේ බෝක්කුව කැඩිල තියෙන්නෙ. ලොකු වාහනයක් ගියොත් කඩාගෙන යන්න පුළුවන්. ඔබතුමා මේ පිලිබදව දැනුවත් ඇති. මෙම මාර්ගය සකස් කරලා දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

පසුගිය මැතිවරණයේදී අපට ලැබුණු ඡන්ද ප්‍රමාණය අනුව ප්‍රතිශතය අනුව අපි පක්ෂයෙන් නම් කරළා තියෙනවා. අපි මිනිසුන්ගේ දුකේදී, සැපේදි ඉන්නවා. ජනතාවත් එක්ක ඉන්නවා. ඔබතුමාලා මහින්ද රාජපක්ෂ මහත්තයා රටේ අගමැති කරලා කියලා මිනිස්සුන්ට බොරු පොරොන්දු දීලා තමයි ඡන්දේ දිනුවේ. දැන් ඒ මිනිස්සු ගත්ත තීරණ ගැන දුක් වෙනවා. අද රට අරාජිත කරල තියෙන්නෙ. මේ තත්වයට රට පත් කරපු මරාටයි, සිරාටයි දෙන්නටම දඬුවම් ලැබෙයි. මිනිස්සුත් එක්ක ඉන්න මහජන නියෝජිතයන් හැටියට අපිට දුකයි.

ජනතාවගේ බදු මුදල් තමයි අපිට වියදම් කරන්න ලැබෙන්නේ. ලක්ෂ හැත්තෑවක මුදලක් අපට ලැබුණා. ඒව තමයි අපි වියදම් කරන්නේ.

පසුගිය කාලයේ අපේ කොට්ඨාශයේ මන්ත්‍රීතුමා වන ධර්මසිරි ගනේවත්ත මහතා ශ්‍රමදානයක් කළා. සභා අරමුදලින් තමයි කළේ. එතුමාට අමතක වුනා. තවත් මන්ත්‍රීවරයෙක් කොට්ඨාසයට ඉන්න බව. අඩුම තරමින් සභාපතිතුමා වුවත් ඒ බව දැනුවත් කළේ නැහැ. සභාපතිතුමා සමග එකට වැඩ කරනවා. යූඇන්පී ද, ජේවීපී ද මොන පෙරමුණද බලන්නේ නැහැ. අපිත් ඉල්ලීම් කරලා තියෙනවා. අපට උදව් කරන්න කියලා ඉල්ලනවා. ඔබතුමාගේ අයවැය යෝජනා ටික ක්‍රියාත්මක කරන්න. එදාට අපි සතුටු වෙන බව පවසමින්, මම නිහඬ වෙනවා.

**ගරු මන්ත්‍රිනී අරුණ ශාන්ති මහත්මිය**

ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි. නවක මන්ත්‍රිවරියක් වශයෙන් සභාවට පැමිණ මංගල අයවැයට විපක්ෂව ඡන්දය දීමට සිදුවීම ගැන කණගාටු වෙනවා. මමත් යෝජනා ගණනාවක් මුල සිටම ඉදිරිපත් කළා. මගේ දෙවැනි යෝජනාව තමයි. උඩුගම පොළ සංවර්ධනය. වෙරංග මන්ත්‍රීතුමා ඉතා වෙහෙසිලා එම වැඩකටයුතු කරනවා. නමුත් එය භාවිතා කළ හැකි තත්වයට පත් කරගන්න බැරිවෙලා තියෙනවා. මාපලගම පුස්තකාලය තෙමෙනවා. අලුත් නිලධාරීන් වෙනසක් කරලා තියෙනවා. නමුත් එය පාටිෂන් කර සකස් කර දෙන්න කියලා ඉල්ලනවා. සනීපාරක්ෂක පහසුකම් සපයලා දෙන්න කියලා ඉල්ලනවා. මාපලගම පිට්ටනියේ ගල් ගොඩක් දාලා තියෙනවා. අද වෙනකල් ඉවත් කරගෙන නැහැ. එය ඉවත් කරන්න කියලා කියන්න. පාරවල් පිරිසිදු කරලා දෙන්න කියලා ඉල්ලනවා. මිනිස්සු ශ්‍රමදාන කරන්න දැන් කැමති නැහැ. සභාවෙන් කරල දෙන්න කියලා ඉල්ලීම් කරනවා. මම ලයිට් ඉල්ලුවා. නමුත් ඒ ප්‍රශ්නය තවම විසඳිලා නැහැ. ඔබතුමා නායකයෙක් වශයෙන් අපක්ෂපාතී තීරණ ගෙන වැඩ කටයුතු කරන්න කියල ඉල්ලා සිටිනවා. අපේ සභාවේ සේවකයෙක් රාජ්‍ය සේවා කණ්ඩායමට තේරී පත්වෙලා තියෙන එක ගැන අපට සතුටුයි. මගේ මහත්තයා ක්‍රීඩා අංශයේ වැඩ කරන නිසා මම උදව්වක් කරන්නම්. එම සේවකයාගේ විස්තර ලබාදෙන්න. ඉදිරි වර්ෂයේදී හොඳ නායකත්වයක් අරගෙන වැඩ කිරීමට ගරු සභාපතිතුමාට හැකියාව ලැබේවායි ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා.

**ගරු මන්ත්‍රී චන්ද්‍රසිරි වනිගරත්න මහතා**

ගරු සභාපතිතුමනි අවසරයි. මුළු රටම ප්‍රශ්ණාත්මක මොහොතක සිටින මේ වෙලාවේ පුංචි ආණ්ඩුවේ නව ප්‍රාදේශීය සභා අයවැය ඡන්දයෙන් සම්මත වුණා. ඒ ගැන මම සතුටු වෙනවා. විපක්ෂයක් අවශ්‍යයි. අපේ විපක්ෂයේ මන්ත්‍රීවරු අයවැයට විපක්ෂව ඡන්දය ප්‍රකාශ කළේ, මෙයට විරුද්ධත්වයක් අවශ්‍යයි කියලා හිතාගෙන තමයි. මමත් යෝජනා රාශියක් ඉදිරිපත් කළා. ඒ සියල්ලම යම් ප්‍රමාණයක් ඉටුකර දීම පිළිබඳව මම කෘතඥතාවය පළ කරනවා. නමුත් එය ජනතාවගේ ඉල්ලීම් වලට සෑහෙන්නේ නැහැ කියලා මතක් කර සිටිනවා. සභාවට ලැබෙන තියෙන මුදල් වල අවසන වගකීම නිලධාරීන් දැරිය යුතුයි. මුදල් ලැබුනොත් තමයි සංවර්ධනය කරන්න පුළුවන්. ඒ පිළිබඳව දැනුවත් වී සිටීම අවශ්‍යයි. ඒ පිළිබඳව සභාපතිතුමා, නිලධාරීන් දැනුවත් කිරීමට අවශ්‍ය කටයුතු කළ යුතුයි. සහන බෙදා දීමේදී සාධාරණව කටයුතු කරන්න කියල ඉල්ලා සිටිනවා. ප්‍රාදේශීය සභාවට වැඩිම ඡන්දදායකයින් පිරිසක් ඉන්න,

වැඩිම භූමි ප්‍රදේශයක් තියෙන , වැඩිම අපහසු මාර්ග ප්‍රදේශයක් තියෙන, කොට්ඨාශයක් ලෙස, හිටපු සභාපති තුමා සමග උරෙනුර ගැටෙමින් කටයුතු කල , 59% ක ඡන්ද ප්‍රතිශතයක් ලබා ගනිමින්, ජනතාව අපි කෙරෙහි බලාපොරොත්තු තබා තියෙනවා. වැඩිම ග්‍රාම සේවා වසම් ගණනක් තියෙන්නේ මගේ කොට්ඨාශයේ. ඒක නිසා බල්බ් තුනක් මන්ත්‍රීතුමන්ලා ට දෙනවා නම්, ඊට වැඩි සහනයක් ලැබිය යුතුයි. ඒ වගේම විපක්ෂයක් තිබිය යුතුයි. එවිට තමයි අපේ වැරදි හඳුනාගෙන කටයුතු කරන්නේ. අද රටේ ඇතිවෙලා තියෙන තත්වය විනිශ්චයකාරවරුන් ට හොඳ බුද්ධි කලම්බනයක් ඇති කරන්න හේතුවෙලා තියෙනවා. අපේ නායකයින් දෙන උපදෙස් අනුව තමයි අපි කටයුතු කරන්නේ. ඒ නිසා නිවැරදි උපදෙස් දීල කටයුතු කරන්න නායකයින්ගේ වගකීමක් තියෙනවා. මේ රටේ ජීවනාලිය වන වතු කම්කරුවෝ සටන් කරන්නේ රුපියල් දාහක් ඉල්ලලා. නායකයින්ට වගකීමක් තියෙනවා මේ ගැන සලකා බලන්න. සභාවෙ යෝජනාවක් ලෙස මෙය රටේ නායකයින්ට ඉදිරිපත් වෙනවනම් හොදයි.

බංගම පාරේ අක්කර 80 ප්‍රදේශයේ, ගාලු කෝරළය ආරම්භ වන ස්ථානයේ ප්‍රාදේශීය සභා නාම පුවරුවක් සවි කිරීමට කටයුතු කරන්න කියලා ඉල්ලනවා. ගාලු පාරේ 18 බෞද්ධ මධ්‍යස්ථානය අසල සවිකර ඇති නාම පුවරුව විහාරස්ථානයට ගැටළුවක් පවතින බැවින් ගරු හාමුදුරුවන් වහන්සේ විසින් එය වෙනස් කරලා දෙන්න කියලා ඉල්ලීමක් කරා. එය සභාපතිතුමාට මේ වෙලාවේ මතක් කර සිටිනවා. අද රටේ ඇතිවෙලා තියෙන තත්ත්වය මත හොඳ තීරණයක් ලබා ගෙන ජනතාවට යහපතක් කරන්න කියල පාර්ථනා කරනවා. 2019 වර්ෂයේ ඉතා හොඳ අයවැයක් ඉදිරිපත් වෙලා ක්‍රියාත්මක කරන්න පුළුවන් ශක්තිය, ධෛර්යය රටේ නායකයින්ටත්, සභාපතිතුමාටත් ලැබේවා කියල ප්‍රාර්ථනා කරනවා. සියලු දෙනාටම ලබන්නාවූ නව වසර වාසනාවන්ත නව වසරක් වේවායි පතමින්, මම නිහඬ වෙනවා. ඔබ සැමට තෙරුවන් සරණයි.

**ගරු මන්ත්‍රිනී කේ කේ අයි නෙරංජලී මහත්මිය**

ගරු සභාපතිතුමාගෙන්ද ලේකම්තුමිය ඇතුළු සියලුම මන්ත්‍රීවරුන්ගෙ, මන්ත්‍රීතුමියන්ලාගෙන් අවසරයි. මම නියෝජනය කරන උඩවැලිවිටිය ප්‍රදේශයේ ග්‍රාම සේවා වසම් හතරක් තියෙනවා. ඒ හතරෙන් 2019 සංවර්ධන යෝජනා වලට, ග්‍රාම නිලධාරී එක වසමකින් යෝජනා දෙකක් තමයි තෝරාගෙන තියෙන්නෙ. අනෙක් වසම් තුනෙනුත් එකක්වත් සංවර්ධන යෝජනාවට ඇතුලත් කර ගත්ත නම් අපේ ලක්රුවන් සම්පත් මන්ත්‍රීතුමාට හොඳයි කියලා හිතනවා. අනිත් කාරණය තමයි මම කීප වතාවක්ම සඳහන් කළා. පාර දෙපැත්තේ මාන පඳුරු වැවිලා. වැස්සක් වැස්සොත් ඊට පහුවෙනිද ඒ පාරේ යන්න බැහැ. පසුගිය දිනක ඩිලිවරි වෑන් රථයක් ඒ ප්‍රදේශයෙන් එන්න ඇවිල්ලා පාරේ අයින් කරන්න ගිහිල්ලා අනතුරට ලක් වෙලා තිබුණා. මේ එක් ලක්ෂ ගණන් අත ඇරලා ඉන්න, නොදී ඉන්න මොහොතක, ඒ පාර සංවර්ධනය කරලා දෙන්න කියලා මම ඔබතුමාගෙනුත්, ලක්රුවන් මන්ත්‍රීතුමාගෙනුත් ඉල්ලා සිටිනවා. ඒ වගේම තමයි හෙට දින සුනඛයන් හට ජලභීතිකා එන්නත් කරනවා. ඒ වෙනුවෙන් ප්‍රජාශාලාව ඉල්ලා තියෙනවා. අපි යතුරු ලබාගන්න ඕන සමෘද්ධි සංවර්ධන නිලධාරීගෙන්ද කියලා දැනගන්න ඕන. එක මන්ත්‍රීවරයෙක් කිව්වා ගෙවල් වල වතුර පාරට හරවනවා, කාණු දිගේ යනවයි කියලා. මටත් ඒ පිළිබඳ පැමිණිලි කීපයක් ලැබුනා. එක නිවසක වළං හෝදන වතුර ගලාගෙන යන්නේ පාරදිගේ. එතැන කඳු බෑවුමක් තියෙනව. ඉතිං

ඒ ජනතාව කියනවා අපි කෝල් එකක් දීලා කිව්වොත් ඒ නොම්මරෙත් එක්ක අර ගෙදරට ගිහිල්ලා කියාවි කියලා. තත්ත්වය ඒක නිසා ඔබතුමා මේ ගැන මොකක් හරි තීරණයක් ගන්න. ඒ වගේම තමයි අපේ මන්ත්‍රීතුමා හොඳ වැඩක් කරලා තිබුණා. ගල්ලෙනමුල්ල මාර්ගයේ පස් දමා සංවර්ධනය කරලා තිබුණා. ඒ නිසා ගමනාගමනය පහසු වෙලා තියෙනවා. ඒ ගැනත් ස්තූතිවන්ත වෙනවා. ඒ වගේම 2019 වසර සියලු දෙනාටම සුභ නව වසරක් වේවා කියලා ප්‍රාර්ථනා කරමින්, මගේ කතාව අවසන් කරනවා. සියළු දෙනාටම ස්තූතියි.

**ගරු මන්ත්‍රිනී නෙලී වක්වැල්ල මහත්මිය**

ගරු සභාපතිතුමා ඇතුළු සියලු මන්ත්‍රීතුමන්ලාගෙන් සහ මන්ත්‍රීතුමියන්ලාගෙන්, ලේකම්තුමිය, වාර්තාව කරන මහත්මයාගෙන් අවසරයි. ඇත්තටම මේ අවස්ථාවෙ අපේ මන්ත්‍රීතුමන්ලා , මන්ත්‍රීතුමින්ලා සියලු දෙනා අතින් කියවෙන ඕන කරුණු කාරණා සියල්ල කියැවුණා. අපට කියන්න විශේෂ දෙයක් නැහැ. නමුත් අයවැය ගත්තම පොඩි කණගාටුවක් ආවා. නමුත් අපි 27 දෙනාම එක වගේම වැඩ කරමු. අපේ සභාපතිතුමා කිව්වා ජනවාරි මාසේ දෙවෙනිදා හොඳ පින්කමක් කරලා 20 වෙනිදා ළමා නිවාසෙට දානයක් දීලා මේ ඔක්කොම වස්දොස් ඇරලා හොඳ වැඩපිළිවෙලකට යමු. මහ ඇමැතිතුමා ශාන් විජයලාල් මැතිතුමා පසුගිය දහ වෙනි මාසෙ අපිව කැඳවලා, සභාවලින් යම් කිසි උදව්වක් ඔබලාට කෙරෙන්නෙ නැති නිසා පුංචි උදව්වක් වශයෙන් කියලා පාට, පක්ෂ බලන්නේ නැතුව 25 දෙනෙකුට ශිෂ්‍යා ආධාර අරන් දුන්නා. විසි පස් දෙනාට දෙලක්ෂ පනස් දාහක් විතර ලැබුණා. ටොයිලට් ආධාර, ස්වයං රැකියා කරන්න ආධාර විසි පස් දෙනෙකුට ලබා දුන්නා. ඒ වෙලාවෙ පුංචි සහනයක් ලැබුණා. එක අගය කළ යුතුයි. ගමක දෙන්න ඕන පුද්ගලයන්ට තමයි ලබා දුන්නේ. හිතවතුන්ට ලබා දුන්නේ නැහැ. පක්ෂයක් බැලුවේ නැහැ. මම මෙච්චර කල් දේශපාලනය කළාට පොදු වැඩ තමයි කරලා තියෙන්නේ. පොදු වැඩ කරන්න හිතුවොත් කොහොම හරි කරනවා. ඒ වගේම ගම්පෙරළියෙන් විශාල වැඩ කොටසකට මුදල් ප්‍රතිපාදන දාලා තිබුනා. මේ පොඩි අයහපත් කාලගුණය නිසා, අකරතැබ්බ නිසා එය නතර වෙලා තියෙනවා. එයින් රුපියල් ලක්ෂ 10 ක එක පාරක් කරන්න ලැබුණා. පාර කොන්ක්‍රීට් කරන දවසේ අපේ සභාපතිතුමා ගියා. සභාපතිතුමා යන්න හේතුවුනේ සියළු දේම ප්‍රාදේශීය සභාවට නිසා, ඇලේ ගංවතුරට මී හරකෙක් ඇවිල්ලා මැරිලා හිටියා. ඒ සම්බන්ධයෙන් මට දුරකථන ඇමතුමක් ආවා. මම ඒ පිළිබඳ සභාපතිතුමා දැනුවත් කළා. සභාපතිතුමා විජිත් මන්ත්‍රීතුමාට කියන්නම් කියලා කිව්වා. විජිත් මන්ත්‍රීතුමාට උපදෙස් දීලා තිබුණා බැකෝ යන්ත්‍රයක් යොදවලා මීහරකා වලලන්න කියලා. එතන හිටිය අය ආවෙ නැහැ. අපේ කොන්ක්‍රීට් දාන්න හිටිය අය තමයි වලලාලා තිබුනේ. එයට රු. 2500 ක මුදලක් අනුමත වෙලා තිබුණා. අපට සභාවක් හැටියට ඒ වගේ පොදු වැඩ කරන්න වෙනවා. ඒ වගේම අපට පාරේ යන්න බැහැ. ලයිට් එක නැහැ. දුන්කන්ද පාර ගොඩවෙන තැන ම කොන්ක්‍රීට් කරපු එකේ පාර අයින කඩාගෙන ගිහිල්ල තියෙනවා. ඒකෙ බර වාහනයක් ගියොත් ලොකු අනතුරක් වෙන්න පුළුවන්. ගරු සභාපතිතුමනි, ඒක නිසා බර වාහන යම් තහනම් කරොත් මාර්ගය බේරගන්න පුළුවන් වේවි. නැත්නම් මෙතනින් කඩාගෙන ගියොත් දුන්කන්දට යන මාර්ගය නැති වෙන්න පුළුවන්. එහෙම වුණොත් අපට කනත්තගොඩ මාර්ගයෙන් තමයි දුන්කන්දට යන්න වෙන්නේ. ඒ නිසා ඒ ගැන මතක් කරනවා.

ඒ වගේම පහුගිය දවස්වල බද්දේගම කුම්මේ ක්‍රීඩාංගණයේ සහ ඇලෝසියස් විද්‍යාලයේ ක්‍රීඩා පිට්ටනියේ ක්‍රීඩා උත්සවයක් තිබුණා. මම ඒ දෙකටම සහභාගි වුණා. මොකද මේකෙන් අපි යම්කිසි මුදලක් ගන්නවා නම් ඒ වගේ පොදු දේවල් වලටත් සහභාගී විය යුතුයි. ඇත්තටම අපේ සභාපතිතුමා නිතරම දෝෂාරෝපණයට ලක් වෙන්නේ අපේ මේ නිලධාරීන්ගෙන් පොඩි පොඩි අකරතැබ්බ සිද්ධ වෙන නිසා. මම ඒ ගැන කතා කරන්නේ නැහැ. මට කිහිප දෙනෙක් කිව්වා ඒ ගැන කතා කරන්න එපා කියලා. 2019 වර්ෂයේදී අපේ සභාපතිතුමාට මම ආයාචනා කරනවා, අපි මේ සියලු ගිණුම් ගැන බැලුවහම ගිනුම් වල පොඩි පොඩි අඩුපාඩුකම් තියෙනවා. හැමදාම එහෙම අඩුපාඩුකම් එනකොට පොඩි පොඩි මත ගැටුම් ඇති වෙනවා. ඒ නිසා ඒවාත් නිවැරදි කරගෙන 2019 අපේ මේ දානමය පින්කමක් කරලා, ලබන මස සභාවෙ ඉඳලා අපි 27 දෙනාම එකමුතුව , ගැටලුවක් ඇති නොවේවායි ප්‍රාර්ථනා කරනවා. ඒ වගේම දානය සඳහා අවශ්‍ය දෙයක් තියෙනවා නම් අපට කියන්න. අපිත් උපරිම සහයෝගය දෙන්නම්. මේ සභාවල මියගිය සභාපතිවරුන් ඉන්නවා, මෙතනින් උසස්වීම් තනතුරු ලබපු අය ඉන්නවා. ඒ අයව දීර්ඝ ආයුෂ පතන්නන්, මියගිය අයට පින් අනුමෝදන් කරන්නත් අපේ වැඩසටහන කරගෙන යන්න හැකියාව ලැබේවායි ප්‍රාර්ථනා කරනවා. එමෙන්ම ලබන්නාවූ 2019 වර්ෂය කිසිදු කරදරයකින් තොරව සියලු කටයුතු සිදු කර ගැනීමට හැකියාව ශක්තිය ලැබේවායි ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා.

**ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා**

ගරු සභාපතිතුමනි, 2019 අයවැය පිළිබඳ ව කිසි කෙනෙක් කරුණු ඉදිරිපත් කළේ නැහැ. ප්‍රාදේශීය සභාවේ ආදායමට සරිලන පරිදි, අපේ සම්පත්වලට සරිලන පරිදි, ගරු සභාපති තුමා ප්‍රමුඛ ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලය විසින් 2019 අයවැය සකස් කර ඉදිරිපත් කිරීම පිළිබඳව ඔවුන්ට ස්තුතිවන්ත වෙනවා. ලක්ෂ 3 ½ ක පමණ ආදායමක් සහ ලක්ෂ 5 ක පමණ මාසික වියදමක් පවතින අපේ සභාවේ අයවැය සැකසීම ලේසි පහසු නැහැ. සභාවේ ආදායම පිළිබඳව සභාපතිතුමාට චෝදනා එල්ල වුණා. නමුත් එතුමන් මේ කෙටි කාලය තුළ ආදායම වැඩි කරගන්න ලොකු වැයමක් දැරුවා. සභිකයින් දහතුනක් හිටපු සභාවේ දැන් සභිකයින් 27 දෙනෙක් ඉන්නවා. මන්ත්‍රීතුමන්ලා කවුරුවත් ඉන්ධන දීමනා එපා කියලා නැහැ. ඒ සඳහා ලොකු පිරිවැයක් දරන්න සිදුවෙලා තියෙනවා. අයවැය සඳහා මන්ත්‍රීවරුන්ගෙන් එක්කෝටි හැට අට ලක්ෂයක යෝජනා ඉදිරිපත් වෙලා තියෙනවා. එම මුදල් සොයාගැනීමට අපි සියලු දෙනාම සැදී පැහැදී කටයුතු කළ යුතුයි. මම බලාපොරොත්තු වුනා ආදායම් උත්පාදන මාර්ග කිහිපයක්. එසේ ඉදිරිපත් නො වුණත්, අපි පක්ෂ, විපක්ෂ සියලුදෙනාටම ආරාධනා කරනවා. අපේ ආදායම වැඩිකර ගැනීමට යම් කිසි ක්‍රියාමාර්ගයක් ගත යුතුයි කියලා. ඊළඟට පළාත් පාලන මැතිවරණයේදී මේ ඡන්ද ක්‍රමය ක්‍රියාත්මක වුනොත්, රට ඉදිරියට ගෙනයාමට අපහසු බව මම මතක් කරනවා. මේ තරම් විශාල මන්ත්‍රී පිරිසක් පත් කර ගෙන, ජනතාවගේ බදු මුදලින් දීමනා ගෙවාගෙන, රට ඉස්සරහට ගෙනියන්න අමාරුයි. මේ මැතිවරණ ක්‍රමය වෙනස් කරලා, රටට හිතකර ආර්ථිකයට ගැලපෙන මැතිවරණ ක්‍රමයට යායුතුයි. සභාපතිතුමා අමාරුවෙන් හරි අපි රුපියල් ලක්ෂ පහළොවක් ලබා දුන්නා. ඒ මුදලින් මම උඩවැලිවිට්ටිතලාව ශ්‍රමදාන මාවතකොරි පස් දාලා සංවර්ධනය කළා. ගල්ලෙනමුල්ල ප්‍රධාන මාර්ගයට කොරිපස් දාලා සංවර්ධනය කළා. නෙරංජලී මහත්මියගේ යෝජනාවක් ලෙස නම් කළ ගල්ලෙනමුල්ල

අකුල්කන්ද මාර්ගයේ කන්ද පහත් කර ජනතාවට යන්න පුළුවන් වන ආකාරයට සකස් කරලා දුන්නා. විපක්ෂයේ මන්ත්‍රීවරු ගම්පෙරළිය වැඩසටහන යටතේ යෝජනා ඉදිරිපත් කර ක්‍රියාත්මක කරන විට, කොට්ඨාස නියෝජනය කරන අපේ කිසිම මන්ත්‍රීවරයෙකුට ආරාධනා කළේ නැහැ. යෝජනා ගත්තේ නැහැ. රැස්වීමකටවත් ආරාධනා කළේ නැහැ. මේ සභාවේ සොච්චම් මුදලක් දුන්නේ නැහැ කියලා කතා කරනවා. අපට ඒවට ආරාධනා කරන්න තිබුණා. ප්‍රාදේශීය සභාවේ පාලක පක්ෂයත් එහෙම තමයි. බද්දෙගම ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයකුගේ නිවසට මනුෂ නානායක්කාර මැතිතුමා ගේ සහෝදරයා පහරක් එල්ල කරළා තිබුණා. අපි පාලක පක්ෂයේ සියලු දෙනාම එය තරයේ හෙළාදකිනවා. ඕනෑම කෙනෙකුට තමන්ට කැමැති දේශපාලන පක්ෂයකට මත ඉදිරිපත් කිරීමට ප්‍රජාතන්ත්‍රවාදී අයිතියක් තියෙනවා. ඒ නිසා කරන ක්‍රියාව වැරදියි. ලක්ෂ 70 මුදල යහපාලනයෙන් ලැබුනා කියල කිව්වා. එම මුදල් නඩු වලින්, ඉඩම්වලින් ලැබෙන මුදල් අනිවාර්යෙන්ම ප්‍රාදේශීය සභාවට ලැබිය යුතුයි. ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීතුමා නිස්සරණාධ්‍යාශයෙන් වැඩ කරනවා කිව්වා. එහෙම නම් එම දීමනා රුපියල් 15000 මෙතන ඉතිරි විය යුතුයි. පක්ෂ අරමුදලට යවනවා. ඉන්පසු ඔවුන් පඩියක් ගන්නවා. උසාවි ප්‍රතිඵලය කොහොම වුනත්, අපි බලාපොරොත්තු වෙනවා. ජනමත විචාරණයකින් හරි මහමැතිවරණයක් ලබාගෙන, අතිවිශිෂ්ට ජයග්‍රහණයක් පොදුජන පෙරමුණෙන් ලබනවා කියන එකත් සඳහන් කරමින්, ගරු සභාපතිතුමාට ස්තූතිවන්ත වෙමින්, සුබ අනාගතයක් ප්‍රාර්ථනා කරමි.

**ගරු මන්ත්‍රී විජිත් සහබන්දු මහතා**

ගරු සභාපතිතුමනි, අපි බොහොම සතුටු වෙනවා අයවැය ජයග්‍රහණය පිළිබඳව. ඒ වගේම ගරු සභාපතිතුමනි, අපේ මන්ත්‍රීතුමන්ලා නොයෙක් විවේචනය කළත් අපට තියෙන සම්පත් අනුව අපට රජයක් තිබුණේ නැහැ. පහුගිය කාලවල එහෙම වෙලා තියෙනවා. කවුරු විවේචනය කළත්, ඔබ ජයග්‍රාහී ගමනක් ආවේ. අපි සභාව හොඳින් පවත්වාගෙන ගියා. ඔබතුමා සහ අපි මන්ත්‍රී මණ්ඩලය ජනතාවට උපරිමයෙන්ම කටයුතු කිරීමට කටයුතු කළා. ආපදා තත්වයන්වලදී, හැම අවස්ථාවකදීම නොයෙකුත් බාධක කම්කටොලු මැද අපේ සභාවෙන් විශාල සේවයක් වුනා. ගරු සභාපතිතුමනි, අපි දැන් මේ සභාවේ මන්ත්‍රී තුමා උත්තර දෙන්න ඕන අය හිටියත්, අර පාළු ගෙයි වලන් බිඳින්න වගේ කියන්න අවශ්‍ය නැහැ. ඒ අය කතා කරල ගියා. ඔබතුමාට තමයි කියන්න වෙන්නේ. අපේ විපක්ෂ නායකතුමා ඔබතුමාගේ නෑකමක් තියාගන්න ඕන හින්දා ඔබතුමා වැඩිය හිත නරක් කරගන්න එපා. ඒක නිසා මම ඔබතුමාට උත්තර දෙන්නෙ නැහැ. කොහොම උනත් මම නෑයෙක් වශයෙන් සතුටු වෙනවා. ඔබතුමා හොඳට මිනිස්සුන්ට අපහාස නොකර කතා කරන එක ගැන. මම ආඩම්බර වෙනවා. ගරු සභාපතිතුමනි, මන්ත්‍රීතුමාලා කතා කළ කතාවත් එක්ක බලන කොට ඒවාට උත්තර දෙන්න අවශ්‍ය නැහැ. මම හිතන්නේ අපේ මන්ත්‍රීතුමාලා දීර්ඝ වශයෙන් කතා කරපු වෙලාවක ගරු සභාපතිතුමනි, මේ රට මේ වෙලාවේ බොහොම අවිනිශ්චිත ආකාරයෙන් දේශපාලන ව්‍යාකූලත්වයක් ඇති වෙච්ච වෙලාවක, ජනතාවගේ අයිතිය නැති කරලා, මේ රජය ගෙනගිය පසුගිය දේශපාලන වටපිටාව නිවැරදි කිරීම සඳහා මම ගරු සභාපතිතුමනි, මේ සභාවට යෝජනාවක් ඉදිරිපත් කරනවා. ජනතාවට මහමැතිවරණයක් ලබාදෙන්න කියලා. ජනතාවගේ අයිතිය ජනතාවට ලබා දෙන්න කියලා අපි ඉල්ලීම් කරන්නේ. මම දීර්ඝ

වශයෙන් කතා කරන්න අවශ්‍ය නැහැ. ඔබතුමාගේ අයවැය බොහොම හොඳයි. මේ අයවැයට පක්ෂව ඡන්දය දුන්නා. ඔබතුමාට මේ සභාව හොඳට කරගෙන යන්න අවශ්‍ය ශක්තිය ධෛර්ය ලැබේවා කියන එකත් මතක් කරමින්, ඔබතුමා පසුගිය කාලේ කල කටයුතු සාර්ථකයි. කෙසේ නමුත් මරා සිරා කියල කතා කළාට අපට මහින්ද මහත්තයා මහ රජෙක්. අපේ නායකතුමාට ඔය තනතුරු නිලතල නැතත් ජනතාවගේ නායකයෙක්. එතුමා සමඟ අපි ඉන්නවා. එතුමාගේ ගේ නායකත්වය යටතේ අපි අනාගතයේ රටේ පාලනයක් ලබා ගන්නා බවත් මතක් කරමින්, ඇතුළු හොඳ අයවැයක් ගෙනාපු සභාපතිතුමා, ලේකම්තුමිය ඇතුළු කාර්යමණ්ඩලයටත් ස්තූතිවන්ත වෙමින්, ගරු සභාපතිතුමා ඇතුළු සියලුම මන්ත්‍රීවරුන්ට ලබන වසර මීට වඩා හොඳ වර්ෂයක් වේවායි ප්‍රාර්ථනා කරමින්, සියලු දෙනාටම සුබ අනාගතයක් ප්‍රාර්ථනා කරමින්, මගේ වචනය අවසන් කරනවා. ස්තූතියි.

**ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා**

ගරු සභාපතිතුමනි, මම දීර්ඝව කතා කරන්නෙ නැහැ. විනාඩි 5යි ගන්නේ. පොඩි පොඩි උත්තර ටිකක් දෙන්න තියෙනවා. අපේ සහෝදර මන්ත්‍රීතුමා මාත් එක්ක අමනාප වෙ.යි සභාපතිතුමනි, ගරු මන්ත්‍රීවරුනි, අපි අහගෙන හිටියා අය වැය ගැන ඒ ගැන මම වැඩිය කතා කරන්න යන්නේ නැහැ. ඒ වගේම අපේ ධනංජය මන්ත්‍රීතුමාගෙ කතාවට අපි වැඩිය කිපෙන්න යන්නේ නැහැ. තාම ඒ අය අපේ දරුවො වගේ. පොඩ්ඩක් පුහුණු වෙන්නත් ඕන. ඒක නිසා ඒ පිලිබඳව එක වචනයක් පාවිච්චි කරන්නේ නැහැ. මොකද එයාලා හිතට එන දේ කියනවා. ආවේගශීලී වෙනවා. ඒක නිසා අපි ඒකට සමාව දෙනවා. හැබැයි ඔබතුමා කතා කළා නම් අපි උත්තර දෙනවා. කොහොම වුණත් මෙතන කියවුනා පිට මන්ත්‍රීවරුන්ගේ කතාවක්. ඒ නිසා ඒ ගැන ටිකක් කියා දෙන්න වෙනවා. ඉස්සර දහ තුන් දෙනා පත්වුනත් ආසනයක් ජයග්‍රහණය කළ නෙවෙයි පත්වුණේ. ඡන්ද ටික ගන්නවා. ගොඩවල් දෙකකට ගහනවා. වැඩි මනාප ගනිපු කණ්ඩායමට වැඩි ප්‍රමාණයක් දෙනවා. ඊළඟට ගනිපු අයට තව ටිකක් දෙනවා. ඉතින් ඒක නිසා ඒ ක්‍රමයත් එක්ක සංයෝග කරල තමයි මේක කරලා තියෙන්නේ. තමුන්නාන්සේලා ආසන දිනුවා. ජනතා විමුක්ති පෙරමුණට, එක්සත් ජාතික පක්ෂයට දුන්නා. මේ සියලු දෙනාටම කතිරයක් ගහලා තියෙන්නේ. අන්න ඒකයි මම ඒ ටිකට විතරයි උත්තර දෙන්නෙ. නැත්නම් හිතාවි මෙයාල මෙතනට පිනට ඇවිල්ලා කිසිම දේශපාලන සම්බන්ධයක් නැතුව ඇවිල්ලා, මහජන නියෝජිතයෝ නෙවෙයි කියලා. පැහැදිලිව කියනවා අද කාන්තාවෝ හත් දෙනෙක් වාඩි වෙලා ඉන්නේ මෙන්න මේ ක්‍රමය නිසා. නැත්නම් මගේ මතකයේ හැටියට එකම කාන්තාවක්වත් නියෝජනය වුණේ නැහැ. කාන්තා නියෝජනය ගැන අපි සතුටු වෙන්න ඕන. මොකද කාන්තාවන්ගෙන් එන පණිවිඩය මේ සභාවට විතරක් නෙවෙයි. මුළු රටටම යනවා.

ඒ වගේම තමුන්නාන්සේලාට මතක් කරන්න ඕන. උඩුගම පොළ ගැන මටත් ඒ පැමිණිල්ල ආවා. දැන් මේ මොහොත වෙනකොට ලක්ෂ ගණනක් වියදම් වෙලා තියෙනවා. දැන් එක පැත්තක් දිරනවලු. මේ මුදල නිසියාකාරව යෙදෙව්ව නම්, කොන්ක්‍රීට් කණු දාලා කඩකාමරයක් ගැහුවනම් අවුරුදු ගාණකට තියෙනවා. තව මාස දෙකක් යනවිට අන්න එක එක කොනක් කඩා වැටිලා කියලා මට මේ සභාවේ කතා කරන්න වෙයි. කම්කරු මහත්වරු හතර පස් දෙනෙක් එක දිගට වැඩ කළා. එතන 125000 යි. කම්කරු මහත්වරුන්ගෙන් මෙහෙ සිද්ධ වෙන්න ඕන සංවර්ධනය ඒ මාස ගානටම නැති වුණා. ඒ නිසා තමයි අද මෙතන

ඇවිල්ලා කතා කරන්න සිදු වෙන්නේ. අපේ මාර්ග සංවර්ධනය සිදු වෙන්නේ නැහැ. පොල හදන්න කම්කරු මහත්තරු දාන්නෙ නැතුව යම්කිසි වැඩ පිළිවෙලක් අනුව කටයුතු කරන්න. එහෙම නැත්නම් කොන්ක්‍රීට් කණු දාන්න. ඕන මේවායේ දාපු කණු සුමානයක් තෙමුනයින් පස්සේ ඒව පාවිච්චි කරන්න බැහැ. ඒවගේම වෙලද මහත්වරුන්ට ඕන විදියට එම කණු හදා ගන්නවලු. ඒ වගේම මම පුංචි උත්තරයක් දෙනවා දැන් වර්තමාන මේ මොහොතේ කිසිම ආණ්ඩුවක් නැහැ. මේ වැරැද්ද කළේ මහින්ද රාජපක්ෂ මහත්මයත්, සිරිසේන මහත්මයාත් යන දෙපල. අර්බුදයක් තිබුනෙ නැහැ. මේ සිද්ධිය වුන අපි කිසිම කෙනෙක්, මාධ්‍ය තමුන්නාන්සේලා, පක්ෂයක් කිසිම කෙනෙක් දන්නෙ නැහැ. හිටිහැටියේ මහින්ද රාජපක්ෂ මහත්තයා අගමැති හැටියට දිවුරුම් දෙනවා කියලා බ්‍රේකින් නිවුස් එකක් යනවා. මෙතන තියෙන්නෙ සිරිසේන මහත්මයාටත්, රනිල් වික්‍රමසිංහ මහත්තයත් එක්ක වැඩ කරන්න බැරි ප්‍රශ්නය. ඒකට එක හේතුවක් වෙලා තියෙන්නේ මේ දෙන්නගෙ භාෂාව. රනිල් වික්‍රමසිංහ මහත්මයා කැබිනට් එකට යනවා. ඉංග්‍රීසියෙන් කතා කරනවා. සිරිසේන මහත්තයා මේක තේරුම් නොගෙන කොලේට අත්සන් කරනවා. උදේට පුවත්පත බැලුවාම තමයි තමන් අත්සන් කරපු දේ දන්නේ. තවත් අර්බුදයක් තියෙනවා රාජපක්ෂ මහත්තයට නඩු තියෙනවා. මේ නඩු වලින් ගැලවෙන ක්‍රමයක් හොයනවා. එකට සිරිසේන මහත්තයා අත්වැලක් දුන්නා. මේක විග්‍රහ කරන්න ගියොත් එහාට යනවා. මම විග්‍රහ කරන්නේ නැහැ. ප්‍රශ්නයක් නැති වෙලාවක මේ ආණ්ඩුව වෙනස් කළ එකේ මහ මැතිවරණයක් තියන්නේ නැහැ. 19 වෙනි සංශෝධනයට අනුව අවුරුදු හතරහමාරක ගෙන් පස්සෙ තමයි මැතිවරණයක් එන්න ඕන. අවුරුදු හතරහමාරක් ගියෙ නැති නිසා මහ මැතිවරණයක් අවශ්‍ය වෙන්නේ නැහැ. පළමුවෙන්ම ජනාධිපතිවරණය, ඒකට සූදානම් වෙන්න ඕන. මේ අර්බුදය නිසා සිරිසේන මහත්මයා මහින්ද මහත්තයත් එක්ක එකතු වෙලා මේ ගිවිසුම ගහගෙන තියනවා. අද රටේ ආණ්ඩුවක් නැහැ. පරිපාලනයක් නැහැ. සිරිසේන මහත්තයා ඒකාධිපති තත්ත්වයට පත්වෙලා තියෙනවා. ළමයින් ජනවාරි මාසෙ ඉස්කෝලේ යනකොට අලුත් ඇඳුම් කට්ටලයක්, අලුත් පොත් අරගෙන ආවා. දැන් මේ නාඩගම නිසා ඒ අහිංසක දරුවන්ට පොත් පත් ටිකත් නැති වෙලා තියෙනවා. මේ පණිවිඩය රටට දෙන්න ඕන. ඒ නිසා විසි හත්දෙනාම දෙමව්පියො හැටියට අමාරුවේ වැටිලා ඉන්නේ. සියලු රටවැසියෝ අමාරුව වැටිලා ඉන්නේ.

ඒ වගේම තමයි ව්‍යවස්ථාව අද උල්ලංඝනය කරලා. රටේ ව්‍යවස්ථාවක් නැත්නම් සභාවලත් අද ව්‍යවස්තාවක් නැහැ. ගරු සභාපතිතුමනි, මේක මේ අයට තේරුම් කර දෙන්න. මැතිවරණයක් අවශ්‍ය නැහැ. 19 වැනි සංශෝධනයට අනුව ඊට කලින් විසුරුවා හරින්න බැහැ. ගමේ මරණාධාර සමිතියේ සභාපති කම දෙන්නෙ බහුතරයට. සුළුතර ආණ්ඩුවක් නිසා පාර්ලිමේන්තුව වර්ජනය කරලා, රටේ ව්‍යවස්ථා උල්ලංඝනය කරලා. රටේ ආර්ථිකය කඩාවැටිලා. හෙට අනිද්ද වෙන කොට දළු ටික වෙළඳපොලට යන්නෙ නැතිවෙනකොට තමුන්නාන්සේලට ඕක තේරෙයි. ඕක තමයි වර්තමාන තත්වය. තවම අපේ බඩට දැනුණේ නැහැ. තව මාසයක් දෙකක් යනකොට රාජ්‍ය සේවකයාට පඩිය ලැබෙන්නේ නැහැ. වෙළෙඳපොළට තේ කොළ ටික යන්නේ නැහැ. ඇඟලුම් කර්මාන්තය කඩාගෙන වැටෙනවා. ඒ නම් ඒකට වගකියන්න ඕන සිරිසේන මහත්තයා, මහින්ද රාජපක්ෂ මහත්තයා නේද? මේ මොන ප්‍රශ්න ආවත් තමුන්නාන්සේලා අපි ගමේ එකට ජීවත් වෙන්න ඕන. සහෝදරත්වය තියෙන්න ඕන. ඒ නිසා අපි ගමේ කම රකිමු කියලා මම යෝජනාවක් ගේනවා. අපේ සහෝදරත්වය රකිමු. ඒ විදිහට වැඩ කරන්න කියන එක තමයි මම ඉල්ලා

සිටින්නෙ. ඒ ශක්තිය අපේ සමගිය තමුන්නාන්සේලා අපි ගම තුළ රැකගමු කියන පණිවිඩය දෙන ගමන්, තවත් දින ගණනකින් ලබන්නාවූ නව වර්ෂය සිත් පිත් ඇති සියලු දෙනාටම දැහැමි සමාජයකට යන්න හේතු වාසනා වේවා කියලා ප්‍රාර්ථනා කරමින්, 2019 වර්ෂය සියලු දෙනාට සුබ නව වසරක් වේවා යි කියමින් මම නිහඬ වෙනවා.

**ගරු මන්ත්‍රිනී ගයන්ති කුමාරි මහත්මිය**

ගරු සභාපතිතුමනි, මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියන්ලා, ලේකම්තුමිය, මාධ්‍යවේදී මහත්වරු ඇතුළු සියලු දෙනාගෙන් අවසරයි. අපි මාස 9ක් තිස්සේ මෙතැනට ආවා. යෝජනා හතක්, අටක් ඉදිරිපත් කළා. එකම යෝජනාවක් ක්‍රියාත්මක වෙන්න අවස්ථාවේ ලැබුණේ නැහැ. ඒ ගැන කණගාටු වෙනවා. වෙරංග මන්ත්‍රීතුමා මෙතන නැතත් අදහස් ප්‍රකාශ කිරීමේදී කිව්වා. ඇප්තොප්වත්ත මේ වෙනකොට සාර්ථක ව්‍යාපෘතියක් කියලා. නමුත් මම නම් ඒක පිළිගන්නේ නැහැ. සාර්ථක නම් ඒකෙන් ලාභයක් අපට එන්න ඕන. එක කාමරයක් හදල පොහොර ටික ගබඩා කරන්න තැනැක් හැදුවොත් වියදමක් විතරයි. ඒ වගේම එතන ගොඩගැහෙන පොලිතින් ප්‍රශ්නයට විසඳුමක් තියෙන්න ඕන. එතන අවට ජීවත් වෙන මිනිස්සුන්ට හමන දුගදට විසඳුමක් තියෙන්න ඕන. අවට ගෙවල්වල ඉන්න මැස්සන්ට විසඳුමක් තියෙන්න ඕන. මම දිගින් දිගටම කතා කළත් කිසිම විසඳුමක් තාම ලැබුනෙ නැහැ. මම බලාපොරොත්තු වෙනවා ඉතා ඉක්මනින් ඒවාට විසඳුමක් ලැබෙයි කියලා. ඊලඟට අපි මෙතනට ජාතික ලැයිස්තුවෙන් හෝ මොනම ක්‍රමයකින් ආවත්, අපට මෙතනින් මොනව නොලැබුනත්, අපට ලැබෙන දීමනාවෙන් හරි මහන්සි වෙලා උපයගන්න මුදලින් හරි, අපිටත් පුලුවන් දෙයක් අපි ගම් වල කරනවා. අපි ශ්‍රමදාන කරලා තියෙනවා. ඉදිරියටත් ගම්වැසියන් වෙනුවෙන් යමක් කරනවා. ඒ නිසා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටින්නෙ. අපේ ගම්වල නැතත් අපේ මූලස්ථානය නාගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ඉදිරිපිට බස් හෝල්ට් එකක් තියෙනවා. පැය භාගයක් වැස්සොත් එතැන වතුර පිරෙනවා. ඒ වගේම එතන වාඩිවෙන්න නිකන් ලැල්ලක් දාලා තියෙන්නේ. මම බලාපොරොත්තු වෙනවා සභාපතිතුමාගෙන් ඒකට මොකක් හරි විසඳුමක් ලබා දෙයි කියලා. මුළු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ම ඉන්න මිනිස්සු එතැනට එනවා. ඒක දකිනවා. ඒක අපටත් ලැජ්ජයි. බස් හෝල්ට් එකේ දෙතුන් දෙනෙකුට වඩා වාඩි වෙන්න බැහැ. ඒ පිළිබඳ ඔබතුමාගේ අවධානය යොමු කරමින්, දීර්ඝ ඉතිහාසයක් තියෙන සදාචාරාත්මක ශ්‍රී ලංකාව තුල සදාචාරාත්මක බව වැඩි දියුණු වේවා. ලබන්නාවූ අවුරුද්ද සුහම සුභ නව වසරක් වේවායි කියා ප්‍රාර්ථනා කරමින්, මම නිහඬ වෙනවා.

**ගරු මන්ත්‍රී එන්. ඩබ්. පතිනායක මහතා**

ගරු සභාපතිතුමාගෙන් අවසරයි. පළමුවෙන්ම මහ මැතිවරණයක් ඉල්ලා අපේ විජිත් සහබන්දු මන්ත්‍රීතුමා ගෙනා යෝජනාව ස්ථිර කරනවා. ගරු සභාපතිතුමනි, අපට ඌරල

නැහිනිගල මාර්ගයට රු.25000 මුදලක් තවම තියනවා. අපට මුල් සභාවාරෙදිම මෙතුමා අපට ලබා දුන්නා. ඒ ගැන ස්තූතිවන්ත වෙන ගමන්ම, ඒ මුදලත්, කර්මාන්ත අරමුදලෙන් පොඩි මුදලක් දාලා අපට දැනට තියන වලවල් ටික හරි කොන්ක්‍රීට් හරි අතුරා දීමට ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියලා මම සභාපතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා. ඇත්තටම ඒ පාරෙ වාහනයකටවත් යන්න බැහැ. ඒ පිළිබඳව ඔබතුමා හොඳාකාරවම දන්නවා. ඒ වගේම

පාරට විශාල වතුර පාරකුත් එනවා. කානුව කෙසේවෙතත්, අපට ඒ ටික කොන්ක්‍රීට් යොදා ප්‍රතිසංස්කරණය කර ගන්න පුලුවන් වුනොත්, ගමේ ඉන්න තරුණ පිරිස හරි එකතු කරගෙන කාණු දෙපස සුද්ද කර ගැනීමේ හැකියාව තියෙනවා. ඒ ගැන ඔබතුමා ඉතා ඉක්මනින් කරන්න පුළුවන් දෙයක් කරල දෙන්න කියල මම ඉල්ලීමක් කරනවා. ඒ වගේම ඔබතුමා මේ මංගල අයවැය මේ අවස්ථාවේදී අපි ජයග්‍රහණය කිරීම පිළිබඳව ස්තුතිවන්ත වෙමින්, ලබන්නා වූ 2019 වර්ෂය අප සියලුදෙනාට සුහම සුභ නව වසරක් වේවායි ප්‍රාර්ථනා කරමින්, සියලුදෙනාට ස්තූතිවන්ත වෙනවා.

**සභාපතිතුමාගේ මූලාසන කතාව**

2019 අයවැය සම්මත කිරීම සඳහා පක්ෂව හා විපක්ෂව ඡන්දය ප්‍රකාශ කළ සියලු දෙනාට මම ස්තුතිවන්ත වෙනවා. විපක්ෂව ඡන්දය ප්‍රකාශ කිරීමත් මට ශක්තියක්. මොකද මගේ ක්‍රමවේදය වෙනස් කර ගැනීමට හැකියාව තියෙනවා. 2002 වර්ෂයේ නිශාන්ත මුතුහෙට්ටිගම මහත්තයගෙ ආරාධනයෙන් මම ඡන්දෙ ඉල්ලුවා. එදා ඉදලා හිනිදුම ආසනේ පලවෙනියා හැටියට පත් වුණා. එදා ඉදල පසුගිය සභාවාරය වන තෙක් මගේ දීමනාව ගත්තෙ නැහැ. මම ශිෂ්‍යත්ව ප්‍රදානය  කරලා ඒ ශිෂ්‍යත්ව ලාභීන් අද වෛද්‍යවරුන් හැටියටත් ඉන්නවා. අලුත් ඡන්ද ක්‍රමය යටතේ මම සභාපති වෙලා පළමු අයවැය ඉදිරිපත් කළා. ඒ අනුව මන්ත්‍රීවරු 27 දෙනාගෙන් 15 දෙනෙක් පක්ෂවත්, අනෙක් මන්ත්‍රීවරුන් 10 දෙනෙකු විපක්ෂවත් ඡන්දය ප්‍රකාශ කළා. ඒ අයත් සම්ප්‍රදායට පටහැනි නොවී, හදවතට එකඟ නැතත්, විපක්ෂව ඡන්දය ප්‍රකාශ කළා කියලා මට හැඟෙන්නේ. බන්දුල මන්ත්‍රීතුමා ඡන්ද ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටියා. මමත් ඒ කාලෙ අයවැයට විපක්ෂව  ඡන්දය ප්‍රකාශ කළ කෙනෙක්. ඒක හරි. හැමදේටම හරි කියන මතයක් ඕන නැහැ. අපි මේ අයවැයට පෙර කෙටුම්පත් ඉදිරිපත් කළා. සියලුදෙනාගේම යෝජනා ඒ සඳහා ඉදිරිපත් වුණා. ඒ සියල්ලම ඇතුලත් කලේ නැහැ. ඒ හිටපු සභාපතිවරු මෙතන ඉන්නවා. ඒ අය දන්නවා මීට පෙර අයවැය යෝජනා කොතරම් දුරට ක්‍රියාත්මක වුණාද කියලා. අනිත් සභාපතිවරුන් වඩා වෙනස් විදියකට මම සියලු දෙනාට එක හැන්දෙන් බෙදන්න තමයි බලාපොරොත්තුව. විශේෂයෙන් මේ පහළොස්දෙනාට විතරක් නෙවෙයි සියලු දෙනාටම දෙන්න බලාපොරොත්තු වෙනවා. විදුලිය සැපයීමේ දී සමහර වෙලාවට හරිම අපහසුතාවයට පත් වෙනවා. හදිසි අවශ්‍යතාවයක් වෙලා පසුගිය සෙනසුරාදා ලයිට් එකක් හදන්න අපේ විදුලි කාර්මික යොදවන්න බැලුවම ඔහු ඉස්පිරිතාලේ නැවතිලා. මම අවන්තට කියලා පොලිසියෙන් යතුර අරගෙන කාර්යාලය ඇරලා, විදුලි බඩු අරගෙන පුද්ගලිකව කෙනෙක් යොදවලා අලුත්වැඩියා කළා. රුපියල් ලක්ෂ 70 ලැබුණෙ නැත්නම් බල්බ් එකක් දාගන්න බැහැ. ආදායම වැඩි කරගන්න ක්‍රමවේද යොදාගත යුතුයි. අපි කිසි වංචාවක්, දූෂණයක් නැතිව වැඩ කරනවා. නමුත් නිලධාරීන්ගේ අඩුපාඩු නිසා අපි අපහසුතාවයට පත් වෙනවා. නිලධාරීන්ගේ වැඩ කටයුතු ගැන වැඩි අවධානයක් යොමු කරන්න කියලා ලේකම්තුමියගෙන් ඉල්ලා සිටිනවා. මේ දිනවල ඉතාමත් වැඩ අධිකයි. අපට සිටින්නේ තාක්ෂණ නිලධාරීන් දෙදෙනෙක් පමණයි. බල්ලෙක් මැරුණත්, හරකෙක් මැරුණත් මිනිස්සු සභාවට කියනවා. පන්සල් වල වැඩත් කරන්න ඕන. කම්කරුවන් ප්‍රමාණය අනුව පාරවල් වල වැඩකරන එක ගොඩක් අමාරුයි. ඒ සම්බන්ධව පැමිණිලි ගොඩක් තියෙනවා.

ඒ වගේම මහින්ද රාජපක්ෂ මැතිතුමා අගමැති වීම ගැන මම සතුටු වෙනවා. අනාගතය ගැන දැක්මක් තියෙන,රටට ආදරය කරන නායකයෙක් නිසා එතුමා අපට අනුග්‍රහය දක්වන බවත් දන්නවා. මාපලගම ආයුර්වේදයේ වැසිකිළි පද්ධතිය අළුත්වැඩියා කරගෙන යනවා. ඒවගේම බල ප්‍රදේශයට ඇතුල්වන තැන්වල අලුතින් නාමපුවරු යෙදීමට කටයුතු කරනවා. පළාත් සභා මන්ත්‍රීතුමන්ලාගේ ප්‍රතිපාදන සභාවට ලබාගන්න මන්ත්‍රීතුමන්ලා උනන්දුවන්න. ගයන්ත කරුණාතිලක මැතිතුමා අපට ඉඩම් පවරා ගැනීමේ කටයුතුවල දී උදව් කරලා තියෙනවා. එය ඉතාමත් ගෞරවයෙන් සිහිපත් කරනවා.

ඒ වගේම විශේෂයෙන් මතක් කරන්න ඕන 2019 ජනවාරි දෙවැනි දා නාගොඩ ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී උදේ දානය ලබා දීමට කටයුතු කරනවා. ඒ කටයුත්තේදී ඔබතුමාලගේ දායකත්වය ලබාදෙන ලෙසත්, ඒ සඳහා සහභාගී වන ලෙස ආරාධනා කරනවා. ඒ වගේම ජනවාරි විසි වෙනිදා ළමා නිවාසයට දානයක් දෙන්න බලාපොරොත්තු වෙනවාජ එයටද සියලු දෙනා සහභාගි වෙලා, දායකත්වය ලබාදෙන්න. 2019 වර්ෂය සුභ අනාගතයක් සුබ වර්ෂයක් වේවායි ප්‍රාර්ථනා කරමින්, මම නිහඬ වෙනවා. සැමට ජය වේවා. සුබ අනාගතයක්. ස්තුතියි.

සභාපති,
නාගොඩ ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේදී

දිනය :-